தோழமைத் துடிப்பு

# සහෘද ස්පන්දන

සාමූහික හෘද සාක්ෂියක් කරා...

කාණ්ඩය - 01
කලාපය - 05

2022 සැප්තැම්බර් - දෙසැම්බර්



# PTA රාජ්‍ය මර්දනයේ නොලියවුණු වංශකතාව

தோழமைத் துடிப்பு

# සහෘදස්පන්දන

සාමූහික හෘද සාක්ෂියක් කරා

2022 සැප්තැම්බර් - දෙසැම්බර්

කාණ්ඩය-01 | කලාපය-05

**අනූව** දශකයේ මැද උපන් අපේ නව යොවුන් වියේදී උපන්දා සිට අසා ඇති මුත් අගක් මුලක් නොදැන සිට 'යුද්ධය' නිමා විය. ඉක්බිත අපේ තරුණ විය පිරී ගියේ ඒ ගැන වූ උද්දාම් නිර්වචන සැමරුම් හා ප්‍රදර්ශනාත්මක සහෝදරකම්වලිනි. ඒත් උදේ හවස අපේ ඇඟේ හැපුණේ ඒවාට ප්‍රතිපක්ෂව, ඓතිහාසික මිනිස් වේදනාවන් සමූහයකි. ඒ වේදනාවන් නොදැක්කා සේ ඉවතට ගමන් කරන්නට අපේ හෘද සාක්ෂි අපට ඉඩ දුන්නේ නැත.

තනි තනිව යත්න දරමින් සිටි අපි සහෘදස්පන්දන නමින් සමූහයක් ගොඩනැඟුවේ සාමූහිකව වැඩ කිරීමටත්, තවමත් හෘද සාක්ෂිය ඉතිරිව ඇති අතලොස්සක් දෙනා අතර හරවත් සංවාදයක් ඇති කිරීමටත් ය. සිංහල සහ දෙමළ භාෂා ඇසුරු කරන ප්‍රජා කණ්ඩායම් අතර සාහිත්‍ය, සංස්කෘතික, සමාජීය හා දේශපාලනික අදහස් හුවමාරු කරගැනීමට මැදිහත් වෙමින් ඒ සඳහා වේදිකාවක් වීම අපේ අරමුණ යි. මන්ද ඒ සම්බන්ධයෙන් ලංකා සමාජයේ ඇති විසල් හිස්තැන විසින් අපව කෙළවරක් නැති දුර්මතයන්ට සහ අවිශ්වාසයන්ට තල්ලු කර ඇති බැවිනි. අපි උත්සහ දරමින් සිටින්නේ ඇස පිනවන සංහිඳියා සැරසිලි දැවටූ සාමයේ පාලම් හදනු වෙනුවට, වඩා සවිඥානික ප්‍රවේශයකින් අපේ රට සමාජය ඉතිහාසය කියවා ගැනීමට යි.

ඒ කියවා ගැනීම, මීට දශක ගණනකට පෙර කළ යුතුව තිබුණා සේම, සමහර විට අන් කවරදාකටත් වඩා, මේ මොහොතේ වැදගත් වන බව අපි විශ්වාස කරමු. උතුර නැගෙනහිරට ට්‍රිප් යෑමෙන් ද, ඒ ගැන රස වෑහෙන සටහන් ලිවීමෙන් ද, පොට්ටු තියා කෝවිල් යෑමෙන් ද, දෙමළ ජනයා සමග සිනා සී ඡායාරූප ගැනීමෙන් ද නොනැවතී බේදවාචකයන් රෝමාන්තිකරණය කරන සාහිත්‍යයේ යෙදීමෙන් ද හොඳින් පෙනෙන්නේ එසේ කියවා ගැනීමක ඇති නොනිම් අවශ්‍යතාවය යි.

කිහිප දෙනෙක් හැර සමස්ථ පෙර පරම්පරාවන් විසින් භාෂාව නොදැන සිටීමටත් වඩා දේශපාලන අවස්ථාවාදයත් සමාජීය වුවමනාවක් නොමැතිකමත් හේතුවෙන් අත් හැර දමන ලද සුවිසල් සාමූහික වගකීමක් අප හමුවේ තිබේ. ඒ වගකීම අත්හැර දැමීම විසින් මිනී කඳු ගැසීම මතු නොව, ඒ ඉතිහාසය ඇසුරෙන් උපයා ගත යුතුව තිබූ දේශපාලන ප්‍රඥාවත් සාමූහික හෘද සාක්ෂියත් අහිමි කිරීම කරන ලදී. අපිට අද ලංකාවේ සාහිත්‍යයත් සහෝදරත්වයත් ගැන ලියන්නට සිදුව ඇත්තේ එතැන සිට ය.

සහෘදස්පන්දන, අප විසින් අහිමි කරගත් ඒ දේශපාලන ප්‍රඥාව සහ සාමූහික හෘද සාක්ෂිය සොයා යන ගමන යි.

4dearcomrades@gmail.com

සංස්කාරක මණ්ඩලය

සංජුලා පීටර්ස්
රියෝ (රවිඳු මධුෂාන්)
ජෙගන් ගනේෂන්
කෝසල මධුරවීර

පිටු නිර්මාණය
කනගසූරියර් ප්‍රදීප්

sahurdaspandana.blogspot.com
සහෘදස්පන්දන - தோழமைத் துடிப்பு
@sahurdaspandana
sagodaran_sahodaraya




தோழமைத் துடிப்பு
සහෘද්‍ස්පන්දන
2022 සැප්තැම්බර් - දෙසැම්බර්
කාණ්ඩය-01 | කලාපය-05

# අන්තර්ගතය

01 PTA: රාජ්‍ය මර්දනයේ නොලියවුණු වංශකතාව - කවරයේ කතාව

06 ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙන් ජීවිතාන්තය දක්වා සිරගත කළ පන්හිඳ - සතීෂ්

09 "ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙන් තරුණයන්ගේ දේශපාලන සිතුවිලි සහ ක්‍රියාකාරීත්වය ඝාතනය කරනවා"
- සත්‍යවේල් පියතුමා

15 සහෘදය - කවි පිටුව

17 කුරිංජි 4

22 ආරූරන්: සම්මාන දිස්නයෙන් වැසී ගිය යුක්තිය

24 "ත්‍රස්තවාදය කියලා කියන්නේ අදහස් ප්‍රකාශ කිරීමට ද?"
- අහ්නාෆ් ජසීම්

29 පින්තූර කතා

31 ලිංගනාදන්ගේ සිට දර්ශන් දක්වා: අපි කැමති දෙමළ ප්‍රතිරූපයක මරණය

35 පිරිමියෙක් නොවන්නා - කෙටි කතාව

27 තිලීපන් : මරණය තෝරාගත් මිනිසෙක් පිළිබඳ සටහනක්

## කවරයේ කතාව



බූස්ස සිර කඳවුරේ ආරක්ෂක වැට අසළ රැඳීගත් අත්අඩංගුවේ පසුවන දෙමළ සහ මුස්ලිම් දේශපාලන සිරකරුවන් - 1986, බූස්ස
(ඡායාරූපයඃ සැන්ද්‍රෝ ටුච්චි) ඡායාරූපය උපුටා ගැනීම - Guardian

# PTA
# රාජ්‍ය මර්දනයේ නොලියවුණු වංශකතාව

- සංජුලා පීටර්ස් -

අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ, අන්තර් විශ්ව විද්‍යාල භික්ෂු බලමණ්ඩලයේ කැඳවුම්කරු ගල්වැව සිරිධම්ම හිමි සහ කැළණිය විශ්ව විද්‍යාලයේ හෂාන් ජීවන්ත අගෝස්තු 18 වන දා අත් අඩංගුවට ගනු ලැබ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ගනු ලැබුණි. මේ අතරින් හෂාන් ජීවන්ත ඔක්තෝබර් 7 වැනිදා නිදොස් කොට නිදහස් කරන ලද අතර දින 89ක් රඳවා සිටි අනෙක් දෙදෙනා මහේස්ත්‍රාත් අධිකරණය හමුවට පැමිණවීමෙන් පසු රක්ෂිත බන්ධනාගාර ගතකරන ලදී. මේ අතර භික්ෂු ක්‍රියාකාරී සිරිධම්ම හිමි නොවැම්බර් 23 වනදා ඇප මත මුදා හරින ලදී.

මෙම ශිෂ්‍ය ක්‍රියාකාරීන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ගැනීමත් සමඟ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කළ යුතු බවට විරෝධතා දකුණේ සමාජය තුළ මතුව තිබේ. එහෙත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්මත වූ 1979 වසරේ සිට 2022 වසර දක්වා වන දශක හතර, එහි ගොදුරු බවට පත් වූ සිය දහසක් මිනිසුන්ගේ ඛේදනීය කතාන්දර, පැතිරුණු විරෝධතාවක් නොමැතිවම වැළලී ගිය බව බොහෝදෙනා නොදනිති. දශක දෙකකට පෙර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම සිය මූලික සටන් පාඨයක් කරගත් දේශපාලන බලවේගයන්ට, දශක දෙකකට පසු, වසර 43ක් පුරා බලාත්මකව පවතින මර්දනකාරී නීතියක් නව නීතියක් ලෙසට සම්මුඛව ඇත. මේ සටහන ඒ ඉතිහාස ඛණ්ඩනයත්, ඉන් ඔබ්බෙහි ඇති දේශපාලනයත් ගැන ය.

## ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත

1979 වසරේ දී ජේ.ආර්. ජයවර්ධන ආණ්ඩුව විසින් තාවකාලික විධි විධානයක් ලෙස ගෙන ආ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත 1982 දී ස්ථිර නීතියක් බවට පත් කරන ලදී. මෙම කෲර පනත විසින් අත්තනෝමතිකව අත් අඩංගුවට ගැනීමටත් දීර්ඝ කාලයක් චෝදනා රහිතව රඳවා ගැනීමටත් ඉඩ සළසා ඇත. එසේම සාමාන්‍ය නීතියට පටහැණිව, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවේ පසුවන්නකුගේ පාපොච්චාරණය ඔහුට එරෙහි සාක්ෂියක් ලෙස යොදා ගැනීමට ප්‍රතිපාදන සළසා තිබේ. මේ හේතුවෙන් අත් අඩංගුවේ පසුවන්නන් දිගු කලක් රඳවා ගෙන වධ හිංසාවට ලක් කිරීමට පාත්‍ර වෙති. එසේ වධ හිංසාවට ලක් කිරීම හරහා ලබා ගන්නා පාපොච්චාරණ අදාළ සැකකරුට එරෙහිව අධිකරණයක දී සාක්ෂි වශයෙන් භාවිතා කරනු ලබයි. පනත යටතේ ඇප ලබා දීමේ කාර්ය පටිපාටියේ පවතින සංදිග්ධතාවය ද පනතේ අතිතික සහ අමානුෂිකබවට ආවරණ සපයයි.

70 අගභාගයේ සහ 80 දශකය ආරම්භයේ දී පනත ගෙන එන්නේම දෙමළ ජනයා මර්දනය කරනු වස් ය. ඉන්පසු දෙමළ ජනයාට අමතරව සිංහල තරුණ කැරැල්ල මර්දනය කිරීමටත්, 2019 පාස්කු ප්‍රහාරයෙන් පසුව මුස්ලිම් ජනයා මර්දනය කිරීමටත් එම පනතම යොදා ගන්නා ලදී. දැන් දෙමළ-මුස්ලිම් ජනයාට අමතරව විසම්මුතික සිංහල ජනයා මැඬලීමට යොදා ගනු ලැබ ඇත්තේ ද වසර 43ක් තිස්සේ බලාත්මකව පවතින මෙකී පනත යි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත රාජ්‍යයට අභියෝග කරන මානව හිමිකම් ක්‍රියාධරයන්, ලේඛකයන්, මාධ්‍යවේදීන් මර්දනය කිරීම සඳහා ඓතිහාසිකව යොදා ගනිමින් තිබෙන බවට මෑත කාලීන උදාහරණ පවා දුලබ නැත. 2020 අප්‍රේල් මාසයේදී අත් අඩංගුවට ගත් නීතිඥ හිජාස් හිස්බුල්ලාගේ සිදුවීමත්, එම වසරේම මැයි මාසයේ දී අත් අඩංගුවට ගත් කිවියර අහ්නාෆ් ජසීම්ගේ සිදුවීමත් නැවත නැවත ලිවිය යුතු නොවේ.

## මර්දනය උතුරෙන් දකුණට

දෙමළ ජනයා දශක ගණනක් මුළුල්ලේ සාමකාමී සහ ප්‍රජාතාන්ත්‍රික ප්‍රයත්න හරහා ඉදිරිපත් කළ සාධාරණ දේශපාලන ඉල්ලීම් රාජ්‍ය විසින් හැකි වෙර යොදා මර්දනය කරන ලදී. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත බලාත්මක කරන ලද්දේ, රාජ්‍ය මර්දනයේ ප්‍රතිඵලයක් ලෙස බිහි වූ තරුණ දෙමළ සටන්කාමී කණ්ඩායම් ඇතුළු සිංහල අධිපතිවාදී රාජ්‍ය ව්‍යුහයට එරෙහි වූවන් මර්දනය කිරීම සඳහා ය. ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන 1979 ජූලි මාසයේ දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්මත කර එකල හමුදාවේ මාණ්ඩලික ප්‍රධානියා වූ තම ඥාති තිස්ස වීරතුංග වෙත කරන ලද ආඥාවේ දැක්වෙන්නේ "දිවයිනෙන්, විශේෂයෙන්ම යාපනය දිස්ත්‍රික්කයෙන් සියලු ආකාරයේ ත්‍රස්තවාදී උවදුරු නැති කර දැමීම" සඳහා මාස හයක කාලයක් ලබා දෙන බවත්, ඒ සඳහා 'රජයේ සියලු සම්පත් රිසි සේ පරිහරණය කිරීමට' අවසර දෙන බවත් ය.[1] ඉක්බිති එළැඹුණු කාලයේ දහස් ගණනක් දෙමළ තරුණයන් මෙකී පනත යටතේ රාජ්‍ය ආරක්ෂක අංශ විසින් පැහැරගෙන යාමටත් දශක ගණන් රඳවා ගෙන සිටිනු ලැබීමටත් වධහිංසාවට ලක් වීමටත් අතුරුදහන් වීමටත් ලක් වූහ. රාජ්‍ය මර්දනයට එරෙහිව මාධ්‍යකරණයේ නිරත වූ දෙමළ ජනමාධ්‍යවේදීන්ගේ ද ඉරණම වූයේ මෙය යි. එවක සාමාන්‍ය ජනයා විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත 'කොටි පනත' නමින් හඳුන්වන්නට හේතුවූයේ එය දෙමළ සටන්කරුවන් මර්දනයට විශේෂිතව යොදාගත හැකි නීතියක් වශයෙන් මිස, වාර්ගික හෝ ආගමික භේදයකින් තොරව ඕනෑම පීඩිත ජනකොටසක සයුක්තික ඉල්ලීම් මැඩලන්නට එම පනත ඕනෑම වේලාවක යොදාගත හැකි බවට කල්පනා නොකළ නිසා ය.



1989 දෙසැම්බර් 2 / ඝාතනය කර තිහගොඩ ප්‍රදේශයේ මංසන්ධියක දමා ගොස් ඇති ප්‍රශ්න කිරීම සඳහා රැගෙන යන ලද තරුණයන්ගේ සිරුරු.
(ඡායාරූපය ***Robert Nickelsberg / Getty Images***)

දෙමළුන් මඩින හෙයින් දකුණේ ජීවිතයට අදාළ නොවන්නේ යැයි 80 දශකය ආරම්භයේදී කල්පනා කළ මෙකී කොටි පනත විසින් වසර කිහිපයකින් දකුණේ කැරලිකාරී සිංහල තරුණයන් ද ඉලක්ක කරගන්නා ලදී. ඒ අනුව සිංහල දකුණෙන් ද මුල් වරට 'ත්‍රස්තවාදය' සොයා ගනිමින් රජය විසින් 1984 නොවැම්බර් 08 වනදා දෙනියායේ දී ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන් 23 දෙනෙකු පනත යටතේ අත් අඩංගුවට ගන්නා ලදී. ඉක්බිති 1991 දක්වාම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඇතුළු මර්දක නීතිවල ආශිර්වාදයෙන් දකුණේ සිංහල තරුණ තරුණියන් රජයේ ආරක්ෂක අංශ විසින් පැහැරගෙන ගොස් ඝාතනය කරන ලදී. බූස්ස, වීරවිල, පැලවත්ත,පල්ලේකැලේ, පූනානි ආදි ස්ථානවල රට වටා වධ කඳවුරු ඉදි කරන ලදී. ජයවර්ධන රජය දකුණෙන් සොයාගත් 'ත්‍රස්තවාදය' අතුගා දමන ලද්දේ දහස් ගණනක් සිංහල තරුණ-තරුණියන් මහ පාරවල් අද්දර ඝාතනය කිරීමෙන් පණ පිටින් පුළුස්සා දැමීමෙන් සහ අතුරුදහන් කිරීමෙනි.

## මුස්ලිම් ජනයා

2019 පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයෙන් පසුව ඊට වගකිව යුතු සැබෑ වගඋත්තරකරුවන් නීතිය හමුවට පමුණුවනු වෙනුවට, රාජ්‍යයේ පිළිවෙත වූයේ, දෙමළ ජනයාට කරමින් සිටි අන්දමටම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ

1 - රාජන් හූල්, 'ශ්‍රී ලංකාව බලයේ මහන්තත්වය; මිත්‍යා, පරිහානය සහ මනුෂ්‍ය ඝාතන', 2003, පි.59

මුස්ලිම් ජනයා ඉලක්ක කොට වෛරී ව්‍යාපාරයක් ගොඩනංවා සමස්ත මුස්ලිම් ජන සමාජයම මර්දනයට ලක් කිරීම යි. අත් අඩංගුවට ගත් අයගෙන් අතිමහත් බහුතරය බෝම්බ ප්‍රහාරයට කවර හෝ සම්බන්ධයක් නොතිබූ අය බවට මානව හිමිකම් සංවිධාන විසින් පෙන්වා දී ඇති අතර එයින් ඇතැමෙක් සහරාන්ගේ යාබද නිවසේ රූපවාහිනී ඇන්ටෙනාවක් සවි කළ අයෙකි; ඇතැමෙක් සහරාන්ගේ සහෝදරයාට අයත්ව තිබූ යතුරු පැදියක් මිලදී ගත් අයෙකි. තම දියණිය ප්‍රහාරයට සම්බන්ධ බව කියන පුද්ගලයෙකු හා විවාහ වී සිටීමෙ නිසා අත් අඩංගුවට පත් වයෝවෘද්ධ කාන්තාවක් ඇතුළු කාන්තාවන් ද ඒ අතර වේ.[1] පාස්කු ප්‍රහාරයේ විමර්ශන කටයුතු මුවාවෙන් මුස්ලිම් ජාතිකයන් කොපමණ සංඛ්‍යාවක් මෙසේ අත්තනෝමතිකව අත් අඩංගුවට ගෙන චෝදනා රහිතව රඳවා ගෙන සිටින්නේ දැයි නිශ්චිත සංඛ්‍යා ලේඛණ පවා මේ වනවිටත් නැත.

**අත්හැර දැමූ ඉතිහාසය**

1987-1989 සංහාරයෙන් පසු යළි පිටුවහල්ව සිටිමින් දේශපාලනය කිරීම ආරම්භ කළ ජනතා විමුක්ති පෙරමුණෙහි මූලික සටන් පාඨයක් වූයේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කළ යුතුය යන්නයි. 1991 වසරේ සැප්තැම්බර් 01 දා පිටුවහලේ සිටි සෝමවංශ අමරසිංහ විසින් ඉදිරිපත් කරන ලද නිවේදනයක 'ශ්‍රී ලාංකීය ජනතාවට අහිමි කර ඇති ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් යළි ස්ථාපිත කිරීමට' වහාම ගත යුතු ක්‍රියාමාර්ග හතරක් දක්වා තිබූ අතර එහි පළමු ක්‍රියාමාර්ග දෙක වූයේ 'හදිසි නීතිය ඇතුළු සියළු මර්දනකාරී නීති රීති අහෝසි කළ යුතුය' සහ 'සියලුම දේශපාලන සිරකරුවන් කොන්දේසි විරහිතව නිදහස් කළ යුතුය' යන්නයි.[2]

එම වසරේම නොවැම්බර් 30 වෙනිදා සෝමවංශ අමරසිංහ විසින් 'ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමට' ගත යුතු ක්‍රියාමාර්ග 7ක් දක්වා මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලිපියක් යැවීය. එහි 5.1 සහ 5.2 ඉල්ලීම් මෙපරිදිය: 'හදිසි නීතිය, ත්‍රස්තවාද විරෝධී පනත යටතේ ක්‍රියාත්මක කර ඇති මර්දන නීති සහ වෙනත් මර්දන නීති ඉවත් කළ යුතුය.', 'ශ්‍රී ලංකාවේ සෑම පළාතකම කෙරෙන හමුදා, පොලිස් මෙහෙයුම් වහා නතර කළ යුතුය.'[3]

1992 ශ්‍රී ලංකාවට ආධාර දෙන පැරිස් ආධාර කණ්ඩායමේ සමුළුවට 'මානව හිමිකම් සුරැකීමේ ශිෂ්‍ය සංවිධානය' නම් ජනතා විමුක්ති පෙරමුණේ ජාත්‍යන්තර තලයේ කටයුතු සිදුකළ සංවිධානය විසින් සංදේශයක් භාර දෙන ලදී. ආධාර දෙන රටවල් ආධාර දීම සඳහා ශ්‍රී ලංකා රජයට බල කළ යුතු කොන්දේසි දෙකක් එමඟින් ඉදිරිපත් කරන ලදී. එහි පළමුවැන්න වූයේ 'උතුරට එල්ල කරනු ලබන ගුවන් ප්‍රහාර සහ දකුණේ හමුදා මෙහෙයුම් වහාම නතර කරන මෙන්' ශ්‍රී ලංකා රජයට බලපෑම් කිරීමයි. දෙවැන්න වූයේ "ත්‍රස්තවාදය වැළැක්වීමේ සහ හදිසි නීතිය යටතේ රඳවා සිටින සියළු දේශපාලන සිරකරුවන් නිදහස් කරන ලෙස" ශ්‍රී ලංකාවට බල කිරීම යි.[4]

1994 අගෝස්තු මහ මැතිවරණයේදී ජාතිය ගළවාගැනීමේ පෙරමුණ නමින් මැතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදුණු වර්තමාන ජනතා විමුක්ති පෙරමුණ ඉදිරිපත් කළ මැතිවරණ ප්‍රකාශනයෙහි මෙසේ දැක්වුණි: ''ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතත්, අපරාධවලින් බේරීමේ පනතත් එවැනි ප්‍රජාතන්ත්‍ර විරෝධී හා මූලික මිනිස් අයිතීන් අහෝසි කරන අණ පනත් සියල්ලත් අහෝසි කරනු ලැබේ.[5]

1994 අගෝස්තු මහ මැතිවරණයට ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණ යටතේ තරග කළ ජනතා විමුක්ති පෙරමුණේ හම්බන්තොට දිස්ත්‍රික් කණ්ඩායම් නායක නිහාල් ගලප්පත්ති පාර්ලිමේන්තුවට තේරී පත් වූ අතර 1995 අප්‍රේල් මස චන්ද්‍රිකා කුමාරතුංග ආණ්ඩුව යළිත් යුද ක්‍රියාමාර්ගවලට අවතීර්ණ විය. ජනතා විමුක්ති පෙරමුණ විසින් දශකයකට ආසන්න කාලයක් තිස්සේ අහෝසි කිරීමට බලකළ හදිසි නීතියට පක්ෂව එම පක්ෂයේ එකම මන්ත්‍රීවරයා ඡන්දය භාවිතා කිරීම ආරම්භ කරන ලද්දේ ඉන් අනතුරුව ය. මර්දනයේත් පීඩනයේත් ගොදුරු වූ දස දහසකගේ මිනී කඳු උඩ හිඳිමින්ම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඇතුළු මර්දනකාරී නීති අහෝසි කිරීමේ සටන් පාඨය ජවිපෙ දේශපාලනයෙන් කෙමෙන් අතුරුදහන්ව යාම ඇරඹුණේ එපරිද්දෙනි.

ඉන්පසු ජනතා විමුක්ති පෙරමුණෙහි දේශපාලන භූමිකාව වූයේ මර්දනකාරී රාජ්‍ය සැකැස්ම ආරක්ෂා කිරීමට දිවි හිමියෙන් කැප වීමයි. රාජ්‍ය මර්දනයේ කේන්ද්‍රය නැවතත් දෙමළා වූ විට ජනතා විමුක්ති පෙරමුණ මර්දක රාජ්‍ය සමඟ අත්වැල් බැඳ ගත්තේ ය. තමන්ගේ පූර්වප්‍රාප්තික දේශපාලන පරම්පරාව වධහිංසා පමුණුවා, සමූහ මිනීවළවල මිහිදන් කෙරූ අනීතික අමානුෂික නීති අණ පනත් බලාත්මක කිරීමටත්, ඒවා පොදුජන මනස තුළ සාධාරණීකරණය කිරීමටත් පාර්ලිමේන්තුව තුළ මෙන්ම ඉන් පිටතත් ජනතා විමුක්ති පෙරමුණ ඉතා උනන්දුවෙන් ක්‍රියා කළේය. එය කූටප්‍රාප්තියට පත් වූයේ 2009 මැයි මස අවසන් වූ මහා ජන ඝාතක යුද්ධය වටා සිංහල පීඩිත ජනයා ඒකරාශී කිරීමට කැප වූ වඩාත්ම උද්‍යෝගීමත් උද්ඝෝෂකයා වීමේ ප්‍රීතියෙනි.




2003 ඔක්තෝබර් 15 / (ඡායාරූපය TamilNet )
සටන් විරාම ගිවිසුම හකුළා ගන්නා ලෙසට බල කරමින් ජනතා විමුක්ති පෙරමුණ විසින් සංවිධානය කළ විරෝධතාවයක්

**වැළලූ ඉතිහාසයේ ගොදුරු**

දශක දෙකකට එහා වූ මේ ඉතිහාසය, ඒ ඉතිහාසය මැදින් ගමන් කළ බොහෝ අයට ද දැන් වනවිට වෙනත් විශ්වයක් බවට පත්ව තිබේ. එකී දේශපාලන ධාරාවන්ගේ වර්තමාන ක්‍රියාකාරීන් සතුව බණ්ඩනය වූ ඉතිහාසයක් ඇත්තේ එහෙයිනි. තම සමාජයේ දේශපාලන ඉතිහාසය ඊළඟ පරම්පරාවට සම්ප්‍රේෂණය නොකිරීමේ වරදට වන්දි ගෙවීමට

1 - *https://groundviews.org/2022/02/09/the-tragic-lives-of-women-victims-of-the-pta/*
2 - භාෂණ අබේවර්ධන, සමකය - මව්බිම, 2006 දෙසැම්බර් 17
3 - භාෂණ අබේවර්ධන, සමකය - මව්බිම, 2006 දෙසැම්බර් 17
4 - "මානව හිමිකම් කතා කරමුද? අමතක කරමුද?", දියස සඟරාව, 2008 ජනවාරි-පෙබරවාරි කලාපය
5 - භාෂණ අබේවර්ධන, සමකය - මව්බිම, 2006 දෙසැම්බර් 17

සිදුව ඇත්තේ වසන්තලා, ගල්වැව සිරිධම්ම හිමි හා හෂාන්ලා වැනි තරුණ ක්‍රියාකාරිකයන්ට ය. ඔවුහු රාජ්‍ය මර්දනයේ මෙන් ම ඔවුන් ක්‍රියාකාරිව සිටින දේශපාලන ධාරාවේ ද ගොදුරු බවට පත්ව තිබේ.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට එරෙහි දකුණේ මෑත කාලීනව පැන නැගි විරෝධතා දකුණේ දුක් ගැනවිල්ල පමණක් ඉලක්ක කරගත් ඒවා වීම, මෙකී ඉතිහාසය නොදැන සිටීමේ සහ උවමනාවෙන් අමතක කිරීමේ නියත ප්‍රතිඵලයකි. එකී වින්දිත ඉතිහාසය එම ඉතිහාසයේ ගොදුරු බවට පත් වූ දේශපාලන ධාරා විසින් සිය ඉතිහාසයෙන් ගළවා දැමීම විසින් එකී දේශපාලන ධාරාවන්ගේ වර්තමාන ක්‍රියාකාරීන්ට සමස්ථ වින්දිතයා වෙනුවෙන් පෙනී සිටීම සඳහා අවශ්‍ය දේශපාලන දැක්මත්, සාමූහික වගකීමත්, සංවිධානමය ශක්‍යතාවයත් අහිමි කර ඇත. දැන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි ගොදුරු බවට පත්ව ඇති දකුණේ ශිෂ්‍ය ක්‍රියාකාරීහු වනාහි, සිය දේශපාලන ධාරාවේ පීඩිත ඉතිහාසය පිළිබඳ විඥානය ලැබිය යුතුව තිබූ, ලබා නොදීම හේතුවෙන් වින්දිතයන් වීමට සිදු වූ පරම්පරාව වෙති. ඔවුන්ගේ දේශපාලනය තුළින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා සිටින සියළු දේශපාලන සිරකරුවන්ගේ නිදහස පිළිබඳ සටන්පාඨ බලවත්ව මතු නොවීම, සැබැවින්ම, ඔවුන් නියෝජනය කරන දේශපාලන ධාරාවේ නොවැළැක්විය හැකි සීමාවයි.

එම දේශපාලනය පිළිබඳ යට කී විවේචනය තිබියදීත්, ඔවුන් සියල්ලන් රාජ්‍ය මර්දනයේ වින්දිතයන් බව අවිවාදිත ය. එසේම වසන්ත මුදලිගේ ඇතුළු ක්‍රියාකාරීන්, එකී දේශපාලන ධාරාවන්ගේ වර්ගවාදී පීඩක දේශපාලනයේ ගොදුරු බවට පත් වූවන් වීම ද මගහැර යා නොහැකි ඇත්තකි.

## තෝරාබේරා ගෙන මර්දනය විය නොහැක

මව් පෙරමුණ, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය, සිසු ජන සහයෝගිතා ව්‍යාපාරය වැනි එකල දකුණේ සිවිල් සමාජ ව්‍යාපාර සහ විකල්ප මතධාරී පුවත්පත්වල පවා ප්‍රධාන සටන් පාඨයක් වූයේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කළ යුතුය යන්න යි. ඊට හේතුවූයේ එකල දකුණේ සිංහල සමාජයට එරෙහිව සිදු කරන ලද අපරාධවලට පිටුබලය සපයමින්, අපරාධකරුවන් ආරක්ෂා කිරීමට පසුබිම සකස් කර තිබුණේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඇතුළු මර්දක නීති මඟින් වීම නිසා ය. එකල එකී ඉල්ලීම දකුණේ මිනිසුන්ගේ දෛනික ජීවිතයට ඍජු සම්බන්ධයක් තිබූ ඓන්ද්‍රීය ගැටළුවක් විය. එහෙත් මර්දක නීති දෙමළාට හා මුසල්මානුවාට එරෙහිව ක්‍රියාත්මක වන විට වරෙක එහිම වින්දිතයන් වූ සිංහල සමාජය තම වින්දිතභාවය විසින් රැස්කර ගත් අත්දැකීම් සහ ප්‍රඥාව බැහැර කරන ලදී.

රාජ්‍යයේ 'ත්‍රස්තවාදී' අර්ථකථනය යථාවක් කරනු පිණිස දකුණේ සමාජයේ සෑම ස්ථරයක්ම, වෘත්තියක්ම, කොටසක්ම එකා මෙන් ක්‍රියා කළහ. 2008 මාර්තු මාසයේදී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ගෙන සිටි ජ්‍යෙෂ්ඨ ඉංග්‍රීසි මාධ්‍යවේදී ජෙයප්‍රකාශ් තිස්සනායගම් 'කොටියෙකු' බවට ප්‍රබන්ධ නිර්මාණය කර ඒවා ජනගත කිරීමේ මෙහෙයුම රජයේ නිල මාධ්‍ය හැරුණු විට ලක්බිම, දිවයින සහ ජවිපෙ නොනිල ප්‍රකාශනය වූ ලංකා පුවත්පත විසින් ඉතා ඕනෑකමින් කරන ලදී. රාජ්‍ය මර්දන යාන්ත්‍රණයට ඒ පිළිබඳව මහන්සි වීමට අවශ්‍ය වූයේ නැති තරම් ය.



(ඡායාරූපය JDS)
ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගත් වෙට්ට්‍රේවල් ජසීකරන්, වඩිවේල් වලර්මදී සහ ජයප්‍රකාශ් තිස්සනායගම්.

'ත්‍රස්තවාදය' 'ත්‍රස්තවාදියා' අර්ථකථනය කරනු ලබන්නේ රාජ්‍ය විසිනි. ප්‍රචණ්ඩත්වය අභ්‍යාස කිරීමට රාජ්‍යයට ඇති ඒකාධිකාරය අභියෝගයට ලක් කරන සමාජ ව්‍යාපාර නිර්මාණය වන විට රාජ්‍ය විසින් ඒවා 'ත්‍රස්තවාදය' ලෙස අර්ථකථනය කරනු ලබයි. කවි ලිවීම ත්‍රස්තවාදය යැයි රාජ්‍යට අර්ථකථනය කළ හැකි අන්දම අහ්නාෆ්ගේ සිදුවීමේ දී දැකගත හැකි විය. පසුගිය වසරේ මැයි 18 වනදා යුද්ධයෙන් මියගිය තම ඥාතීන් සිහිකරමින් නැගෙනහිර මඩකළපු දිස්ත්‍රික්කයේ කල්කුඩා ප්‍රදේශයේ මුහුදු වෙරළක ඉටි පන්දම් දැල් වූ ස්ත්‍රීන් දෙදෙනකු ඇතුළු දෙමළ ජාතිකයෝ දස දෙනෙක් අත් අඩංගුවට ගත්තේ ද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ය. නැගෙනහිර ප්‍රදේශයේ සිදු කළ හමුදා මෙහෙයුම් හේතුවෙන් අවතැන් වූ ජනයා මුහුණ දී ඇති ගැටළු පිළිබඳ ලිපි දෙකක් ලිවීම ජාතික අසමගිය වර්ධනය කළ ත්‍රස්තවාදී ක්‍රියාවකයි අර්ථකථනය කර 2008 දී ජ්‍යෙෂ්ට මාධ්‍යවේදී ජෙයප්‍රකාශ් තිස්සනායගම් අවුරුද්දකට වැඩි කාලයක් රඳවා තබා, අවසානයේ බරපතල වැඩ ඇතිව වසර විස්සක සිර දඬුවම් නියම කරන ලද්දේ ද යළිත් කොටි පනතක් බවට පෙරළාගත් මෙකී පනත යටතේ ය.

මෙතෙක් රාජ්‍යයට අනුව 'ත්‍රස්තවාදියා' වූයේ දෙමළ හා මුස්ලිම් ජනයා ය. ඒ අර්ථකථනය අපේ ජීවිතයට බාධා කළේ නැත. ඒ ජනයා අපේ ලෝකයට අදාළ නැති කොටසක් වූ හෙයිනි. ඒ ජනයාගේ ඉරණම අපේ ඉරණමට ගැට ගසා ගැනීමට උවමනා වන හේතු අපිට තිබුණේ නැත. එකී අර්ථකථනයට එකඟ නොවී සිටීමට නොහැකි වූ දකුණේ පීඩිත සිංහල ජන කොටස් ආණ්ඩු පාලනයට එරෙහිව ප්‍රජාතාන්ත්‍රිකව සිය විරෝධය පළ කළ විට 'ත්‍රස්තවාදීන්' බවට දැන් පත්ව සිටිති.

**අනෙකාගේ නිදහස ගැන උනන්දු නොවන පුද්ගලයා තමාගේ නිදහස ද වළලා ගනී**

දැන් ආරම්භ වී ඇති දකුණේ විරෝධතාවල මතු කරන පරිදිම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මිනිසුන්ගේ මූලික නිදහස අහුරන අනීතික අමානුෂික පනතකි. එහෙත් මතක් කරගත යුතු ඇත්තක් තිබේ. එනම් එවන් නීතියක් වසර 43ක් පුරා විශාල සමාජ විරෝධයකට ලක් නොවී, සැබවින්ම බහුතර ජාතියේ රහස් නිහඬ අනුමැතිය මත, බලාත්මකව පැවති බව යි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, කොළඹ අපරාධ කොට්ඨාසය, ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාසය වැනි ආයතන 2022 දී පිහිටුවන ලද ආයතන නොවේ. ඒවා තුළ අනීතිකව රඳවා ගනිමින්, කෲර වධහිංසාවන්ට පාත්‍ර කිරීම පිළිබඳ චෝදනා එල්ලවීම ආරම්භ වූයේද 2022 පටන් නොවේ. එහෙත් එවන් මර්දනකාරී ආයතන තිබෙන බව අපට සිහිපත් කර ඇත්තේ වසන්තලා හා සිරිධම්මලා අත් අඩංගුවට ගැනීම විසිනි.

ආරම්භයේ සිට අද දක්වාම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට වැඩියෙන්ම ගොදුරුව තිබෙන්නේ දෙමළ ජනයා වේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්මත කළ සමයේ සිට ම උතුරු නැගෙනහිර දෙමළ ජනයා ඊට සාමූහිකව විරුද්ධ වූ අතර, විශේෂයෙන් උතුරු නැගෙනහිර විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ දැවැන්ත උද්ඝෝෂණ ව්‍යාපාර දියත් කළහ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට එරෙහි දකුණේ මෑත කාලීන විරෝධතා ඇවිල යන විට දේශපාලන සිරකරුවන් නිදහස් කර ගැනීමේ අරගලය අඛණ්ඩව දශක ගණනක් පුරා සිදුවෙමින් පැවතුණි. එහෙත් දැන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කළ යුතු බවට අවධාරණය කරන සමාජ ව්‍යාපාරවලට, එකී පනතට එරෙහිව දීර්ඝ කලක් තිස්සේ දෙමළ ජනයා කරගෙන යන අරගලය හා පෙළට සිට ගැනීමට එදත් අදත් අමතකව ඇත.

දකුණේ දැන් මතුව ඇති ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට එරෙහි විරෝධය තුළින් මතුවන බරපතල දේශපාලනික ගැටළු තිබේ. මේ මොහොත වන විටත් දශක ගණනක් තිස්සේ චෝදනා රහිතව අත් අඩංගුවේ පසුවන දෙමළ දේශපාලන සිරකරුවෝ සිටිති. පාස්කු ඉරිදා පිපිරීම් දඩමීමා කරගනිමින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නිශ්චිත සංඛ්‍යාවක් දැක්විය නොහැකි මුස්ලිම් තරුණ තරුණියන් සිය ගණනක් ද අත් අඩංගුවේ පසුවෙති. එහෙත් දකුණේ විරෝධතා භ්‍රමණය වන්නේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ගොදුරු කරගත් සමස්තයක් දේශපාලන සිරකරුවන් නොව, මෑතකදී අත් අඩංගුවට ගත් දකුණේ ශිෂ්‍ය ක්‍රියාකාරීන්ගේ පුද්ගල නාම වටා ය. දේශපාලන සිරකරුවන්ගේ ගැටළුව දෛනික ජීවිතයේ ගැටළුවක් වූ නැගෙනහිර පළාතේ මඩකලපුවේ දී සිදු කළ විරෝධතාවයකදී පවා දකුණේ ශිෂ්‍ය ක්‍රියාකාරීන් නිදහස් කිරීමේ ඉල්ලීම පමණක් මතු කර තිබීම මීට කදිම නිදසුනකි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට එරෙහි දකුණේ පැන නැඟී ඇති විරෝධතා උත්සුක වන්නේ තමන් ත්‍රස්තවාදීන් නොවන බවට කරුණු පෙළගැස්වීමට යි. පනතට එරෙහිව මතුව ඇති හදිසි විරෝධය ශිෂ්‍ය ක්‍රියාකාරීන් නිදහස් කිරීමෙන් පසු දියව යා හැකි, පුරුදු ඉතිහාසයම අලුත් වටයකින් ඇරඹීමේ හැකියාවක් ඇති බවට ඇඟවුමක් එතුළ නොමැති ද?

වසර ගණන් දශක ගණන් චෝදනා රහිතව සිරගත කර සිටින දෙමළ දේශපාලන සිරකරුවෝ එක්කෝ තමන් නිදහස් කරන ලෙසත් නැත්නම් නඩු විභාග කර දඬුවම් පමුණුවන ලෙසත්



ඡායාරූපය උපුටා ගැනීම ඊළනාඩු පුවත්පත (1983/02/02)
ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටින රාජා ජෙයප්‍රකාශ් ඇතුළු විශ්ව විද්‍යාල ශිෂ්‍ය ක්‍රියාකාරීන්, විශ්ව විද්‍යාල ආචාර්යවරයෙක්, පූජකවරයෙක්, වෛද්‍යවරු ඇතුළු පිරිස නිදහස් කරන ලෙස බලකරමින් යාපනය විශ්ව විද්‍යාලය තුළ විශ්ව විද්‍යාලයීය විද්‍යාර්ථීන් විසින් පවත්වන ලද අඛණ්ඩ සත්‍යග්‍රහය.

ඉල්ලමින් මාරාන්තික උපවාස කරති; ඒවායේ දී මියෙති. දේශපාලන සිරකරුවන්ගේ ඥාතීන් අනේක විධ වෙනස්කොට සැළැකීම්වලට වර්ගවාදී ප්‍රහාරයන්ට ලක්වීමේ සිදුවීම් ඉතා මෑත අතීතයේත් වාර්තා විය. නමුත්, ජීවිතය ඉල්ලා මිනිස්සුන්ට මරණය තෝරා ගැනීමට සිදුවීම ගැන සිතන්නට අප පෙරට එන්නේ කවදාද යන ගැටළුව 2022 වසර අවසාන වනවිටත් පිළිතුරු ලැබී නැති පැනයකි.

1981 දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගනු ලැබ ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියමව සිටිය දී 1983 ජූලියේ දී වැලිකඩ බන්ධනාගාරයේ සංහාරය තුළ දී ඝාතනය වූ කුට්ටිමනීගේ ප්‍රකාශයෙන් බිඳක් මෙහිදී සටහන් කළ යුතු ය. එය කළ යුත්තේ, අපේ මෑතකාලීන ඉතිහාසය දැන සිටීමත් සම්මුති විරහිතව යුක්තිය තෝරා ගැනීමත් වැදගත්කොට සළකන කිසිදු අරගලයක් පරාජය නො කරන බව සිහිපත් කරනු පිණිස ය.

"අනෙකාගේ නිදහස ගැන උනන්දු නොවන පුද්ගලයා තමාගේ නිදහස ද වළලා ගනී. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යනු ද්‍රවිඩ ජනයාට විරුද්ධව පාවිච්චි කරන අශීලාචාර නීතියකි. අපට අත් වූ ඉරණම ශ්‍රී ලංකා ජනතාවටද මතු දිනක අත්වනු ඇත. මෙම නීතිය සමඟ මා සිංහල ජනයා සිහි කරන්නේ අනුකම්පා පෙරදැරිව ය. දෙමළ ඊළම් ජයග්‍රහණය කළ පසුත් ශ්‍රී ලංකා රජයේ මෙම නීතිය ඒ රටේ පවතිනු ඇත. එදාට අලිමංකඩ වධ කඳවුර හම්බන්තොටට ගෙනයනු ඇත. ගුරුනගර් වධ කඳවුර කුරුණෑගලට ගෙන යනු ඇත. අද ද්‍රවිඩ තරුණයන් වෙනුවට සිංහල තරුණයන් එදාට ඒවායෙහි වධ විඳිනු ඇත. ඒ නිසා අද සිටම සිංහල ජනයා මේ අසීලාචාර පනතට විරුද්ධව සටන් කළ යුතු ය."[1]

---

1 - විවරණ සඟරාව, 1988 මාර්තු කලාපය.



# ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙන් ජීවිතාන්තය දක්වා සිරගත කළ පන්හිඳ - සතීෂ්

**ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කළ යුතු බව සමාජ ගත වෙමින් පවතින පසුබිමක බොහෝ දෙනා විසින් අමතක කරනු ලබන වැදගත් කාරණාව වන්නේ ත්‍රස්තවාදය පිළිබඳ සියලු අර්ථ කථන සිදු කරනු ලබන්නේ ත්‍රස්ත මර්දන නීතිවල පිහිටෙන් බලය චිරස්ථායී කරගනු ලබන රාජ්‍යය විසින්ම බවය. ත්‍රස්තවාදියෙකු ලෙස නම් කර ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියමව සිටින සෙල්ලයියා සතීෂ්කුමාර් නම් සාහිත්‍යවේදියා අපට අමතක කළ නොහැක්කේ එම සන්දර්භය තුළ ය.**

ජෙගන් ගනේෂන්

1974 වසරේදී කුරුණෑගල - මැල්සිරිපුර ප්‍රදේශයේ දරුවන් පස් දෙනෙකුගෙන් යුත් පවුලේ තෙවැන්නා ලෙස සෙල්ලයියාට දාව පවලවල්ලිගේ කුසින් සෙල්ලයියා සතීෂ්කුමාර් මෙලොව එළිය දුටුවේය. ඔහුගේ පියා රියදුරෙක් වූ අතර මව සන්නාලියක් වූවාය. ඔවුන් කුරුණෑගල ප්‍රදේශයේ ජීවත් වූ නිවස 1983 වසරේ දී ඇති වූ දෙමළ විරෝධී ප්‍රචණ්ඩත්වයේදී දෙවරක් ගිනිලනු ලැබිණි. දිනපතා මරණ බියත් සමඟ ජීවත් වීමට නොහැකි බව හැඟුණු සෙල්ලයියා සහ පවලවල්ලි සිය දරුවන් පස්දෙනා සමඟ කිලිනොච්චිය කරා ගොස් පදිංචි වීමට තීරණය කළහ. යුද්ධයට මැදිව ජීවත් වූ ඔවුන්ට දරුණු ආර්ථික අර්බුදවලට මුහුණ දෙන්නට සිදු විය. ආර්ථික අර්බුද මධ්‍යයෙහි වුවද සතීෂ්ගේ දෙමාපියන් තම දරුවන්ට අවශ්‍ය අධ්‍යාපනය අඛණ්ඩව ලබා දීමට කටයුතු කළහ. බෝම්බ පිපිරීම් ද වෙඩි හඬවල් ද මැද බංකර් වෙත දිව යමින් සතීෂ් සිය ළමා කාලය ගත කළේ නොයෙකුත් දුක්කම්කටොලු සමඟිනි. අධ්‍යාපන කටයුතු නිමා කළ ඔහු සිය මවගේ අඩි පාරේ යමින්, ඇඳුම් මැසීමටත් උගත්තේය. ඉන් අනතුරුව මුද්‍රණාලයක සහ බේකරියක රැකියාව කළේය. රියැදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් අනතුරුව ඔහු වව්නියාව ඩිපෝවේ කොන්ත්‍රාත් පදනම මත රියැදුරෙක් ලෙස සේවය කළ අතර, අනතුරුව පෞද්ගලික ආයතනයක රියැදුරෙක් ලෙස ද සේවය කළේය. කිලිනොච්චි දිස්ත්‍රික් රෝහලේ ගිලන් රථ රියැදුරෙක් ලෙස සේවයට බැඳුණේ එයින් ඉක්බිතිවය.

එම කාලයේදී සෞඛ්‍යය සංවිධානයක සහකාර ගිණුම්කාරිණියක ලෙස සේවය කළ ශාමලා නමැති තරුණිය සමඟ විවාහ ජීවිතයට එළැඹුණ සතීෂ් ඉන් වසර එකහාමාරක ඇවෑමෙන් පිය පදවියට පත් විය. සතීෂ් - ශාමලා යුවළ සිය දියණියට 'කම්සා' යනුවෙන් නම් තැබූ අතර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සතීෂ් අත්අඩංගුවට පත්වන විට ඇගේ වයස අවුරුදු දෙකකි.

## වෘත්තිය ජීවිතය

සතීෂ් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කරනු ලැබුවේ දරුණු යුද වාතාවරණය මැද යි. කුමන ස්ථානයක බෝම්බ පිපිරුණ ද, වෙලාවක් නොබලා සේවය වෙනුවෙන් කැප වී සිටිය යුතුය. පැය 24 ම සේවය වෙනුවෙන් කැප වී සිටි සතීෂ් තමන්ට නියමිත රාජකාරිය පමණක් නොව, අවස්ථානුකූලව පැවරෙන සියලුම කාර්යයන් ඉටු කළේය. තුවාල ලැබූවන් කිලිනොච්චියේ සිට යාපනය, වව්නියාව, නුවර, මහරගම සහ කොළඹ යන රෝහල් කරා රැගෙන යාම ඔහුගේ දෛනික රාජකාරිය විය. මෙම ගමන් මාර්ගයේදී, මුහමාලේ පිහිටා තිබූ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ සහ ශ්‍රී ලංකා හමුදාවට අයත් මුරපොළවලදී වාහනය නිරන්තරයෙන් පරීක්ෂාවට ලක් කෙරිණි. ඕමන්තයේදී ද ඊට සමානව පරීක්ෂා කෙරිණි. අවම වශයෙන් පරීක්ෂා කිරීම් සහ ලියාපදිංචි කිරීම් සඳහා විනාඩි 45 ක පමණ කාලයක් ගත විය. එහි සිටින්නේ සැබෑ රෝගීයෙක්ද නැතිද යන්නත් පරීක්ෂාවට ලක් විය.

සතීෂ් මෙම වෘත්තිය සිදු කළේ නොයෙකුත් බලපෑම් මැද ය.

කිසිදු සහායකයෙකු නොමැතිව ද සතීෂ් තුවාල ලැබූවන් වෙනත් රෝහල් කරා රැගෙන ගියේය. හමුදා පාලනයට නතු නොවී තිබූ කිලිනොච්චි ප්‍රදේශයට හමුදාව අවස්ථා කිහිපයකදී ගිලන් රථ ඉලක්ක කරමින් ක්ලේමෝ ප්‍රහාර එල්ල කර ඇත. ඒ හේතුවෙන් කාර්යය මණ්ඩලයේ බොහෝ පිරිස් ගිලන් රථ මඟින් ගමන් කිරීම ප්‍රතික්ෂේප කළහ. අනිවාර්යයෙන් යා යුතු බවට කිසිවෙකුටත් බල කෙරුණේ ද නැත. යුද සමයේ බොහෝ ජීවිත බේරා ගැනීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ඇගැයුමට ලක්වූ සතීෂ්ට ලබා දුන් සහතික පත්‍රද යුද්ධයේදී විනාශ වී තිබේ. සතීෂ්ට සිය වෘත්තියේ යෙදීමට සිදු වූයේ ඖෂධ, වෛද්‍යවරු, වෛද්‍ය උපකරණ රජය විසින් ලබා නොදුන් වාතාවරණයක් යටතේය.

## අත්අඩංගුවට පත් වීම

2008 වසරේ ජනවාරි මස 28 වන දින සතීෂ් සුපුරුදු පරිදි සිය රාජකාරියට වාර්තා කළේ, එදිනට ඔහුට මුහුණ දීමට සිදු වන අවාසනාවන්ත ඉරණම සම්බන්ධයෙන් කිසිවක් නොදැනය. එදින රෝහලට අවශ්‍ය ඖෂධ වර්ග රැගෙන ඒම සඳහා කොළඹට යාමට නියමිතව තිබුණි. රෝහල් පරිපාලකවරයාගේ උපදෙස් පරිදි ඔහු මෙම ගමනට සූදානම් විය. මුහමාලේ ප්‍රදේශයේ තිබූ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ මුරපොළේ පරීක්ෂා කිරීම් සහ ලියාපදිංචියෙන් අනතුරුව ඕමන්තේ ශ්‍රී ලංකා හමුදා මුරපොළේදීත්, තාණ්ඩිකුලම් මුරපොළේදීත් සතීෂ් විසින් පදවන ලද ගිලන් රථය පරීක්ෂාවට ලක් විය. යුද වාතාවරණය හේතුවෙන් කිලිනොච්චි දිස්ත්‍රික් රෝහලේ සම්බන්ධීකරණ කාර්යාලයක් වව්නියාවේ පිහිටා තිබුණි. එහි ගොස් ඖෂධ ලබා ගැනීමට අවශ්‍ය ලිපි ගොනු රැගෙන එහි සිටි මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාවද රථයට නංවාගෙන සතීෂ් කොළඹ බලා ගමන් ආරම්භ කළේය. කොළඹ දෙසට එන සියලු වාහන වව්නියාව තේක්කවත්ත මුරපොළේදී පරීක්ෂාවට ලක් කිරීම සාමාන්‍ය සිදුවීමකි. එම අවස්ථාවේ සතීෂ් පදවන ලද රථයේ ඔහු සමඟ, ඖෂධ භාරව සිටි නිලධාරියා මෙන්ම ඔහුගේ සහායකයාද සිටියේය. පොලීසිය විසින් වාහනය පරීක්ෂාවට ලක් කරන අතරතුර සතීෂ් ලිපිගොනු රැගෙන ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා පිටත්ව ගියේය. සෙසු දෙදෙන රථයෙන් පිටතට බැස සිට ඇති අතර එම අවස්ථාවේදී රථය තුළ පුපුරණ ද්‍රව්‍ය තිබූ බවට පවසමින් ඔවුන් තිදෙනාව පොලීසිය විසින් අත්අඩංගුවට ගන්නා ලදී.

## වධ හිංසා

අත්අඩංගුවට ගනු ලැබූ ඔවුන්ගේ දෑස් බැඳ වව්නියාව පොලීසිය වෙත රැගෙන යන ලදී. එහිදී ඔවුන්ට පොලිසියේ දැඩි පහරදීම්වලට මුහුණ දීමට සිදු විය. ඉන් අනතුරුව ආරක්ෂක අමාත්‍යංශයේ අනුමැතිය යටතේ ඔවුන්ව මාසයකට අධික කාලයක් රැඳවුම් භාරයේ තබා ගන්නා ලදී. සතීෂ්ව කොළඹ පිහිටි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිව්වන මහලේ රඳවා තැබුණි. එහි මාස හයක කාලයක් දැඩි වධ හිංසාවලට මුහුණ දීමට සතීෂ්ට සිදු විය. ඉන් මුල් මාස තුන ඔහු අසීමිතව වධ හිංසාවලට ලක් විය. එහි සිටින නිලධාරීන් පවසන දේවල් සමඟ එකඟ වන ලෙසත්, හිස් කඩදාසිවල අත්සන් කරන ලෙසත් සතීෂ්ට බල කෙරිණි.

රජයට අයත් වාහනයක තිබූ කිසියම් දෙයක වගකීම තමන්ට භාරගත නොහැකි බව සතීෂ් එම නිලධාරීන්ට පවසන විට ඔහුට තව තවත් දරුණු වධ හිංසාවලට ලක් වෙන්නට සිදු විය. ඔහුගේ හිස මත පොතක් තබා විකට් පොල්ලකින් දැඩි ලෙස පහර දීම් සිදු කර ඇත. එම පහරදීම් හේතුවෙන් දැඩි හිසේ වේදනාවක් හටගෙන ඇති අතර එයට අමතරව ඔහුගේ හිස අභ්‍යන්තරයටද හානි සිදු වී ඇත. මෙම පහරදීම් හේතුවෙන් අතුරු කායික ආබාධ හා ප්‍රතිවිපාකවලට මුහුණ දීමටද සතීෂ්ට සිදුව තිබේ.

## අධිකරණයට ඉදිරිපත් කිරීම

මාස හයක කාලයක් රැඳවුම් භාරයේ සිටි සතීෂ්ව වව්නියාව මහාධිකරණය හමුවට ඉදිරිපත් කෙරිණි. එහිදී ඔහුව රිමාන්ඩ් භාරය යටතේ අනුරාධපුර බන්ධනාගාරය වෙත යවන ලදී. මාස 18 කට පසුව යළිත් නඩුව වව්නියා අධිකරණයේදී කැඳවනු ලැබීය. මානව හිමිකම් සම්බන්ධයෙන් හඬ නඟන සිවිල් සංවිධානයක ආධාර මත නීතිඥවරයෙකුගේ සහාය ලබා ගැනීමට සතීෂ් කටයුතු කළේය. එහිදී ඔහු සමඟ අත්අඩංගුවට ගත් සෙසු දෙදෙනාව නිදහස් කර රථයේ රියදුරා වූ සතීෂ්ට ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම කෙරුණි.



සතීෂ්ගේ රෝහල් රියදුරු හැඳුනුම් පත

## ඥාතීන්ගේ බලාපොරොත්තු සුන් වීම

නඩුව ගොනු කිරීමේදී තාක්ෂණික ගැටලු රැසක් පවතින බවට නීතිඥවරු සතීෂ්ගේ ඥාතීන් වෙත දැනුම් දී තිබිණ. ඒ හේතුවෙන් එදින ඔහුට නිදහස ලැබෙනු ඇතැයි යන බලාපොරොත්තුවෙන් පවුලේ උදවිය අධිකරණය වෙත පැමිණ සිටියහ. නඩු වාරය ආරම්භ කිරීමට පෙර කුඩා කම්සා දියණිය සිය පියා වෙත පැමිණ "ආහාර රැගෙන නොපැමිණි බවත්, නිදහස් වී පෙරළා ගොස් සියලු දෙනා එක්ව ආහාර අනුභව කළ හැකි බවත්" පැවසුවාය. ඔහුගේ බිරිඳ වන ශාමලා සතීෂ් සඳහා අලුත් ඇඳුම් පවා රැගෙන පැමිණ සිටියාය. කෙසේ වෙතත් අවසානයේදී අධිකරණය ලබා දුන් තීන්දුව ඔවුන්ගේ හිස මතට පතිත වූ අකුණක් මෙන් විය. ඔවුන්ගේ වැළපීම් හඬින් අධිකරණය දෝංකාර දෙන්නට විය. දින 14 ක් ඇතුළත නඩු තීන්දුව අභියෝගයට ලක් කරමින් කොළඹ අභියාචනාධිකරණයේ පෙත්සම් ගොනු කෙරිණි. ඉතා දීර්ඝ කාලයක් විභාග කළ මෙම නඩුවේදී ජීවිතාන්තය දක්වා වන සිර දඬුවම තහවුරු කරන ලදී. නඩු තීන්දුව ලැබී තිබුණද, එය තම පවුලේ උදවියට නොකියා සිටීමට ඔහු තීරණය කළේය. ශ්‍රේෂ්ඨාධිකරණය හමුවට යාම පලක් නොවන බව ඔහුගේ අදහස වී තිබුණි.

### දේශපාලන සිරකරුවන්ට ඥාතීන්ට එල්ල වන තර්ජන ගර්ජන

අභියාචනාධිකරණයේදී සතීෂ්ට ජීවිතාන්තය දක්වා සිර දඬුවම් හිමි වූ බව කාලය ගත වන විට ඔහුගේ මව ඇතුළු පවුලේ ඥාතීහු දැනගත්හ. කිලිනොච්චියේ සිට මසකට වරක් හෝ සිය පුතාව බැලීම සඳහා බන්ධනාගාරයට පැමිණීම පවලවල්ලි මව පුරුද්දක් කරගෙන සිටියාය. මෙම ගමන සාමාන්‍ය ගමනක් ලෙස කිසිසේත් සැළකිය නොහැකිය. ඇය බන්ධනාගාරයට පැමිණෙන සෑම අවස්ථාවකදීම ආරක්ෂක අංශවලින් එල්ල වන විවිධ බාධා කිරීම්වලට මුහුණ දුන්නාය. දේශපාලන සිරකරුවන් නිදහස් කරන ලෙස ඉල්ලමින් සිදු කරන විරෝධතාවලට සහභාගී නොවන ලෙසට ඇයට විවිධ තර්ජනාත්මක ඇමතුම් ලැබී තිබිණ. ඇයව මානසිකව පීඩාවට ලක් කිරීමට ආරක්ෂක අංශ විවිධාකාරයෙන් කටයුතු කර ඇත. මෙවැනි තර්ජන මධ්‍යයේ තව දුරටත් රට තුළ ජීවත් වීම කළ නොහැකි වූයෙන් ශාමලා සිය දියණිය සමඟ තමන්ට හිමිව තිබූ ඉඩකඩම් විකුණා විදේශ රටකට ගියාය.

### යළි අධිකරණ ක්‍රියා මාර්ග ගැනීම

2017 වසරේදී, තමන්ට ලබාදී ඇති නඩු තීන්දුව අභියෝගයට ලක් කරමින් සතීෂ් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ පෙත්සමක් ගොනු කළේය. වසර පහ හමාරක් ගත වීමෙන් අනතුරුව මෙම වසරේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පෙත්සම සළකා බලා, එය ලබන වසරේ පෙබරවාරි මස 21 වනදාට කල් තබා තිබේ.

### සාහිත්‍ය ජීවිතය

බන්ධනාගාරය තුළ ජීවත් වෙමින් ලේඛනයේ නිරත වීම ඉතා පහසු කාර්යයක් යැයි බොහෝ දෙනා සිතති. එහෙත් එහි නිරත වන්නෝ එය කෙතරම් අසීරු කරුණක්ද යන වගට සාක්ෂි දරති. ජීවිතාන්තය දක්වා සිර දඬුවම් හිමි වීමෙන් අනතුරුව සතීෂ් දැඩි ලෙස කඩා වැටුණේය. ඔහුගේ තනියට සිටියේ බෝම්බ පිපිරීම්ද වෙඩි හඬවල්ද මැද බංකරය තුළට වී ඉගෙන ගත් අකුරු පමණි. සිය දුක් වේදනා තුනී කර ගැනීමේ අරමුණින් ඔහු ලිවීම ආරම්භ කළේය. මීට පෙර පොතපත කියවීම පමණක් සිදු කළ ඔහු ලිවීම සඳහා යොමු වූයේ බන්ධනාගාරය තුළදීය. නමුත් බන්ධනාගාරය තුළදී පොත්පත් සහ පුවත්පත් ලබා ගැනීම ඉතා අපහසු කරුණකි. මීට පෙර ලිවීම සම්බන්ධයෙන් උනන්දුවක් නොමැතව සිටි ඔහු තම අත්දැකීම් ඇසුරෙන් කවි ලිව්වේය. අනතුරුව අනෙකුත් සිරකරුවන්ගේ අත්දැකීම උකහා ගනිමින් කාව්‍යකරණයේ නියැලුණේය. ඉන් අනතුරුව විචාරාත්මක ලිපි සහ කෙටි කතා ලිවීම ආරම්භ කළේ ය. බන්ධනාගාරය තුළට පෑන්, පොත් සහ ලිවීමට අවශ්‍ය කඩදාසි ගෙන්වා ගැනීම ඉතා අසීරු කරුණකි. එලෙස ගෙන එන ඒවා ප්‍රවේශම් කරගැනීමට සිදුවෙයි. දුම් පානය කරන පිරිස් එම කඩදාසි සොරා ගැනීම සේම බන්ධනාගාර නිලධාරීන්ගේ සෝදිසි කිරීම් හමුවේදී තවත් ලිපි ලේඛන විනාශ වීමද සිදු වේ. එසේම බන්ධනාගාර තුළ සිදු වන නොසන්සුන්කාරී තත්ත්වයන් තුළදීද මේවා විනාශ වෙයි. අසුන් ගෙන ලිවීමට මේසයක් පුටුවක් නොමැති සිරමැදිරයක බිම හිඳගෙන ලෑලි කැබැල්ලක් උකුලේ තබා ගත් සතීෂ් ලිවීමේ කටයුතු සිදු කළේය.

2017 වසරේදී නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලැබූ සිසුවියක් සිය අවසන් ව්‍යාපෘතිය ලෙස සතීෂ්ගේ කාව්‍ය සංග්‍රහය සම්බන්ධයෙන් වන පර්යේෂණ වාර්තාවක් සකස්




සිරෙයිල් ඉරුන්දු සිංහල සහෝදරනුක්කු (බන්ධනාගාරයේ සිට සිංහල සහෝදරයාට)




විඩියලෛ තේඩුම් ඉරවුගල් (අලුයම සොයනා රාත්‍රීන්)




වේප්ප මරුමුම් පවලම් ආච්චියුම් (කොහොඹ ගස සහ පවලම් ආච්චි)

කළාය. බන්ධනාගාරය තුළ සිට ලිවීමේ කටයුතු සිදු කරන සතීෂ් පළාත් මට්ටමේත්, දේශීය සහ ජාත්‍යන්තර මට්ටමේත් කෙටි කතා තරගාවලි සඳහා ඉදිරිපත් වී අත්කරගෙන ඇති ජයග්‍රහණද රැසකි. මේ දක්වා කාව්‍ය සංග්‍රහ තුනක් සහ කෙටි කතා සංග්‍රහ දෙකක් සතීෂ් විසින් එළි දක්වා ඇත.

ඉරුම්බු කදවුක්කුල් නින්ඩා (යකඩ දොරටු තුළ සිට), විඩියලෛ තේඩුම් ඉරවුගල් (අලුයම සොයනා රාත්‍රීන්), මන සිරෙයිල් ඉරුන්දු (සිත් බන්ධනාගාරයේ සිට), සිරෙයිල් ඉරුන්දු සිංහල සහෝදරනුක්කු (බන්ධනාගාරයේ සිට සිංහල සහෝදරයාට) යනුවෙන් සතීෂ් විසින් මේ දක්වා කාව්‍ය සංග්‍රහ හතරක් එළි දක්වා ඇත. වේප්ප මරුමුම් පවලම් ආච්චියුම් (කොහොඹ ගස සහ පවලම් ආච්චි) යනුවෙන් කෙටි කතා සංග්‍රහයක්ද ඔහුගේ නිර්මාණ අතරට එක්ව තිබේ. මීට අමතරව ඔහු විසින් රචිත ලිපි එකතුවක්, කෙටි කතා සංග්‍රහයක් සහ ගිලන් රථ රියදුරෙකු ලෙස ලද අත්දැකීම් ඇතුළත් කළ නව කතාවක්ද ඉදිරියේදී එළි දැක්වීමට නියමිතය.

රාජ්‍ය විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිත කරමින් සතීෂ් ආදී බොහෝ දෙනා සිරගත කර ඇත. ඇතැමුන්ට තවමත් චෝදනා ගොනු කිරීම පවා සිදු කර නැත. ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදියා පිළිබඳ අවසන් නිර්වචනය තීන්දු කිරීමේ ක්‍රමවේදය රාජ්‍යය සතු බලයට යටත්ය. සතීෂ් ත්‍රස්තවාදියෙකු වන්නේ ඒ අර්ථයෙනි. සතීෂ් වැන්නන් ජීවිතාන්තය තෙක් සිරගත කිරීමට අවශ්‍ය නීතිමය පදනම සකසා ගැනෙන්නේ දැන් දකුණේ සිංහල ජනයාගෙන් සැළකිය යුතු පංගුවකගේ විරෝධයට පාත්‍රව ඇති ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මාර්ගයෙනි.

සතීෂ් වැනි දෙමළ සිරකරුවන්ගේද, ප්‍රමාණය පවා හරියාකාරව නොදන්නා මුස්ලිම් සිරකරුවන්ගේ ද සාමූහික ඉරණමින් වියුක්තව ත්‍රස්ත මර්දන පනතේ ප්‍රජාන්ත්‍ර විරෝධී හරය ගැන කතා කළ හැකිද? ත්‍රස්ත මර්දන නීතිවල අනීතික පදනම් ගැන කතා කරන්නට දකුණු දිග ලංකා වාසී ජනයාට දැන් එළැඹ ඇති අවස්ථාව ඕනෑ නම් සතීෂ්ලා මුහුණ දුන් අයුක්ති සහගත ඉරණම් ගැන කතා කරන්නටද අවස්ථාවක් කර ගත හැකිය.

සහෘද සංවාද

# "ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙන් තරුණයන්ගේ දේශපාලන සිතුවිලි සහ ක්‍රියාකාරීත්වය ඝාතනය කරනවා"



කළුකරයේ උපත ලබා දකුණේ සමාජයේ හැදී වැඩුණු මාරිමුත්තු සත්තිවේල් පියතුමා විමුක්තිකාමී ක්‍රිස්තියානි ප්‍රවණතාවයේ දැවැන්ත චරිතයක් ලෙස හැඳින්විය හැක. එතුමා දකුණේ අධිපති දෘෂ්ටිවාද අභියෝගයට ලක් කරමින් සුළුතර ජනතාවට සිදුවන අකටයුතුකම් සහ මර්දනයට එරෙහිව අඛණ්ඩව ජීවිත තර්ජන මැද කැපවන මානව ක්‍රියාකාරිකයෙකි. දේශපාලන සිරකරුවන් නිදහස් කරගැනීමේ ජාතික ව්‍යාපාරයේ සම්බන්ධීකාරක ලෙස දීර්ඝ කලක් මුළුල්ලේ දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම වෙනුවෙන් වෙහෙසවන්නෙකි. මේ, රාජ්‍ය අපරාධකාරීත්වයට විරුද්ධව වසර 30ට අධික කාලයක් තිස්සේ යුක්තිය උදෙසා අප්‍රතිහතව අරගල කරමින් සිටින සත්තිවේල් පියතුමා සමඟ සිදු කළ සහෘද සංවාදය යි.

DushiYanthini Kanagasabapathipillai (flickr.com)

**සංවාදය : රියෝ**

**ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්මත කර වසර 43 කට පසුව දකුණේ සමාජයේ ඊට එරෙහි යම් පුළුල් මහජන විරෝධයක් ගොඩනැඟී තිබෙන බව නිරීක්ෂණය කරන්න පුළුවන්. නමුත් විශේෂයෙන් දෙමළ සමාජය තුළ මේ විරෝධය අලුත් එකක් නෙමේ නේද?**

දෙමළ සමාජය තුළ අපි හැමෝම දීර්ඝ කාලීනව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට එරෙහිව වැඩ කරලා තියෙනවා. මේක ගෙනාවේ 1979. මේ වෙනකොට අවුරුදු 43ක් වෙනවා. මම කියන්නෙ මේ පනත තරුණයන් සංහාරය කරන්න ගෙන ආ පනතක්. 2009 පසුව දේශපාලනිකව අපි කියනවා ජන සංහාරයක් සිද්ධ වුණා කියලා. දේශපාලනිකව දෙමළ තරුණයන් සංහාරය කිරීමට ඊට පෙර ඉඳන් මේ පනත ගෙන ආවේ. තරුණයන් තමයි දේශපාලනයට නායකත්වය දුන්නේ. පැරණි නායකත්වය ප්‍රතික්ෂේප කරමින් අලුත් නායකත්වය ලෙස තරුණ නායකත්වය ගොඩනැඟෙනවා. ඒ තරුණ නායකත්වය සහමුලින්ම ඝාතනය කිරීම සඳහා තමයි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ගෙන ආවේ. මේ පනත ගෙනල්ලා අවුරුදු 43ක් වෙනවා. මේ පනත තුළින් සිය දහස් ගණන් තරුණයන් අත් අඩංගුවට ගත්තා. සිරගෙවල් පිරුණා. පොලිසි පිරිලා තිබුණා. ඒ අත් අඩංගුවට ගත් බොහෝ තරුණයන්ට ඒ අත් අඩංගුවට ගැනීම් නිසාම සංවිධානවලට බැඳෙන්න සිද්ධ වුණා. මොකද ඔවුන්ට වෙන ආරක්ෂවක් තිබුණේ නැහැ. ආරක්ෂාව පතා සංවිධානවලට ගියා. අනෙත් පැත්තෙන් එදා ගෙන ආපු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හේතු කොටගෙන විශාල තරුණ තරුණියන් පිරිසක් රට අත් හැරලා දාලා යන්න ගියා. ඒ විතරක් නෙවෙයි මම කලින් කිව්වා  වගේ විශාල පිරිසක් අත් අඩංගුවට ගන්නවා. ඒ අත් අඩංගුවට ගන්න කාලයේම, ඒ අත් අඩංගුවට ගත්තාට පස්සෙ ඒ අයගේ තරුණකම ඝාතනය කරලා තියෙනවා. ඒ අයගේ තාරුණ්‍යයේ සිතුවිලි ඝාතනය කරලා තියෙනවා. ඒ අයගේ

දේශපාලන මතවාද ඝාතනය කිරීම තමයි රජයේ අරමුණ. බොහෝ දුරට ඒකත් සිද්ධ වෙලා තියෙනවා. ශාරීරිකව මේ තරුණ තරුණියන් දුර්වල වී තිබෙනවා. අත් අඩංගුවට ගැනීම, සිරගත කිරීම නිසා බන්ධනාගාරය ඇතුළේ ඉන්න කාලයේ ඒ අයට සිදුවුණා නැවත වතාවක් ඒ ඝාතනයේ දිගුවක් බවට පත් වෙන්න. එතකොට අවුරුදු 43ක් වෙනකොට අපි දැන් දකිනවා ඒ තරුණයන්ගේ ජීවිත. ඒ තරුණයන්ට තමන්ගේ දරු පවුල් එක්ක ජීවත් වෙන්නත් බැහැ. බොහෝ තරුණයන් විවාහ වුණ අය. ඔවුන්ට ලොකු ප්‍රශ්න තියෙනවා. ඒ වගේම දේශපාලනික හා සමාජීය ප්‍රශ්න, සංස්කෘතික ප්‍රශ්න මේ හැම දෙයක්ම වෙලා ඔවුන් සම්පූර්ණයෙන්ම ජන සංහාරය වෙලා. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත නිසා තරුණයන් සංහාරය වුණා.

**ඔබ පවසන අන්දමට තාරුණ්‍යය සහ දේශපාලන මතවාද ඝාතනය කිරීම සඳහා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිතා වුණේ කොහොමද?**

අත් අඩංගුවට ගැනීමෙන් පසුව හතරවෙනි තට්ටුවට ගෙන ගොස් ඔවුන්ට දෙන වධහිංසා, බිය ගැන්වීම් හරහා ඔවුන්ගේ මානව හිමිකම් උල්ලංඝනය කරනවා. නිදහසේ සිතන්න ඉඩ තියෙනවා කිව්වාට එසේ නිදහසේ හිතන්නටවත් ඉඩක් නැහැ. මේ අයට ඇප දෙන්නේ නැහැ. ඇප නැහැ කියන්නෙ මේ අයට සමාජයට ඇතුළු වෙන්න බැහැ. සමාජගත වෙන්න බැහැ. එක තමයි මේ පනතේ තියෙන කුරිරුකම. එතකොට මේ අයගේ දේශපාලනික ක්‍රියාකාරීත්වය, දේශපාලන සිතුවිලි සියල්ලම මෙතැනින් ඝාතනයට ලක්වෙනවා. ඇතුළට ආවට පස්සෙ මේ අයව දේශපාලන සිරකරුවන් ලෙස නෙවෙයි ත්‍රස්තවාදීන් ලෙසයි හඳුන්වන්නේ. මේ පනතම කියන්නෙ මේ අය ත්‍රස්තවාදීන් පිරිසක් කියලා. දේශපාලන සිරකරුවන් නම් ඒ අයට තියෙනවා වෙනම අයිතිවාසිකම්. එතකොට ඒ අයිතිවාසිකම් මේ අයට ලැබෙන්නේ නැහැ. දේශපාලන සිරකරුවන්ට අවශ්‍ය නම් පොත්පත් ඉල්ලගන්න පුළුවන්. දේශපාලනික පොත්පත් ඉල්ලගන්න පුළුවන්. නමුත් මේ කිසිවක් මේ අයට ලැබෙන්නේ නැහැ. එළියේ වෙන දේවල් පිළිබඳව කවුරුත් කිසිවිටක දන්නේ නැහැ. සමාජයේ වෙන දේවල් ගැන ඒ අය දන්නේ නැහැ. එතකොට කොහොමද ඒ අයගේ දේශපාලන මතය දියුණු කරගන්නේ? ඒ අයට දෙමාපියන් සමඟ සම්බන්ධතාවයක් නැහැ. සමාජයේ වෙන්නෙ මොකක්ද කියලා මේ අය දන්නේ නැහැ. සමාජයේ දිනපතා වෙන්නෙ මොකක්ද කියලා දැනගත්තොත් තමයි මේ අයගේ මතවාද තවත් තිව්‍ර කරගන්න, දියුණු කරගන්න පුළුවන් වෙන්නේ. නමුත් සමාජයෙන් සම්පූර්ණයෙන්ම මේ අයව ඈත් කරලා. මේ අය සිරගත කළ පසුව සමහරක් අයට ඥාතීන් හෝ කිසිවෙක් එක්ක සම්බන්ධතාවයක් නැහැ. තමන්ගේ සංවිධානය සමඟවත්, තමන්ගේ සමාජය සමඟවත් සම්බන්ධතාවයක් නැහැ. ඉතින්, ඒක දේශපාලනික මරණයක් නැතිනම් ඝාතනයක් නෙවෙයි නම් වෙන මොකක්ද?

**පාස්කු ප්‍රහාරයට වසර දෙකක් ගත් වෙලා. නමුත් අත් අඩංගුවට ගත්ත බොහෝ අයව තවම චෝදනා ගොනු නොකර අත් අඩංගුවේ තබාගෙන සිටිනවා. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මුස්ලිම් ජන සමාජයට ඇති කළ බලපෑම මොන වගේද?**

පාස්කු ප්‍රහාරය පිළිබඳව අපි හැමෝම හරියට දන්නෙ නැහැ. ඒක දේශපානික වුවමනා මත කළ දෙයක් ද කියන්න අපි



දේශපාලන සිරකරුවන් නිදහස් කර ගැනීමේ ව්‍යාපාරය විසින් දෙමළ
දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම සඳහා යාපනයේදී පවත්වන ලද
පාගමනකදී (2017)

දන්නේ නැහැ. නමුත් අපි නිශ්චිතවම දන්නවා උතුරු නැගෙනහිර තරුණයන් සංහාරය කිරීමේ අරමුණෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ගෙන ආවේ කොහොමද කියන කාරණය. ඊළඟට අපි හැමෝම ඒ දවස්වල ඉඳන් කියපු කාරණයක් තමයි, මේ මර්දනය ඊළඟට එන්නෙ මුස්ලිම් ජනතාවට බව. මුස්ලිම් සමාජයට එරෙහිවත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යොදා ගෙන විශාල පිරිසක් අත් අඩංගුවට ගත්තා. ඒ අත් අඩංගුවට ගන්න පිරිස් සම්බන්ධයෙන් අපි සංවිධානයක් හැදුවා. මුස්ලිම් ප්‍රජාව තුළ අත් අඩංගුවට ගත්ත අය වෙනුවෙන් කතා කළොත් ඔවුන්වත් අත් අඩංගුවට ගනීවි කියන බිය තියෙනවා.

නීතීමය තත්වය බැලුවොත් අසාද් සාලී, රිෂාඩ් බදියුද්දීන් අත් අඩංගුවට අරගෙන මාස 6ක් ඇතුළත නඩුව ඉවර කරනවා. එහෙම ඉවර කරන්නේ ආණ්ඩුවේ දේශපාලනික වුවමනාව මත මිස වෙන මුකුත් නිසා නෙවෙයි. එතකොට ජාත්‍යන්තරයට කියන්න පුළුවන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගත්ත සමහර අය නිදහස් කළා කියලා. පසුගිය අවුරුද්දේ ගෝටාභය රාජපක්ෂ දෙමළ තරුණයන් 16ක් නිදහස් කළා. කවුද ඒ 16 දෙනා? ඊළඟ මාස කිහිපය තුළ නිදහස් වෙන්න නියමිත හිටපු අය. එතකොට ජාත්‍යන්තරයට කියන්න පුළුවන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගත්ත අයව නිදහස් කරනවා කියලා. එහෙම කියලා ජාත්‍යන්තරය රවට්ටනවා. මුස්ලිම් නායකයන්ව තමයි තමන්ගේ න්‍යාය පත්‍රයට දාගන්න පුළුවන්කමක් තියෙන්නේ. මුස්ලිම් ජනතාව නිහඬ කරන්න ඕනි නම්, මේ වගේ එක්කෙනෙක් දෙන්නෙක් නිදහස් කරනවා. නමුත් මම කලින් කිව්වා වගේ ගම් මට්ටමෙන් ඉන්න තරුණයන්ව අත් අඩංගුවේ තියාගන්නවා. එහෙම අත් අඩංගුවේ තියාගත්තාට පස්සෙ ගම් මට්ටමේ ඉන්න තරුණයන් බයයි දේශපාලන වැඩ කරන්න. ඒ අය පල්ලිවලට යන්න බයයි. ඒ නිසා මවුලවිවරුන් දේශනා කරන්න බයයි. දැන් ඒ තත්වය ඇවිත් තියෙනවා. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙන් කළේ මුළු මුස්ලිම් සමාජයම දේශපාලනිකව නිහඬ කිරීම.



ඇප නියම වූ චෝදනාවට ලක් වූ දේශපාලන සිරකරුවෙකු නැවත රිමාන්ඩ් භාරයට පත් කළ අවස්ථාවක්. (උපුටා ගැනිම - **Ceylon Today** - 12.11.2015)

**දේශපාලන සිරකරුවන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් දීර්ඝ කාලයක් තිස්සේ ක්‍රියාකාරි වූ කෙනෙක් වශයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, ඊට ගොදුරු වෙන මිනිසුන්ගේ ජීවිතවලට ඇති කර තිබෙන බලපෑම ගැන ඔබේ අත්දැකීම් මොන වගේද?**

තමන්ගේ ඥාතීන් හෝ සමාජය සමඟ කිසිදු සම්බන්ධතාවයක් නැතුව දිර්ඝ කාලීනව ඇප නැතුව ඇතුලේ ඉන්න කාලයේ මේ අය එක් පැත්තකින් මානසිකව වැටෙනවා. දෙවෙනි කරුණ, මේ අය මානසික හේතු නිසා නොයෙකුත් ලෙඩ රෝගවලට ගොදුරු වෙනවා. මානසික පීඩනය නිසාම මේ අයගේ රුධිරයේ සිනී මට්ටම වැඩි වෙනවා, අධි රුධිර පීඩනය හැදෙනවා, අර්ශස් වැනි රෝගවලට ගොදුරු වෙනවා. අපි දන්නවා මේ ලෙඩරෝග හේතු කොටගෙනම මිය ගිය දේශපාලන සිරකරුවන් ඉන්නවා. ඒ අයගේ මරණ සහතිකයේ දී දොස්තරලා කියනවා මේ අය මැරුණේ අහවල් රෝගයෙන්, හෘද රෝග නිසා, සීනි නිසා හෝ මොකක් හරි රෝගයක් නිසා කියලා. මම කියන්නෙ මේ අය මියගියේ ඒ රෝග නිසා නෙවෙයි. ඒ මරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හරහා සිද්ධ කළ ඝාතන. ඒවා ස්වභාවික මරණ කියලා දොස්තරලා කියන්න පුළුවන්. නමුත් ඒවා ස්වාභාවික මරණ නෙවෙයි. ඊළඟ කාරණය තමයි සමහරුන්ගේ බිරිඳෑවරුන් වෙනත් විවාහ කරගෙන තියෙනවා. මොකද මේ අය කවදා නිදහස් වේවිද කියලා නොදන්න නිසා. දරුවන්ට තාත්තලා අහිමි වෙලා. මේ වගේ සිරගත වුණ තාත්තා කෙනෙක් ඉන්න දරුවන්ගේ මානසික මට්ටම කොයි වගේ ඇතිද?

ඒ වගේම මේ අයගේ දෙමාපියන්, වැඩිහිටි අය බලාගන්න කවුරුත් නැහැ. ඒ වගේ ගොඩක් අය ඉන්නවා අපි එක්ක සම්බන්ධ වුණ. ඒ දෙමාව්පියන් "අපිට මුදල් ආධාර කරන්න ෆාදර්. අපිට කන්න නැහැ" කියලා කියනවා. එතකොට ඒ අයගේ දුප්පත්කම? ඒ සිරගත වෙලා ඉන්න අය මේ ගැන හිතනවා. ඒ ගැන හිතලා හිතලාම දිනෙන් දින ශාරීරිකකව දුර්වල වෙලා මිය යනවා. ඒ වගේම මේ අය ත්‍රස්තවදීන් ලෙස නම් කිරීම නිසා මේ අයගේ ඥාතීන්ට දෙමාව්පියන්ට සහ දරුවන්ට සුවිශාල අවදානමකට මුහුණ දෙන්න සිදුවෙනවා. උතුරු නැගෙනහිර විතරක් නෙවෙයි මේ ප්‍රශ්නය තියෙන්නෙ. උතුරු නැගෙනහිරෙන් පිට ඉන්න සිරගත තරුණයන් කොහොමද ජීවත් වෙන්නේ? ඒ තරුණයන්ගේ දෙමාව්පියන් කොහොමද ජීවත් වෙන්නේ? මේ තරුණයන් සම්බන්ධ වුණේ දේශපාලනයට. නමුත් හඳුන්වන්නේ ත්‍රස්තවාදියා කියලා. මේ තමයි සමාජීය පැත්ත. එක නිසා ශාරීරිකව, මානසිකව සහ සමාජීය වශයෙන් දුක් විඳින පවුල් අනන්ත අප්‍රමාණයි. බොහෝමයක් දේශපාලන සිරකරුවන්ගේ පවුල් සී සී කඩ වෙලා තියෙනවා මේ ප්‍රශ්න නිසාම. ඒ පිළිබඳව වෙනම සෙවිය යුතුයි.

**ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගත් දෙමළ සිරකරුවන් පිරිසක් 1983 දී වැලිකඩ බන්ධනාගාරයේ දී ඝාතනයට ලක් වුණා. බන්ධනාගාර තුළ දේශපාලන සිරකරුවන් ඝාතනය වීම සහ ඔවුන්ට ඇති ජීවිත අවධානම මොන වගේ ද?**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගන්න සියලුම දෙනාව බන්ධනාගාර ගත කරන මොහොතේ සහ අත් අඩංගුවට ගත්ත මොහොතේම හඳුන්වන්නෙ ත්‍රස්තවාදීන් ලෙස. ඔවුන් ආණ්ඩු විරෝධීන්, දේශද්‍රෝහීන් විදියට තමයි නම් කරන්නේ. 1977, 1983 වගේ වසරවල සිදුවුණු ගෙවල් ගිනි තැබීම්, මිනිස්සු පාරවල් මැද ඝාතනය කිරීම් ආවේගශීලිකම නිසා සිද්ධ වුණ කාරණයක් ලෙස තමයි දකින්නේ. ඒ නිසා ඒවා සම්බන්ධයෙන් නඩු කටයුතු පවත්වාගෙන යන්නේ නැහැ. බන්ධනාගාරය තුළ ඉන්නේ දේශද්‍රෝහීන්, ආණ්ඩු විරෝධීන්, ත්‍රස්තවාදීන් කියලා තමයි නම් කරලා තියෙන්නෙ. එතකොට මේ පනත යටතේ අත් අඩංගුවට ගත්ත අය පවා ඉන්නේ තමන්ගේ ජීවිතයට කොයි මොහොතේ හෝ තර්ජනයක් හෝ හානියක් වේවි කියන බියෙන්. ඒ නිසාම මේ අය දීර්ඝ කාලීනව කිව්වෙ අපිව වෙනම තියන්න, අපිට ආරක්ෂාව ඕනේ කියලා. 1983 දී බන්ධනාගාර ගත කරලා තිබුණ දෙමළ දේශපාලන සිරකරුවන්ව මරන්න අවස්ථාවක් ආණ්ඩුව විසින් සලසා දුන්නා. ඒ කාලයේ හිටපු බන්ධනාගාර නිලධාරීන් පවා ඉඩකඩ සලසා දුන්නා. එතකොට මේ පනත යටතේ ත්‍රස්තවාදීන් විදියට නම් කළ පසුව ඒ අයට දඬුවම් කිරීමට සාමාන්‍ය ජනතාවට පවා නිල නොවන අවසරයක් හිමිවෙනවා. එදා ලැබුණේ ඒ දෙමළ සිරකරුවන් ඝාතනය කිරීමට නිල නොවන අවසරයක්. 83න් පසුවත් අපි දකිනවා එහෙම සිදුවීම්. පළවෙනි සිද්ධිය වව්නියාවේ. ඊට පස්සෙ අනුරාධපුර. ඒ සිද්ධියෙන් පස්සෙ රාගම ඉස්පිරිතාලේ හිටපු කෙනාව මම ගිහින් බැලුවා. ඇතුළට යන්න දෙන්නේ නෑ. නමුත් මම බලෙන් ගියා. වටේම ආවරණය කරලා තිබුණේ. මම ළඟට ගිහින් බැලුවා. පහර දීම් නිසාම ඒ කෙනාට සිහිය තිබුණේ නැහැ. නමුත් ඒ මොහොතේ පවා අත් කකුල්වලට මාංචු දාලා. මොකක්ද මේ ඉස්පිරිතාලයක්ද? සිහිසුන්ව ඉන්න ඉන්න අයෙකුට පවා ඒ විදියට සැළකීම තුළින් මොකක්ද අදහස් වෙන්නේ ?

කොළඹ ඉඳන් හමුදාවෙන් ගිය අය තමයි අනුරාධපුරයේ පහර දුන්නේ. ඊට කලින් සිදුවුණ බිඳුණුවැව සිදුවීමත් ඔය වගේ. මේ වගේ සිදුවීම් ගණනාවක් සිදුවෙලා තියෙනවා. කොයි මොහොතේ හෝ මේ සිරකරුවන් තමන්ට මොකක් හරි වේවි කියලා බියෙන් තමයි ඉන්නේ. මේ මොහොත වන තෙක් දේශපාලන සිරකරුවන් විදියට මේ අය උද්ඝෝෂණ, උපවාස

හැම දෙයක්ම කරලා එක දෙයයි කියන්නේ. ඒ, තමන් උපවාස උද්ඝෝෂණ කරන්නේ අපේ නිදහස වෙනුවෙන් මිස නිළධාරීන්ට විරුද්ධව නෙමේ කියලා.

දැන් සිරකරුවන් බන්ධනාගාරයෙන් අධිකරණයට ගෙනියන්නේ නැහැ. කළින් යනකොට සම්පූර්ණ නිරුවත් කරලා තමයි පරික්ෂා කරන්නේ. උසාවියෙන් නැවත රැගෙන ඇවිල්ලා, ආපහු නැවත නිරුවත් කරලා පරීක්ෂා කරලා තමයි රැගෙන යන්නේ. මේ අයට විතරයි එහෙම කරන්නේ හැමෝටම නෙවෙයි. නිල නොවන විදියට මේ අයව මානසිකව වට්ටන්න ඕන දෙයක් කරන්න බලධාරීන්ට අවසර ලැබිලා තියෙනවා. ඒකත් එක්තරා විදියක් ඝාතනයක් තමයි. ඒ නිසා 1983 සිට සමූහ ඝාතන සිදුවෙලා තියෙනවා. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත තුළින් ඒ සඳහා නිල නොවන විදියට අවසර හිමිවෙලා තියෙනවා. බිඳුණුවැව සිදුවීමේ දී ගමේ අය ගිහින් පහර දුන්නේ. එසේ පහර දෙන්න නිල නොවන අවසරයක් සාමාන්‍ය ජනයාටත් ලැබිලා තියෙනවා. පොලිසිය සහ නිළධාරීන් පමණක් නොවේ ගමේ අයට පවා ගිහින් සිරකරුවන්ට ගහන්න පුළුවන්, ප්‍රශ්නයක් නැහැ.

**ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන චෝදනා රහිතව දශක ගණන් සිරගත කොට ඇති සිරකරුවන් සිටිනවා. මේ පිළිබඳව සමාජය තුළ කතිකාවක් නොමැති තරම්. මේ පිළිබඳව ඔබගේ අදහස කුමක්ද?**

ප්‍රශ්න කිහිපයක් තියෙනවා. දේශපාලන සිරකරුවන් දේශපාලකයන් යොදාගන්නේ තමන්ගේ දේශපාලන ක්‍රීඩාවට. නමුත් මින් පීඩාවට පත් වූ ජනතාව මේ වෙනුවෙන් පාරට බැහැලා තියෙනවා. මේ සිරකරුවන් නිදහස් කිරීම කියන කාරණය ඒ ජනතාව මත පමණක් පැටවිය යුත්තක් නෙවෙයි. අපි වැනි සංවිධාන, සාමාන්‍ය ජනතාව සහ දේශපාලනඥයෝ කියන තුන්ගොල්ලම මේ වෙනුවෙන් එකතු වෙන්න ඕනේ. කිසිම තැනක මේ තුන්ගොල්ල එකතු වෙන්නේ නැහැ සහ එකතු වෙන්න දෙන්නෙත් නැහැ. අපි යාපනයේ පවා කිහිප වතාවක් උද්ඝෝෂණය කළා. අත්සන් එකතු කළා. එදා කවුරුත් ආවේ නැහැ අපි එක්ක පාරේ හිටගන්න.

ඊළඟට දේශපාලන සිරකරුවන් පිළිබඳව කතිකාවක් නැතිවෙන්න හේතුව දේශපාලන සිරකරුවන් විදියට ඉන්නේ කුඩා කණ්ඩායමක් වීම. මේ මොහොත වෙනකොට දෙමළ දේශපාලන සිරකරුවන් 46 දෙනායි ඉන්නේ. ඒ 46 දෙනා කියන්නේ විවිධ ගම්මානවල, විවිධ ප්‍රදේශවල හිටපු පිරිසක්. අපි උදාහරණයක් විදියට අතුරුදහන් කිරීම් ගත්තාම එකම ගම්මානයේ අඩු තරමේ 20-30ක් විතර බලහත්කාරී අතුරුදහන් කිරීමට ලක් වෙලා තියෙනවා. නමුත් දේශපාලන සිරකරුවන් ඒ විදියට හොයාගන්න බැහැ. ඒ නිසා මේ පිළිබඳව සාකච්ඡාවක් ඇතිවෙන්නේ නැහැ. ඊළඟ ප්‍රශ්නය තමයි ඒ හැමතැනම හමුදාව ඉන්නවා. දේශපාලන සිරකරුවන් ගැන කතා කිරීමම ඒ අය පෙනී සිටියා වූ දේශපාලනය ගැන සාකච්ජා කිරීමක්. එසේ සාකච්ජා කිරීම ආණ්ඩු විරෝධී වැඩක්. ඒ නිසා බොහෝ සංවිධාන මේ ගැන සාකච්ජා කිරීමටවත් එන්නේ නැහැ. මේ ගැන අපි වගේ පිරිසක් එක්ක සාකච්ජා වෙනවා මිසක් පහළ ගම් සමඟ මේක සාකච්ජා වෙන්නේ නැහැ. එකට හේතුව දේශපාලන සිරකරුවන් සමහර ගම්වල, ප්‍රදේශවල නැහැ. සමහරක් විට ගමටම එක්කෙනෙක්ට විතරක් මේක සීමා වෙලා තියෙනවා වෙන්න පුළුවන්. එතකොට මේ ගැන සාකච්ජා වෙන්න විදියකුත් නැහැ. අනිත් එක හමුදාව සහ දේශපාලන වුවමනා මත මේ ගැන සාකච්ජා වෙන්නේත් නැහැ.

**දේශපාලන සිරකරුවන් සමඟ ඔබ සෑහෙන කාලයක් තිස්සෙ ක්‍රියාකාරී ලෙස කටයුතු කරනවා. එම කටයුතු සමඟ ක්‍රියාකාරී වීම නිසා ඔබට තර්ජනාත්මක දේවල්වලට මුහුණ දෙන්න සිද්ධ වුණා ද?**

එල්.ටී.ටී.ඊ. කියලා තමයි අපිව නම් කරලා තියෙන්නෙ. එක්තරා කාලයක් අපි ගැන හොයන්න විශේෂ කමිටුවක් පවා පත් කළා. ඒ අය දුන්න වාර්තාව අනුව අපි, විශේෂයෙන් මම, සිවිල් සංවිධාන සහ වෘත්තිය සමිති රැස්වීම්වලට ගිහිල්ලා එල්.ටී.ටී.ඊ. සංවිධානය ප්‍රවර්ධනය කරන කෙනෙක් ලෙස තමයි නම් කරලා තියෙන්නේ. තවම මේ ප්‍රශ්න තියෙනවා. මම සිරකරුවන් බලන්න බන්ධනාගාරයට ගියාම, ගාඩ්ලා කියන්නේ "ආහ් ! එල්.ටී.ටී.ඊ. අය බලන්න නේ ආවේ" කියලා. මම කාවද බලන්න ආවේ කියලා නම් දෙන්න කලින් මාව අඳුරන නිසා ඔවුන් කියනවා එල්.ටී.ටී.ඊ. අය බලන්න ආවා නේද කියලා. මම උතුරු නැගෙනහිර කෙනෙක් නෙවෙයි. මම දකුණේ ඉන්නෙ. මම උපන්නේ කඳුකරයේ. කඳුකරයේ උපන්, කඳුකරය නියෝජනය කරන කෙනෙක් එල්.ටී.ටී.ඊ. කියලා



2012 ජූනි මාසයේදී වවුනියාව බන්ධනාගාරයේදී ප්‍රහාරයට ලක්ව මිය ගිය දෙමළ දේශපාලන සිරකරුවකු වූ දිල්රුක්ෂාන්ගේ අවමංගල්‍ය උත්සවය අමතමින්.

එකපාරම ඔවුන්ට දාගන්න බැහැ. මොකද අපි පෙනී සිටින්නේ දේශපාලන සිරකරුවන් සම්බන්ධයෙන් විතරක් නෙවෙයි. දකුණේ සහ කඳුකරයේ තියෙන සියලුම ප්‍රශ්නවලටත් අපි පෙනී ඉන්නවා. එතකොට එකපාරටම ලේබල් අලවන්න අමාරුයි. නමුත් තවමත් අලවන්න උත්සාහ කරනවා.

**වර්තමානයේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිදු කරන අත් අඩංගුවට ගැනීම් ආසාධාරණ බවට දකුණේ සමාජය හඬ නගනවා. නමුත් මේ පනත යටතේ දීර්ඝ කාලයක් දෙමළ, මුස්ලිම් ජනයා මර්දනයට ලක් වෙමින් සිටිනවා. මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?**

අපි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට විරුද්ධව දීර්ඝ කාලීනව කොළඹ සහ අනිකුත් නගරවල උද්ඝෝෂණ පවත්වලා තියෙනවා. ඒ උද්ඝෝෂණවලට සහභාගි වුණේ අපේ හිත මිතුරන්. අද මේ පනතට එරෙහිව හඬ නඟන කිසිදු සංවිධානයක් එදා සහභාගි වුණේ නැති බව කණගාටුවෙන් වුණත් කියන්න ඕනේ. දැන් පනතට එරෙහිව විරෝධතා පවත්වන බොහෝ අය දැරුවේ උතුරු නැගෙනහිර ඉන්නේ ත්‍රස්තවාදීන්, ඒ ත්‍රස්තවාදීන් මර්දනය කරන්න පුළුවන් මේ පනත තිබුණොත් විතරයි කියන මතය. දකුණේ සිංහල ජනතාවට එරෙහිව රාජ්‍ය විසින් පනත භාවිතා කරන්න ගත්තම පනත ගැන දකුණේ කතා කරනවා. නමුත් මේ විරෝධතා කරන අයගේ න්‍යාය පත්‍රය තුළ තවම උතුරේ ජනතාවගේ අරගල පිළිබඳව ඇතුළත් වෙන්නේ නැහැ. ඒ ගැන කොතැනකවත් සාකච්ඡා කරන්නෙත් නැහැ. මේ පනත හරහා උතුරේ තරුණ තරුණියන් ඝාතනය කළා, සංහාරය කළා. ඒ සංහාරයන් අනුමත කරපු බොහෝ අය දැන් දකුණේ විරෝධතා මෙහෙයවනවා. ඔවුනුත් මේ පනත හරහා තරුණ ජීවිත ඝාතනය කිරීමට හවුල් වුණා. දැන් ඔවුන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට විරෝධය දක්වන්නේ දකුණේ අත් අඩංගුවට ගත් තරුණයන් ගැන පමණක් සඳහන් කරමින් බව දකින්න පුළුවන්.

දැන් දකුණේ ආර්ථික ඝාතනය ගැන කතා කරනවා. ඒ ආර්ථික ප්‍රශ්නයේ මුල කොතැනද? ඒ ආර්ථික ප්‍රශ්නයේ මුල තියෙන්නේ ජාතික ප්‍රශ්නය. එතකොට මේ ජාතික ප්‍රශ්නයට විසඳුම් දෙන්නේ නැතිව රාජ්‍ය මොකද කළේ ? යුද්ධයට ආයුධ ගත්තා, හමුදා වැඩි කරගත්තා. එතකොට ඒ සඳහා ගිය වියදම්? ඒ වියදම් මුවාවෙන් කොල්ල කාපු ඒවා? මේකයි දකුණ මේ තත්වයට එන්න හේතු වුණේ. නමුත් මේ මොහොත වෙනකොටවත් මේ කාරණා ගැන කොතැනකවත් කතා කරන්නේ නැහැ.

**ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පිළිබඳව මාධ්‍යය විසින් විකෘති අදහස් සමාජ ගත කර තිබෙනවා. මේ ගැන ඔබගේ අදහස කුමක්ද ?**



දකුණට මේ මොහොත වන තෙක් කිසිදු වුවමනාවක් තිබුණේ නැහැ මේ පනත පිළිබඳව දකුණේ සමාජය දැනුවත් කරන්න. 'මේ පනත ගෙන ආවේ ත්‍රස්තවාදීන් මර්දනය කිරීමට, ත්‍රස්තවාදීන් ඉන්නෙ උතුරේ' කියන පින්තූරය තමයි දකුණට දීලා තියෙන්නේ. එතකොට තවම දකුණේ සමාජය උතුර දෙස බලන්නෙ ත්‍රස්තවාදීන් ලෙසයි. කුරුන්දූර්මලෙල ප්‍රදේශය ආරක්ෂා කරන්න ඕනේ කියන අය ත්‍රස්තවාදීන්. උතුරේ තමයි ත්‍රස්තවාදීන් ඉන්නේ. ත්‍රස්තවාදීන් කියන්නේ කවුද කියන එක හරියට නිර්වචනය කරලා නැහැ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත තුළ. ඒ වගේම පුනරුත්ථාපනය කරන්න යන්නේ මොන චෝදනා මතද කියන කාරණය දැන් ගෙන එන්නට නියමිත පුනරුත්ථාපන පනත තුළත් හරියට නිර්වචනය කරලා නැහැ.

දකුණේ මනස හදලා තියෙන්නෙම උතුරේ තමයි ත්‍රස්තවාදීන් ඉන්නේ කියලා. ඒ නිසා පෙරළා අපිට වගකීමක් තියෙනවා ත්‍රස්තවාදීන් කියලා කියන්නේ ජනතා ද්‍රෝහී දේශපාලන වැඩ කරන දේශපාලඥයන් බව කියන්න. ඒ මතය තමයි අපිට සමාජයේ ගොඩනගන්න තියෙන්නේ.

**මානව හිමිකම්වලට අදාළව ජාත්‍යන්තරව එල්ල වන බලපෑම් අවම කරගැනීමේ අරමුණින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය කිරීම පිළිබඳ සාකච්ඡා කලින් කලට රජය විසින් ගෙන එනවා. ඇත්තෙන්ම කළ යුත්තේ මෙම පනත සංශෝධන කිරීම ද?**

අපි නම් දීර්ඝ කාලීනව කියා සිටින්නේ මේ පනත සංශෝධනය කරන්න එපා, අහෝසි කරන්න කියලා. එකට හේතුව රාජ්‍ය ත්‍රස්තවාදය විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ

පනත යොදාගෙන තියෙන්නේ තමන්ගේ ත්‍රස්තවාදී ක්‍රියා වසා ගැනීම සඳහා. මේ පනත තුළින්ම මානව හිමිකම් උල්ලංඝනය කිරීමට ඉඩකඩ සළසලා තියෙනවා. එම නිසා මේ පනතට කිසිදු මානුෂික මුහුණුවරක් නැහැ. මේ පනත අමානුෂිකයි. ඉතින් මේ අමානුෂික පනත අහෝසි කළ යුතුයි. ඒ විතරක් නෙවෙයි මේ පනත ආරක්ෂා කරන අය තමයි ත්‍රස්තවාදීන්. පාර්ලිමේන්තුවේ ඉන්න මේ පනත අවුරුදු 43ක් තිස්සේ ආරක්ෂා කරපු සියලුම දෙනා ත්‍රස්තවාදීන් කියලා තමයි මම කියන්නෙ.

**ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කළහොත් ත්‍රස්තවාදී කණ්ඩායම් බිහි වීම සහ වර්ධනය වීම විය හැකි නිසා මෙම පනත අහෝසි නොකළ යුතු බවට මතයක් තියෙනවා. මේ පිළිබඳව ඔබගේ අදහස කුමක්ද?**

ත්‍රස්තවාදී කණ්ඩායම් කියලා අර්ථකථනය කරන්නේ කවුද ? ත්‍රස්තවාදීන් කියලා අර්ථකථනය කරන්නේ කොහොමද? උතුරේ තරුණ තරුණියන් නැගිට්ටේ තමන්ගේ දේශපාලනය නිසා, තමන්ගේ අයිතීන් නිසා, තමන්ගේ පොළව නිසා, තමන්ගේ අනාගතය වෙනුවෙන්. ඒ අය මතුකළ දේශපාලන ප්‍රශ්නවලට පිළිතුරු නොදී ඒ පිරිසව ත්‍රස්තවාදීන් කියලා නම් කළා. ඒ නිසා මේ කාරණය තුළ තියෙන ප්‍රශ්නය අවධාරණය වෙන්නේ නැහැ. ත්‍රස්තවාදීන් - ත්‍රස්තවාදීන් කියනවා මිසක් ඒ අය කොහොමද ත්‍රස්තවාදීන් වෙන්නෙ කියන කාරණය කතා වෙන්නේ නැහැ. ඒ නිසා මේ පනත ආරක්ෂා කරන අය තමයි ත්‍රස්තවාදීන්. මේ පනත තුළින් ත්‍රස්තවාදීන් නිර්මාණය කරනවා. මොකක්ද ත්‍රස්තවාදය කියන්නේ? සාමකාමී ජීවිතයට තර්ජනය කරනවා නම් ඒක ත්‍රස්තවාදය නෙවෙයිද? එතකොට මේ හමුදාව මොකද කළේ? මේ ආණ්ඩු මොකද කළේ? 1948 ඉඳන් මොනවද කළේ? ත්‍රස්තවාදී ක්‍රියාවන්. මේ පනත ගෙන්නේ 1979. 1979ට කලින් ඉඳන් ආණ්ඩු විසින් කළේ ත්‍රස්තවාදී ක්‍රියා. රාජ්‍ය ත්‍රස්තවාදය අනුමත කරන්න, රාජ්‍ය ත්‍රස්තවාදය ආරක්ෂා කරන්න තමයි මේ පනත ගෙන ආවේ. ඊට පස්සෙ තමන්ගේ අයිතිය වෙනුවෙන් පාරට බහින අයව ත්‍රස්තවාදීන් කියලා නම් කළා.

**සමාජයට අමතකව ගිය කොටසක් වුණු දේශපාලන සිරකරුවන්ගේ ඉරණම සම්බන්ධයෙන් දේශපාලනික පිළිතුරක් සෙවීම අවශ්‍ය ඇයි ?**

පළමුවෙන්ම අපි කතා කළා වගේ, මේ පනත ගෙන ආවේ දෙමළ ජනතාවගේ ප්‍රශ්නත් එක්ක. ඒ ප්‍රශ්නවලට තවමත් පිළිතුරක් නැහැ. දේශපාලන සිරකරුවන්ගේ ප්‍රශ්නය ඒ ඒ පුද්ගලයන්ගේ පුද්ගලික ප්‍රශ්නයක් නෙවෙයි. ඒක උතුරු නැගෙනහිර ජනයාගේ දීර්ඝ කාලීන ප්‍රශ්න අතරින් එක ප්‍රශ්නයක්. ඒක ජන සංහාරයත් එක්ක සම්බන්ධ ප්‍රශ්නයක්. ඒක ඉඩම් පිළිබඳ ප්‍රශ්නය එක්ක බැඳුණු ප්‍රශ්නයක්. ඒ නිසා ඒක දේශපාලන ප්‍රශ්නයක් ලෙස දකින්න ඕන ප්‍රශ්නයක් මිසක් හුදෙකලා මිනිස්සු 46 දෙනෙක්ගේ පුද්ගලික ප්‍රශ්නයක් නෙවෙයි. අර ප්‍රශ්න විසඳෙන කොට තමයි මේ ප්‍රශ්නයට මැදිවුණ මිනිස්සුන්ට සාධාරණයක් ලැබෙන්නේ. ඒ සාධාරණය කියන්නෙ අධිකරණය විසින් දෙන තීන්දුවක් නෙවෙයි. මේ අය පෙනී හිටපු කාරණයට සාධාරණයක් ඉටුවෙන්නේ අර ප්‍රශ්නවලට සාධාරණයක් ඉටු කිරීමෙන්. ඒ නිසා තමයි මේක දේශපාලනික ප්‍රශ්නයක් වෙන්නේ.



# සහෘදය

## උන් නොදනිති

ඊයේ අයෙක් මියැදුණි;
ඒ
මම වත් උඹ වත් නොවේ.
අද අයෙක් මියැදුණි;
ඒ
මම වත් උඹ වත් නොවේ.
හෙට අයෙක් මියැදුණොත්;
ඒ
මම හෝ උඹ.
ඒකාන්තයෙන්
අපි දෙන්නගෙන් කෙනෙක් සහෝදරයා!

අළුයම
වැඩි වැඩියෙන්
සන්නද්ධ රථ
සැරිසරන විට
ගම් දොරකඩ
වසා දමාවි.

ඒ මොහොතේ
එක්කෝ මම එක්කෝ උඹ
නොවැරදීම අත් අඩංගුවට ගනීවි.
ඒ නැත්නම්,
වෙඩි තබා මරා දාවි.
මාත් උඹත් මිනිසුන් වග
උන් නොදනිති.

අපි
මිනිසුන් නොවේ'යි
උහු සිතති

දුෂ්යන්තන් (1984)
පරිවර්තනය - සංජුලා පීටර්ස්

## අලුත් සපත්තුව යට

එක එල්ලයේ දිවෙන
කළු තාර පාර දිග
ඇවිද යමි
උසට උස
නෙත් මානයේ දිග හැරුණු
කළු අඳුරු ලන්දේසි කොටු පවුරු
මුළුගැන්ව,
මුතුන් මිත්තන් එදා බියට පත් කළ පෝරකය
පැහැදිලිව මට පෙනිණ.

විසුළ තණ මත
දරා ගිනි අවි, කාකි විරුවන්...
රාජ්‍ය යන්ත්‍රය රකින මෙවලම්
ඔට්ටු වෙයි
ඇවැසි ඕනෑ විටෙක
නිපුණ බව පෙන්වන්ට

ඔවුහු පෙළ ගැසී පෙළපාලියේ
ඇවිද යති
දැවටෙනා සුළඟේ වුව භීෂණය
මුසුව එයි

ගෙවුණු මුත් තුන්සිය වසක්
වෙනස් වූයේ
කුමක් දැයි කිව හැකි ද?

බස ය

පෑය ය

අපි තවම පෑගෙමුය!

අ. යේසුරාසා
පරිවර්තනය - නිලාර් එන්.කාසිම්

## සාගින්න

දැවෙන ගින්නක
දේහය දවමින්
සුසුමින් විසල් සිහිනයක් ලියූ
එක් කුරුල්ලෙක්
නොනිමි පවසෙන් අයාලේ යයි

එක් දිය බිඳුවක සැඟවූ
පිළිකෙවි බිල්ලක්
යාග ගින්නේ ගිලී යයි

හැකිළී නොගිය ස්වරයක්
රැළි අතර දිය වූ එළියක්
නිදි නැති දෙනයනේ සුවිසල් ගින්නක්
අවසන් සිනහවේ
බිඳී ගියේ අශෝක චක්‍රය

මහත් කුළකට පවා
නිවාලිය නොහී ගින්නක්
තවමත් දරා සිටින
ඔහු වෙනුවෙන්
දිනක
එසවෙයි ස්මාරකයක්
හිඳීවී පක්ෂියෙක්
පිරී යාවී පුෂ්පයන්

නිවාලයි ඔහුගේ සාගින්න..

දීපචෙල්වන්
පරිවර්තනය - ශිවලෝගේශ්වරී

## මරණයේ අස්වැන්න

අර්ධද්වීපයේ දැන්
දැවී යන ග්‍රීෂ්මය!

අලිමංකඩ ලුණු ලේවායේ
ලුණු අට්ටි
පළිඟු කළු!
ඉතිහාසය නොදුටු
මරණයේ අස්වැන්න!
මරණයේ අස්වැන්න!!

අයියෝ
තානායම
නුඹ
වධකාගාරයක් වූවා නොවෙද!

නිය හරහා
දිග කටු ගහයි
මහා පොලුවලින්
යටිපතුල් පලයි
ඇඟිලි ගැට ගසා තදකර
උඩුයටිකුරුව එල්ලයි
මිරිස් දුම් තුළ
හුස්ම ගැනුමට සළසයි.

අයියෝ
තානායම
නුඹ
වධකාගාරයක් වූවා නොවෙද!

ලිඟු සිදුරට
සියුම් සැත් දමයි

වේදනාවෙන් විලාප දී හති වැටී
තිබහට
වතුර ඉල්ලුවොත්
වමනය ගෙන
බඩ කට තුවාල කරමින්
මූදු වතුර පොවයි!

නුඹ තවම
තානායමැ'යි සිතා
කවුරු හෝ ඒවිද?
කෑ ගැසීම් මොරදීම්
සියලු දේ
සුළඟට එකතු වී
මුහුදෙන් එහා ඇසෙයි!

පීඩනය පුපුරු ගසමින්
පිටාරා යයි!

ගල්ෆ් යුද්ධයේ
හැම තෙල් ළිඳක්ම
ගිනි ගෙන දැවෙයි!

ඊශ්‍රායලය
පලස්තීනය ගිලිමින්
හුස්ම ගත නොහී
උගුර හිර වී ගොරවයි!

සුද්දන්ගේ උමතු පාලනයෙන්
අඳුරු වූ මහද්වීපයෙන්
මතුවන ශෝකී හඬ
සුළඟේ පාවී මුහුද හරහා ඇසෙයි!

අයියෝ
තානායම
නුඹ
වධකාගාරයක් වූවා නොවෙද!

ත. ඉරාමලිංගම් (1983)
පරිවර්තනය කනගසූරියර් ප්‍රදීප්

## මේ මොහොතේ ජීවත් වෙයන්

යසෝදරා!
මේ මොහොතේ ජීවත් වෙයන්

ගෙම්දුල;
දිගහැරි පැදුරේ බිරිඳ අස
උඩුබැල්ලට වැතිර
හිතන්නේ මොනවද?

මන්දාකිණියේ තරු දිලේ,
දඟකාර බැල්මත් සුරතල් සිනාවත්
රැව් දේ,
දහසක් සිතුවිලි
මග දෙපස මල් වී
පිපී වැහෙනවද ?

ජීවත් වෙයන්
කල්පිත ලොවක හෝ
ජීවත් වෙයන්

මරණය -
සොරෙක් මෙන් ඒවි'
නුඹට
තුවක්කුවෙනුත්
වධ පමුණුවන්නට
ඉන් තීන්දුයි.

බලාගෙන!
මැදියමේ
සපත්තු හඬින්
නුඹේ ගෙදර
පහන් එළියත් වෙව්ලයි.

නුඹව ඇදගෙන යයි
ළමයි මොර දෙයි
බිරිඳ බියෙන් ගල් වෙයි
නුඹව ඇදගෙන යයි

ඒ මොහොතේ
තුවක්කුවක් ගත් කෙනෙක් තීන්දු කළොත්
බිරිඳවත්
ඇදගෙන යයි

මෙහෙම තමයි
එක දවල් වරුවක
නුඹේ සගයායි බිරිඳයි
ඇදගෙන ගියේ

ඉක්බිති....?
වධකාගාර කුටි
එනතුරු

දැනටමත් ලියා ඇති
පාපොච්චාරණ ලිපිය
අත්සන් නොකර බැරිය.

නැත්නම්
'එස්ලෝන්' බටයයි
කකුල් දෙකෙන් එල්ලීමයි
ගෝනිය හරහා මිරිස් කුඩු දුම
අධෝමුඛයට ඔබන
යකඩ බටයයි
කා වෙනුවෙන් ද...?
මේ හැමදේම
නුඹේ පාපොච්චාරණයෙන්
කට්ට කැඩුණු තරාදියේ
කිරා
තීන්දු කළ ඉලක්කයට
නුඹව දක්කන් යාවි

ඒ නිසා යසෝදරා
නුඹ
මේ මොහොතේ ම ජීවත් වෙයන්

මො. පුෂ්පරාජන් (1983)
පරිවර්තනය - කනගසූරියර් ප්‍රදීප්




කුරිංජි - 04

# අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කළ වතුකරයේ විරුවන් වෙනුවෙන් ලියැවුණ ගී

කැනඩාවේ පළ වන තායිවීඩු මාසික සඟරාවට **මල්ලියපූසන්දි තිලකර්** විසින් වතුකර පද්‍ය සාහිත්‍යයෙහි ගමන් මඟ යන ශීර්ෂ පාඨය යටතේ සම්පාදනය කරනු ලබන ලිපි මාලාවෙහි පස් වන කොටසෙහි සිංහල පරිවර්තනය (නොවැම්බර් කලාප 2020)

පරිවර්තනය - **ජෙගන් ගනේෂන්**

ලංකාව නිදහස ලැබූ සමයේ සිටි සමකාලීන කවීන් වූ සී.වී. වේලුපිල්ලෙ, තලාතුඔය කේ.ගනේෂන් වැනි අය ඉංග්‍රීසි භාෂාව සහ නවීනත්වය උපයෝගී කරගත්ත ද එය ජනප්‍රියත්වයට පත් වූයේ නැත. ඊට අවශ්‍ය අධ්‍යාපන මට්ටම් වතුකරයට ළඟා වී නො තිබුණි. ඒ වනවිට නිදහස් අධ්‍යාපනය හඳුන්වා දී තිබුණ ද, වතුකරයේ ජීවත් වූ දෙමළ ජනයා ඊට හිමිකම් කීවේ නැත. එම ජනයාව තවදුරටත් වතු පාසල් ක්‍රමය තුළ ම සිර කර තිබුණි.

මීනාච්චියම්මාල් නඩේසයියර් යන අය ආරම්භ කළ 'තෝට්ටපුර පාඩල්' (වතු ආශ්‍රිත ගීත) කවි සංස්කෘතිය වර්තමානය දක්වා වතුකරයේ පවතින ආකාරය දැකගත හැකිය. වතුකර (මුට් සන්දි ඉලක්කියම්) තුන් වැදෑරුම් සාහිත්‍යයක් ලෙස වැජඹුණ ගීත සම්ප්‍රදාය වතුකර පද්‍ය සාහිත්‍ය විකාශනයේ වැදගත් කාල පරාසයක් ලෙස හැඳින්වේ. අද දක්වා පවතින එම සංස්කෘතියේ ස්වර්ණමය යුගය ලෙස 1950 සිට 1970 දක්වා වන විසි වසරක කාලය හඳුන්වා දිය හැක. එම කාලයේ දී සුප්‍රසිද්ධව සිටි සංගීත විද්වතුන් කිහිප දෙනෙක් ද හඳුනාගත හැක.

වතුකර මුට්සන්දි (තුන් මං හන්දිය) සාහිත්‍ය නමැති ශිර්ෂය යටතේ, 'පරදේසම් පෝන තමිලර්ගලින් පරිදාපප් පාඩල්ගල්' (පිට දේශයකට ගිය අසරණ දෙමළුන්ගේ ගීත) යන කෘතිය ගායකයන් 12 දෙනෙකුගේ ගීත 15 ක් සහිත ග්‍රන්ථයක් ලෙස 2016 වසරේ දී මුද්‍රණය කරන ලදී. වේල්සාමිදාසන් විසින් එකතු කර, පුවත්පත් කලාවේදියෙක් වූ ක.ප. සිවම් වෙත ලබා දී තිබූ එවැනි ගායකයන්ගේ ගීත අතරින් තෝරා ගත් ගීත ඇතුළත් ගීත පොත්, ඇන්ටනි ජීවාගේ සහාය ඇති ව සමාජ ක්‍රියාකාරී පේ. මුත්තුලිංගම් විසින් සංස්කරණය කරන ලදී. වසර අනුපිළිවෙලට ගීත පෙළ ගස්වා නොතිබුණ ද, එම ගීතවල වස්තු විෂය හරහා එම ගීත අයත් කාල සීමා තක්සේරු කළ හැක. 1952 වසරේ 'තොළිලාර් ගීතම්' (කම්කරු ගීතය) නමැති ශිර්ෂ පාඨය යටතේ එම්.වී. පළනියාණ්ඩි විසින් ගායනා කළ ගීත එකතුව එකල කම්කරු නායක කේ. රාජලිංගම්ට පිළිගන්වා එහි පිටකවරයේ ඔහුගේ ඡායාරූපයක් මුද්‍රණය කර ඇත. එය මුද්‍රණය කරන ලද්දේ කොළඹ නවජීවන් මුද්‍රණාලයේ ය.

නුවර - නුවරඑළිය දිස්ත්‍රික් සීමාවේ පිහිටා ඇති පුස්සැල්ලාව ප්‍රදේශයේ පිහිටා ඇති කන්තලා වතුයායේ (Stellenberg) හි පදිංචිකරුවෙක් වූ එම්.වී. පළනියාණ්ඩි එකල ලංකා - ඉන්දීය කොංග්‍රසයේ දිස්ත්‍රික් සමුළුවේ සමාජිකයෙක් ව සිටියේ ය. වතුකම්කරුවෙක් වූ ඔහුගේ ගීතවල මීනාච්චියම්මාල්ගේ ගීතවල ආභාෂය පැහැදිලිව දැකගත හැකිය.

**දකුණු ලක කරන ආණ්ඩු**
**කරන හැම කුමන්ත්‍රණ**
**රට පුරා රැව් දෙයි**
**පළනිගේ දෙමළ ගීයකින්**

යන ගීතයේ මීනාච්චියම්මල්ගේ 'සිංහල මන්ත්‍රීවරුන් කළ කුමන්ත්‍රණ...' කවියෙහි ආභාෂය දැකිය හැක. රජයට විරුද්ධව ලියා ඇති මෙම ගීතවල එකල එක්සත් ජාතික පක්ෂය සහ වතුකම්කරුවන්ගේ පුරවැසිබාවය අහිමි කිරීම හෙළා දකින ආකාරය දැකගත හැක.

**වසර ගණනක්**
**ලංකාව විශ්වාස කරමින්**
**ජීවත් වූ**
**ඉන්දියානුවන් වන අපට**
**ඉල්ලන අයිතිය**
**දීමට හිතක් නැති**
**ලැජ්ජා නැති රජයක් කුමට**

**කියූ වදනට පිටුපාන රාජ්‍ය**
**සංවර්ධිත වී කුමට**
**තම යහපත වෙනුවෙන් ජීවත් වන**
**ලංකා රජය**
**වෙල්ලසාමි සකසන පන්දමකි**
**යූ.එන්.පී රජය**

**ලොවෙහි ප්‍රශංසා ලබමින්**
**ලංකාව පාලනය කරමු**
**මෙම ගර්වය කුමකට ද**
**ලංකාව සශ්‍රීකත්වයට පත් කළ**
**ඉන්දියානුවන්ට**
**වෙනස් කිරීමට ?**

යනුවෙන් ඡන්ද අයිතිය අහිමි කිරීම සම්බන්ධයෙන් ප්‍රශ්න කරමින්, එක්සත් ජාතික පක්ෂයේ ක්‍රියාකාරීත්ව හෙළා දකියි.

**ලංකාවේ ජීවත් වන**
**ඉන්දීය දෙමළුන්ට**
**අයිතියක් නැති ලු**
**උන්ගෙන් කරදර ලු**
**ලංකාව මව් බිම යැයි**
**සේවය කළේ**
**මෙරටේ අයිතිය ලබා දෙනු**
**බැහැයි කීම**
**යුක්තිය ද**

**ලාංකිකයන් යැයි නීතිය ඇති විය**
**ඉන්දියානුවන්ගේ ඡන්ද අයිතිය නැති විය**
**මොන රටකවත් මෙවැනි අකටයුතුකම් නැත**
**මින් විඳිනවා බොහෝ කරදර**

**මෙරට සරු කළේ ඉන්දියානුවන්**
**අයිතිය දීම ඉවත ලන්නේ මන්ද**
**දෙවියන්ටත් පිළිගත හැකි ද එය**

යනුවෙන් රජයේ විවේචනය කරමින් වතු සේවකයෙක් වූ පළනියාණ්ඩි ගී ගයයි. තම නායකයා වූ කේ. රාජරත්තිනම් කෙරෙහි විශ්වාසය තබා සිටින ඔහු ආත්ම විශ්වාසය සහ සටන්කාමී ගුණයත් සමග තම ස්ථාවරය නිරූපණය කරයි.

**කරුණා හදැති**
**කම්කරු නායක පින්වත් රාජලිංගම්**
**ප්‍රාන්තයක් පසසන ජෝදිලිංගම්***
**මිනිසුන් අතර මිනිසා'යි**
**ප්‍රශංසා ලබන**
**ඉන්දියානුවෙන් වෙනුවෙන්**
**දිවිය කැප කළ ඔහු**

**ලංකාවේ වෙසෙන**
**ඉන්දීය ජනයාගේ**
**දුක තුනී කිරීමට**
**දිවා රෑ නොතකා සේවය කරන දැවැන්තයා**
**කප්පරක් ගැටළු හමුවේ**
**ජීවිතය කැප කරමින්**
**අයිතිවාසිකම් දිනා දීමට**
**සටන් කරනා වීරයා**

**භාරත මාතාව වැදූ**
**අප වීර සිංහයා**
**අවංකව අපට මඟ පෙන්වන**
**රාජලිංගම් මහත්තයා**

ජෝදිලිංගම්* - ශිව දෙවියන් ව හඳුන්වන නමකි

යනුවෙන් එම කාල සීමාවේ ලංකා - ඉන්දියා කොංග්‍රස් නායක කේ.රාජලිංගම්ගේ සටන්කාමීකත්වය සම්බන්ධයෙන් ගයා ඇත. ඔහු එකල ලංකාවේ පළමු පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කරමින් සිටියදී, පුරවැසි භාවය අහිමි කිරීම හේතුවෙන් දේශපාලන අයිතිය අහිමි වූ අයෙකි. එමෙන් ම ලංකා - ඉන්දියා කොංග්‍රස් හි සේවක සංගමයේ නායකත්වය දරමින් එය ලංකා කම්කරු කොංග්‍රසය යනුවෙන් වෙනස් කළ නායකයා වන්නේ ද ඔහු ය. මොහු ද පුස්සැල්ලාව ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වීම හේතුවෙන් පාවලර් පළනියාණ්ඩි ඔහු කෙරෙහි අසීමිත විශ්වාසයක් තබා ඇති අයුරු ගීතයෙන් නිරූපණය වෙයි.

**එකමුතු වූවොත් එක්ව කෑම ගන්නැයි**
**පැවසුවා භාරදී**
**එකමුතුකම නැතියෙන් පහත් වෙයි**
**හොඳින් සිතන්න**
**සීමාවන්ට යටත් වන්න**
**දිනපතා ජයග්‍රහණ පමණයි**

යනුවෙන් ජයග්‍රාහී සිහින සමඟින් සිටින පාවලර් එම්.වී. පළනියාණ්ඩි ඉතිහාස ගත වෙයි. වී.එස් ගෝවින්ද සාමි තේවර් සහ




වසරේ දී 'ප්‍රජා උරිමයි කුරල්' (පුරවැසි අයිතියේ හඬ) නමින් ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කළහ.

තාවකාලික පදිංචි වීසා මාර්ගයෙන් ලංකාවට පැමිණ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු කොංග්‍රසය යන කම්කරු සංගමයෙහි කටයුතු කළ, වී.එස්. ගෝවින්දසාමි තේවර් තම මිත්‍රයෙක් වූ ඒ.එම්. රාමයියා තේවර් සමඟ එක් වී වේදිකාවල ගීත ගායනා කළේය.

වතු කැලෑවල වැඩ කරන
කම්කරු ජනයාට
ඡන්ද, පුරවැසි අයිතිය නැති ලු
අයිතීන් ඉල්ලුවොත්
ජනයාට කරදර ලු

යනුවෙන් ආරම්භ වන ගීතය කුරුම්බා* ආකෘතියෙන් සහ ක්‍රියාකාරීත්වයන්ගෙන් සමන්විත පුරාණ කාව්‍යයක් ලෙස රචනා කර ඇත. ඔවුන් ලංකාවට පැමිණි ශෝක කතාවත් මෙහි දී විඳි දුකත් එහි අන්තර්ගත කර තිබේ.

කුරුම්බා* - Limerick ආකෘතිය

කැලෑ කඳුවල කාණු කපා
දුව පැන මුල්ලු දමා
සොයා රැකියා කළත්
කුස නැත පිරුණේ
තව ද ඡන්ද පුරවැසිබව නැත ලැබුණේ

මෙපමණ කාලයක්
කොඳු කැඩෙන දුක් විඳ
ලංකාවේ ඉන්න ඉඩක් නැතිලු
ඔබ ඉන්දියාවට යන්නැයි
කරදර ලු

මෙලෙස ගී ගයනා ඔවුහු දෙපළ ඉන්දියානු අග්‍රාමාත්‍ය ජවහර්ලාල් නේරු කෙරෙහි විශ්වාසය තබා ඇති ආකාරයත් ඔවුන්ගේ ගීතවලින් දැකගත හැකිය.

අවසානය දක්වා
දුක්විඳින ඉන්දීය ජනයා
ධෛර්යමත් සිංහයෙක් වන
නේරුගේ කීම විශ්වාස කරමු
ජවහර් යන්නැයි අණ කළොත් පිටත් වෙමු

මෙම විශ්වාසය ඉන්දියා අග්‍රාමාත්‍ය ජවහර්ලාල් නේරු කෙරෙහි පමණක් තබා තිබූ විශ්වාසයක් යැයි කිව නොහැක. එය සමස්ථ ඉන්දියාව කෙරෙහි තබා තිබූ විශ්වාසයයි.

කෙසේ වෙතත් මෙම දෙපළ කඳුකර දෙමළ ජනයා ජයගන්නා බව විශ්වාසය ඇති කරවන පද පේළිය මෙයයි.

ජය පැන් බොන පාණ්ඩ්‍ය දේශය
සීලන් රාමයියාගේ
දෙමළ සිසුවා ගෝවින්දන්
ගයමි
ලෝකය අපට අයිති යැයි

ලංකාවේ පුරවැසිබාවය අහිමි කිරීමට විරුද්ධව ගීත ගයන මෙම දෙපළ සමස්ථ ලෝකයම තමන්ට අයිති යැයි පවසති. එය කලාකරුවන් සතු අනන්‍යතාවයක් යැයි පැවසිය හැකිය.

තවත් අවස්ථාවක ද්විත්ව ගීත රචනා කරන මෙම දෙපළ මෙලෙස ගායනා කර ඇත.

ඡන්ද පුරවැසි අයිතිය නැත
දිව පල
උඹලාගේ සේවයට දුන්නා වැටුප්
රට අතැර පල
කඩදාසියක ලියා අවසන්
දුප්පතුන් විඳි දුක දුටුවේ නැහැ නේ
...
උගත් දෑ මදක් සිතන්න
දුක් පීඩා නිවා දමා
පුරවැසියන් කරන්න - මෙහි

ඡන්ද අයිතිය නැතැයි
නොකියන්න -
අපි ගියොත් ලංකාවම
කැලයක් වනු ඇත
....
දකුණු ලංකාවේ පස් පැගුවෙමු
රන් බවට පත් වුණා - අද
ඡන්ද අයිතිය නොමැති නම් සියල්ල
විනාශ වී ගියා

කම්කරු ජනයාගේ
විඳින දුක බලන්න - ටිකක්
බෙදා බලා පිළිගෙන
අයිතිය ලබා දෙන්න

දෙමළ වර්ණවත් අහස පුරා රාමයියා
තමිල් කවි ගයනා
ගෝවින්ද සාමි තමිල් පුතු

යනුවෙන් තම ඉල්ලීම් ඉදිරිපත් කරයි. තවත් අවස්ථාවක දී,

වතුවල දිවි ගෙවන
කම්කරු ජනයාගේ
ඡන්ද අයිති නැති විය
දිනෙන් දින නීතිය දැඩි විය
නව දිල්ලි ගිවිසුම අපතේ ගියා
භූමිය පාලනය කළ
රජවරුන්ගේ පැසසුම් ලත් ලක් පුර
මන්ත්‍රීවරුන්ගේ කතා - දේශපාලන
කුමන්ත්‍රණයක් විය

වතුකර තුන් වැදෑරුම් සාහිත්‍යයට අයත් වන තවත් වැදගත් ගීතයක් ලෙස 'කට්චි පෝරාට්ට කුරල්' (පක්ෂ අරගල හඬ) හඳුන්වා දිය හැකිය. මෙම ගීතය ගයා සංස්කරණය කරනු ලැබුවේ පාවලර් එස්.එම්. රාජප්පා ය. වතුකර දේශපාලන පක්ෂ අතර ඇති වූ ගැටුම් සම්බන්ධයෙන් සහ අරගලවල දී මිය ගිය වතුකම්කරුවන් සම්බන්ධයෙන් මෙම ගායනා කර තිබීම විශේෂත්වයකි.

'කට්චි පෝරාට්ට කුරල්' දෙවන කොටසට ඝාතනයට ලක් වූ 12 දෙනෙකු සම්බන්ධයෙන් ගීත ඇතුළත් කර තිබේ. ඒ අනුව ක්ලෝසියානු කාව්‍ය සම්ප්‍රදාය (ක්‍රි.පු පළමු වන සහස්‍රයේ පැවැති සාහිත්‍ය, සංස්කෘතික සම්ප්‍රදාය) වතුකර තුන් වැදෑරුම් සාහිත්‍යයට රැගෙන ඒමට එස්.එම් රාජප්පා සමත් වී ඇති. 1950 දශකයේ දී ඔහු මෙම ගීත ගායනා කළ ද, මෙහි දෙවන කොටසේ ඇතුළත් ගීත පමණක් මෙම කෘතියට එක් කර ඇත.

**අයියේ... අයියේ.. කීවොත් තේරුම් ගත හැකි ද යනුවෙන් ආරම්භ ගීතයේ,**
**'කොංග්‍රස් පක්ෂය දෙකඩ වූවහොත්**
**කලබලයක් ඇති වේවි**
**කොමියුනිට්ස් පක්ෂ යැ යි කිවහොතින්**
**ගල් පවා දිය වේවි...'**

යන පැදියෙන් ලංකා කම්කරු කොංග්‍රසය දෙකඩ වීම සම්බන්ධයෙන් සාකච්ඡා කර තිබේ. මෙම ගීතය හරහා 1956 වසරේ දී සෞම්‍යමූර්ති තොණ්ඩමාන්ගේ නායකත්වය සමඟ ඇති වූ මතභේදය හේතුවෙන්, අබ්දුල් අසීස් විසින් ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු කොංග්‍රසය නැමති පක්ෂයක් පිහිටුවා ගැනීම නිසා කෝලාහල ඇති වූ බව දක්වයි.
එමෙන් ම වතුකරයේ කොමියුනිට්ස් පක්ෂවල හිමි ව තිබූ පක්ෂපාතීත්වය සම්බන්ධයෙන් එම පදවලින් අවධාරණය කරනු ලබයි.

**බල බෙදීමට එකඟ පක්ෂයක්**
**භාෂාවට වැඩි සැලකිල්ලක් ඉල්ලයි**
**සමසමාජ පක්ෂයක්**
**සම අයිතිවාසිකම් ඉල්ලයි**

යන පදවලින් ලංකාවේ තවත් වැදගත් දේශපාලන සංසිද්ධියක් ඉස්මතු කරයි. ආරම්භයේ දී බලය බෙදීමට පක්ෂව කටයුතු කළ එස්.ඩබ්ලියු.ආර්.ඩී බණ්ඩාරනායක පසුකාලීනව ඉදිරිපත් කළ සිංහල පමණක් පනතට විරුද්ධ වෙමින් ලංකා සමසමාජ පක්ෂ සම අයිතිවාසිකම් ලබා දෙන ලෙසට සිදු කළ ඉල්ලීම ද මෙම ගීතයේ දක්වා ඇත. ඒ අනුව මෙම ගීතය ලංකාවේ සිංහල පමණක් පනත සම්මත කළ 1956 වසරේ දී ගායනා කළ බවට පැහැදිලි වේ.

**තමිලරසු පක්ෂයේ**
**බලය අඩු වෙමින් තිබේ**
**ද්‍රාවිඩ පක්ෂය**
**නැඟ එමින් තිබේ.**

යන පදවලින් තමිල්අරසු පක්ෂයේ ඇති වූ බෙදීම් සහ එම කාල සීමාවේ දී තමිල්නාඩුවේ තිබූ ද්‍රාවිඩ පක්ෂයේ වර්ධනයත් සමඟ මෙරට දේශපාලනයට ඇති වූ බලපෑම් සම්බන්ධයෙන් දක්වා ඇත.
වතුකරයේ විරුවන් සම්බන්ධයෙන් එස්.එම්. රාජප්පා ලියා ඇති ගීතවලට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. පක්ෂ අතර තිබූ ගැටුම් සම්බන්ධයෙන් ගී ගයනා ඔහු, කම්කරු වෘත්තිය සමිති අරගලවල දී මිය ගිය විරුවන් ද සිහිපත් කරයි.
මක්කගෙල පෙට්ට මගරාසී නමැති දෙමළ චිත්‍රපටියේ 'මනප්පාරෙ මාඩු කට්ටි' යන ගීතයට යොදා ඇති තනුව භාවිතා කරගනිමින් එම ගීතය ලියා ඇත.

**එපා පක්ෂ අතර භේද, නොමනා ලෙස බිඳෙයි ඔළු**
**දෙවියන් අපට හොඳ සිහිබුද්ධියක් සිංගමුත්තු දී ඇත - නිවැරදිව**
**පිහිටා ඇති අවස්ථාවක විකාර හංගමුත්තු**

**මුල්ලෝයා ගෝවින්දනුත් කල්තෝණි වෙල්ලයනුත්**
**ඩයගම ඒබ්‍රාහම් සිංගුම් වෙංගමුත්තු**
**කොටියාගොල ෆ්‍රැන්සිස් මහත්තයාත් කොහෙද මුත්තු?**

**මලුගොල්ල ආදියප්පනුත් සෙංගදිරගෙ සන්දනමුත්**
**පණියපත්තන වයිත්තියලිංගමුත් සාක්කපති - තවත්**
**බොහෝ උදවිය පක්ෂයෙන් මිය බව කිව්වොත් මොනවා වේවි ද**

පාවලර් රාජප්පා විසින් ලියා ඇති මෙම පද්‍ය පන්තියෙන් වතු වෘත්තිය සමිති ක්‍රියාමාර්ගවල දී ජීවිත පරිත්‍යාග කළ විරුවන් සහ ඔවුන් ජීවත් වූ වතු ප්‍රදේශවලට කඳුකර දේශපාලන ඉතිහාස අධ්‍යනය තුළ සුවිශේෂ ස්ථානයක් වෙන් කළ යුතුය.

1940 වසරේ දී වැටුප් ඉහළ දමන ලෙස ඉල්ලමින් සිදු කළ වැඩවර්ජනයේ දී, පොලිස් වෙඩි පහරින් මුල්ලෝයා ගෝවින්දන් මිය ගියේ ය. කල්තෝණි වතු යායේ (මීරියාගොඩ) වැඩ වර්ජනය සමඟ ඇති වූ නොසන්සුන්කාරී තත්ත්වයේ දී වතු මුරකරුගේ වෙඩි පහරින් තුවාල ලැබූ වතුකම්කරුවන් 17 දෙනා සහ ඉන් ජීවිතක්ෂයට පත් බී. වෙල්ලයන්, 1956 වෘත්තිය සමිති ඉල්ලීම් වෙනුවෙන් හඬ නගා පොලිස් නිලධාරීන්ගේ වෙඩි පහරින් ඩයගම ප්‍රදේශයේ දී මිය ගිය 23 හැවිරිදි තරුණයෙකු වන ඒබ්‍රාහම් සිංඤෝ, 1958 වසරේ ශ්‍රී විරෝධතාවය සමඟ ඇති වූ දෙමළ විරෝධී ප්‍රචණ්ඩත්වයේ දී ඝාතනයට ලක් වූ 21 හැවිරිදි බොගවන්තලාව - කොටියාගොල ෆ්‍රැන්සිස්, 23 හැවිරිදි අය්යාවු යන අයගේ මරණ සම්බන්ධයෙන් ද ඔහු සිය ගීතයේ ලියා ඇත.




මඩුල්ගල වතු යායේ සිටි ආදියප්පන්, සෙංකදිරෙ සන්දානම් වැනි අයගේ මරණ සම්බන්ධයෙන් ද, පණිය පත්තන (ඩෙවන්) නමැති වතු යායේ පක්ෂ ගැටුමකින් මිය ගිය වෛත්තිලිංගම් ගැන ද ලියා තිබේ.

මන්ත්‍රීවරයෙකු වෛත්තිලිංගම් ගේ ඝාතනය පිටුපස ඇතැයි එම ප්‍රදේශයේ කටකතාවක් ද පවතියි.

මෙලෙස විවිධ ප්‍රදේශවල සිදු වූ ඝාතන සටහන් කරනු වස් මොහුගේ 'කොලසෛින්දු' ගීතවල 'හැටන් නගරයේ කොටියාගොල්ලගෙ ප්‍රදේශයේ බොගවානෙ තොංගපත්තිනි වතුයාය, සෙණ්ණන් පූසාරි ඝාතනය' යන ශීර්ෂය යටතේ ඔහු ගී ලියා ඇත.

**තොණ්ඩමාන් අසීසු**
**පක්ෂ දෙකේ මතභේදය**
**තොංගප්පත්තිනි වතු යායේ හාමු හාමු**
**කෝලහාලයෙන් මිය යාම මුසාවක්ද මුසාවක්ද**

**එකදාස් නවසීය**
**පනස් නවය වර්ෂයේ**
**ඉංග්‍රීසි ජනවාරියේ කිව්වෙම් කිව්වෙම්**
**බරපතල පහර කෑමෙන්**
**කැපුම්වල මිය ගියේ සෙණ්ණන් සෙණ්ණන්**

1959 වසරේ දී මෙම ගීතය රචනා වී ඇති බවට එහි දක්වා ඇත. එම කාලයේ පැවැති වතුකර දේශපාලනය එහි සන්දර්භය වී තිබේ. මිය ගිය සෙණ්ණන් පූසාරිගේ බිරිඳගේ අඳෝනාව ද ඔහු සිය ගීතයක ලියා ඇත.

**පක්ෂය දෙකඩ විය**
**සැමියාගේ ප්‍රාණය අහිමි විය**
**ගෙලෙහි තැල්ල ඉල්ලයි.... ඉවතලන්න**
**මෙය අසීරු කාලයක් ම විය**

යනුවෙන් එම ගීතයට ආරම්භ වෙයි.

මෙලෙස හැටන් **ජිල්ලා*** (ඉන්දීය දෙමළ භාෂාව එලෙසම භාවිත කර ඇති ආකාරය දැකගත හැක) දික්ඔය - තරවලෙ දුරෙසාමි ඝාතනය, රම්බොඩ - තවලන්තන්න රංගවේල් නායකතුමාගේ ඝාතනය, 1956 වසරේ දී නල්ලතන්නි වතුයායේ සිදු වූ 18 හැවිරිදි කරුමලෙගේ ඝාතනය ඇතුළු බොහෝ ඝාතනයන් සම්බන්ධයෙන් කොලෙ සින්දුගලෙ හි ගයා ඇත. මෙම නඩුවේ දී වතු පරිපාලනය වෙනුවෙන් ජී.ජී. පොන්නම්බලම් පෙනී සිටි බව වෘත්තිය සමිති නායකයෙකු මෙන් ම ලේඛකයෙක් වන තවසි අය්යාදුරෙ සටහන් කරයි.

(උරිමෛපෝරාට්ටත්තිල් උයිර් නීත්ත ත්‍යාගිකල් - පිටු 32 - අයිතිවාසිකම් සටනේ දී මිය ගිය විරුවන් පිටු - අංක 32)
ජිල්ලා* - නගරය

දුරෙසාමි ඝාතනය නමැති ගීතයේ,

**තොණ්ඩාමන් සමසමාජ -**
**දෙපක්ෂයේ පිරිස් අතර**
**ඇති වූ මතභේදයෙන්**
**රත්තරන් බඳු මිනිසෙක්**
**මියැදී වැටුණි**

**දබර වන වේලාවේ - යුක්තිය පවසද්දී**
**දුරසොමිගේ ළය පැළෙන - වැරෙන්**
**සිවලිංගම් අලවංගුවෙන් පහර දුනි - දුකෙන්**

යනුවෙන් එම ඝාතනයේ සාක්ෂියක් ලෙසින් මෙම ගීතය රචනා වී ඇත.

පක්ෂ ක්‍රියාවලි සම්බන්ධයෙන් හඬ නැගූ රාජප්පාගේ ගීතවල වෘත්තිය සමිති කෙරෙහි ඇති විවේචන දැකිය හැකිය.

**කොංග්‍රස් කොමියුනිට්ස්**
**ඉහළ වර්ණනා ලැබෙයි සමව**
**දෙකඩ වූ ද්‍රාවිඩයත් සිංගමුත්තු - ලංකා සම සමාජ තිබිලත් - කුමක් කරන්න ද මුත්තු**

**පැය අටක සේවා නීතිය තියෙද්දී**
**කළුවර වුණත් වැඩ ඇරියේ නැත අන්නපොට්ටු**

**මේ ගැන කතා කරන්න නීතියක් නැත විණ්ණප්පට්ටු**

**කම්කරු ජනයාට පොවන භාෂාව රාජප්පාගේ**
**ගීතය අස සතුටු වෙමු කියූ ලෙස - මේ**
**රටේ එක් වී ජීවත් වෙමු ද - අන්නකොඩි**

මෙලෙස පක්ෂ, කම්කරු වෘත්තිය සමිති, කම්කරුවන්ගේ ගැටලු, විරු මරණ තම ගීත තුළින් සටහන් කර ඇති රාජපප්පාව ප්‍රදේශවාසීහු 'රාජපාට් රාජප්පා' (කථානායක රාජප්පා) යනුවෙන් ආමන්ත්‍රණය කරති.

මොහුගේ කෘති රොසල්ල, ජී.එල්.එම්. නානයක්කාර ඇඳුම් කඩයෙන් සහ ඔහුගෙන් ද ලබා ගත හැකි යන පණිවුඩය ද එහි සටහන් කර තිබේ. මොහුගේ ගීත දෙස අවධානය යොමු කිරීමේ දී, ඔහු දැඩි වාමාංශික මත දැරූ අයෙක් බව දැකිය හැක. ඔහු හැටන්, රොසල්ල ප්‍රදේශයේ ජීවත් වන්නට ඇතැයි අනුමාන කළ හැක.

**මතු සම්බන්ධයි...**



# ආරූරන්: සම්මාන දිස්නයෙන් වැසී ගිය යුක්තිය



**සටහන - එස්. කර්ණන්**

සිව ආරූරන් මේ වනවිට දකුණේ බොහෝ සංවේදී හැඟීමෙන් කතාබහට ලක්වෙමින් සිටින්නෙකි. සිවලිංගම් ආරූරන් ඔහුගේ සම්පූර්ණ නම යි. යාපනයේ අල්වායි බටහිර නිලාවිල් ග්‍රාමය ඔහුගේ උපන් ගම වේ. එහෙත් මේ වන විට වසර 14ක් පුරා ඔහු කොළඹ නව මැගසින් බන්ධනාගාරයේ රඳවා ගැනීමට ලක්ව සිටියි. මේ වන විට ඔහුගේ වයස අවුරුදු 40 කි.

ආරූරන් මොරටුව ඉංජිනේරු පීඨයේ උපාධිධාරියෙකි. ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිය පශ්චාත් උපාධිය හදාරමින් සිටිය දී සුදු වෑන් රථයකින් පැහැරගෙන ගොස්, 2008 වසරේ මාර්තු මස 24 වන දින ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගන්නා ලදී. හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ඝාතනය කිරීමට තැත් කිරීමේ චෝදනාව යටතේ ඔහුට එරෙහිව 2013 වසරේ දී නඩු පවරන ලදී.

තමාව වධ හිංසාවට ලක් කර පාපොච්චාරණය ලබා ගත් බවට මෙම නඩුව නොවැම්බර් 1 වනදා කැඳවූ අවස්ථාවේ ආරූරන් අධිකරණය හමුවේ ප්‍රකාශ කළේ ය. දෙපාර්ශවයට සිය ලිපි ලේඛන ඉදිරිපත් කිරීමට කාලය දී නඩුව දෙසැම්බර් 2 වනදා දක්වා කල් තබන ලදී.

මෙම නඩු වාරයේ දී සිව ආරූරන් ඉදිරිපත් වූයේ සාමාන්‍ය දේශපාලන සිරකරුවෙක් ලෙස නොවේ. මෙම නඩු වාරයට දින තුනකට පෙර ඔහු රාජ්‍ය සාහිත්‍ය සම්මානයක් හිමි කරගෙන ගෞරවයට පාත්‍රව සිටියේ ය. දේශපාලන සිරකරුවෙක් ලෙස සිරගත කර සිටින ආරූරන් විශිෂ්ට නවකතාකරුවෙක් සහ කෙටිකතාකරුවෙක් බව සඳහන් කළ යුතු ය.

2008 වසරේ දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ආරූරන්ව අත් අඩංගුවට ගෙන වරාය පොලිසියේ රඳවා තබා ගන්නා ලදී. වසරකට අධික කාලයක් වරාය පොලිසිය යටතේ රඳවා ගැනීමෙන් පසුව 2009 ජූනි මස 25 වන දින ඔහුව රඳවාගෙන ප්‍රශ්න කිරීම සඳහා වෙනත් ස්ථානයකට මාරු කර යවන ලදී. ඔහු කෙටි කතා ලිවීම ආරම්භ කළේ එහිදී ය. මුද්‍රිත මාධ්‍යයේ පළ වූ ඔහුගේ පළමු කෙටි කතාව වන්නේ 'තායගම්' (මව්බිම) යන කෙටි කතාව යි. වසර දෙකකට වැඩි කලක් ආරූරන්ව එසේ රඳවා තබා ගන්නා ලදී. ඔහුව 2013 සැප්තැම්බර් 17 වන දින වැලිකඩ නව මැගසින් බන්ධනාගාරයට මාරු කිරීමෙන් පසුව ඔහු නවකතාවක් ලිවීම ආරම්භ කළේ ය.




ආතුරසාලෙ (ඉස්පිරිතාලය)

ආරූරන්ව ලේඛනය සඳහා පොළඹවන ලද්දේ ඔහු සමඟ සිරගතව සිටි දේවදාසන් නම් සහෝදර දේශපාලන සිරකරුවා විසිනි. අත් අකුරෙන් ලියන ලද සිය නිර්මාණ ආරූරන් විසින් මුද්‍රණය සඳහා යවනු ලැබුවේ එම මුල් පිටපත් සම්බන්ධයෙන් දේවදාසන්ගේ ප්‍රතිචාර ලබා ගැනීමෙන් අනතුරුව ය. ආරූරන්ගේ නවකතා, කෙටිකතා හි සෝදුපත් කියවා මුද්‍රණය කිරීම සහ එළි දැක්වීම ආදී සියලු කටයුතු සිදු කරනු ලබන්නේ ආරූරන්ගේ පියා වන සිවලිංගම් විසිනි. ඔහු සිය පුත්‍රයාගේ සාහිත්‍ය දිවිය කෙරෙහි කැපවෙමින් ආරූරන් බැලීමට යන විට පොත්පත් රැගෙන යයි. ආරූරන් පවසන්නේ සිය පියා නොමැති වී නම් තමාට සාහිත්‍ය කටයුතු කරගෙන යා නොහැකි වනු ඇති බව යි.

මෙම වසරේ ඔක්තෝබර් 28 වන දින පැවති රාජ්‍ය සාහිත්‍ය උළෙලේ දී හොඳම දෙමළ නවකතාවට හිමි සම්මානය හිමි වූයේ ආරූරන් විසින් රචිත 'ආතුරසාලයෙ' නම් නවකතාවට යි.



ඌමෛ මෝගම්

ඔහුගේ සාහිත්‍ය කෘතියට සම්මාන පිරිනැමුවේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රාජ්‍ය හමුදාව විසින් 'ත්‍රස්තවාදියෙක්' ලෙස තීන්දු කර රඳවා සිටිය දී ය. මෙවර සාහිත්‍ය උළෙලේදී හොඳම දෙමළ නවකතාව සඳහා ආරූරන්ගේ නම නිවේදනය කළ විට ඔහුත් සමඟ, නිල ඇඳුමෙන් සැරසුණු බන්ධනාගාර නිලධාරියෙක් ඔහුගේ සෙවණැල්ල මෙන් වේදිකාවට ගොඩ වූයේ ය. ආරූරන් සම්මානය ලබා ගන්නා විට ද එම නිලධාරියාගේ හැසිරීම ද ඔහු තමාගේ භාරයේ සිටින සිරකරුවෙක් බව ප්‍රකට කරන ලදී. දේශපාලන සිරකරුවන් යනු 'ත්‍රස්තවාදීන්' බවට වන රාජ්‍ය අර්ථකථනය වෙනස් වී නොමැති බවට එම සිදුවීම හොඳින් සාක්ෂි සැපයීය. සැකකරුවන් ලෙස රඳවාගෙ සිටින පුද්ගලයන්ට අදාළව නඩු කටයුතු පවත්වා ගෙන ගොස් අවසන් තීන්දු ගැනීමට පෙරම රාජ්‍ය විසින් ඔවුන් 'ත්‍රස්තවාදී' වන බවට වන මතය නඩත්තු කරයි.

සිව ආරූරන් මේ වනවිට පොත් 7ක් එළි දක්වා ඇති අතර ඉන් එකක් 'Innocent Victims' නම් ඉංග්‍රීසි බසින් රචිත කෘතියකි. සාහිත්‍ය සම්මානයක් හිමි වූ ඔහුගේ පළවෙනි නවකතාව 'යාලි සෛ' නම් වේ. ඔහුගේ සාහිත්‍ය නිර්මාණ 7න් 4කට ම සාහිත්‍ය ඇගයුම් හිමි වී ඇත.

මෙවර රාජ්‍ය සාහිත්‍ය සම්මානය හිමි වූ නව කතාව උතුරු පළාත් හොඳම නව කතාව ලෙස ද සම්මානයට පාත්‍ර විය.



වලසෙයිප් පරවෛගල්




හොඳම සාහිත්‍යකරුවාට පිරිනැමෙන උදයනන් සම්මානය ද ආරූරන්ට හිමි විය. 'යාවරුම් කෙලීර්', 'වලසපෛ පරවෛගල්' 'ඌමෛ මෝගම්' සහ 'පූමාංචෝලෛ' යන කෘති ඔහුගේ අනෙක් නිර්මාණ අතර වේ. 'ඌමෛ මෝගම්' යන නව කතාව 2020 රාජ්‍ය සාහිත්‍ය සම්මානය සඳහා නිර්දේශ විය. එසේම එම කෘතියට උතුරු පළාතේ සංස්කෘතිය දෙපාර්තමේන්තුව විසින් හොඳම නව කතාවට හිමි සම්මානය පිරි නමන ලදී.

සිව ආරූරන් පමණක් නොව විවේකානන්දනූර් සතීෂ් ආදි සාහිත්‍යධරයන් කිහිප දෙනෙක්ම මෙසේ දේශපාලන සිරකරුවන් වශයෙන් රඳවාගෙන සිටීමට ලක්ව ඇත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා තබාගෙන සිටි මිරුදන්ගල් (කර්ණාටික සංගීතයේ භාවිතා වන බෙරයකි) වාදකයෙක්, සාහිත්‍යවේදියෙක් සහ ලලිත කලා විශාරදයෙක් වන කනේසසුන්දරම් කන්නදාස් පසුව නිදහස් කරන ලදී. සතීෂ් විසින් 'වේප මරමුම් පවලම් ආච්චි' නමින් කෙටි කතා එකතුවක් එළි දක්වා ඇත. කවියෙක් ද වන සතීෂ්ගේ කාව්‍ය නිර්මාණ කෘති ලෙස එළි දක්වා ඇත. විශිෂ්ට සාහිත්‍යවේදියෙක් වන සතීෂ් ද වධ හිංසනයෙන් මිදී සිය පවුල සමඟ එක් වන දිනය උදා වනතුරු මග බලා සිටියි.

දේශපාලන සිරකරුවන් ලෙස රඳවා ගෙන සිටින සාහිත්‍යවේදීන් ඇතුළු පුද්ගලයන්ට රාජ්‍ය විසින් දිය හැකි හොඳම ගෞරව සම්මානය වන්නේ ඔවුන්ව කොන්දේසි විරහිතව නිදහස් කිරීම යි.

මූලාශ්‍රය - තීම්පුනල් සඟරාව

1995 වසරේ පුත්තලමෙහි කල්පිටිය ග්‍රාමයේ උපන් අහ්නාෆ් ජසීම් වෘත්තීයෙන් ගුරුවරයෙක් විය. 2020 වසරේ දී ඔහුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගන්නා ලද්දේ කවි එකතුවක් පළ කිරීමේ වරදට යි. දින 587 ක් රඳවා ගත් අහ්නාෆ් ඇප මත නිදහස් වූ අතර පසුව 'ත්‍රස්තවාදී' ලැයිස්තුවට ඔහුගේ නම ඇතුළත් කරන ලදී. මේ, රාජ්‍ය මර්දනයේ ගොදුරක් වන්නට වූ ලේඛක අහ්නාෆ් සමඟ සහෘදස්පන්දන කළ සහෘද සංවාදය යි.



# "ත්‍රස්තවාදය කියලා කියන්නේ අදහස් ප්‍රකාශ කිරීමට ද?"

**ඔබව දින 579 ක් සිරගත කළ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ගැන නැවතත් දකුණේ සාකච්ඡාවක් ඇති වෙලා තියෙනවා. ඒ ගැන ඔබට දැනෙන්නේ මොකක්ද?**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතක් අවශ්‍ය නැහැ. ත්‍රස්තවාදය වළක්වනවා කියන නමින් මේ පනත රජය භාවිතා කරන්නේ, රජයේ තීරණවලට විරුද්ධව හඬ නගන අයව මර්දනය කරන්නයි. මුල දී මේක දෙමළ ජනයාට විරුද්ධවත්, ඊට පස්සේ මුස්ලිම් ජනයාට විරුද්ධවත්, දැන් මහාජාතිය වන සිංහල ජනයාට විරුද්ධවත් භාවිතා කරනවා. මොකද දැන් ඔවුන් තමයි රජයට එරෙහිව සටන් කරන්නේ. 1989/90 භීෂණ සමයේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව දකුණේ සිංහල තරුණයන්ට විරුද්ධව මෙම පනත යොදාගත්තා.

මේ පනත භාවිත කරන්නේ අසාධාරණයට විරුද්ධව හඬක් නගන අයව මර්දනය කරන්න. රාජ්‍ය තමන්ගේ බලය තහවුරු කරගන්න මේ පනත යොදා ගන්නවා. මේක බොරු පනතක්. ඒ නිසා මේ වගේ පනතක් රටට අවශ්‍ය නැහැ.

**ඔබව අත්අඩංගුවට ගන්නේ ලංකාවේ ඇති වූ මුස්ලිම් විරෝධයේ ප්‍රතිඵලයක් ලෙස. ඔබව අත්අඩංගුවට ගත් අන්දම සහ ඒ පසුබිම කෙටියෙන් විස්තර කළොත්?**

2020 මැයි 16 වැනිදා තමයි මාව අත්අඩංගුවට ගත්තේ. 2019 මාර්තු 30 වැනිදා දක්වා මම බේරුවල ප්‍රදේශයේ ඉගෙනීමේ කටයුතු කරගෙන හිටියා. උසස් පෙළ ලියලා, බාහිර උපාධියක් හදාරමින් හිටියේ. මාර්තු 30 වෙනිදා වෙද්දී අධ්‍යයන වැඩ අවසන් වුණා. අප්‍රේල් 21 පාස්කු ප්‍රහාරය සිදු වුණා. අපිට කොහෙටවත් යන්න බැරි වුණා. ඒ දවස්වල ගෙදර නිකම් තමා හිටියේ. එහෙම ඉන්නකොට පුත්තලමේ, මදුරන්කුලියේ තියෙන ජාත්‍යන්තර පාසලක දෙමළ ගුරුවරයෙකුට රැකියා පුරප්පාඩුවක් තියෙනවා කියලා මම දැක්කා. ඒකට අයදුම් කරලා සම්මුඛ පරීක්ෂණ රැසකට පස්සේ මාව තෝරාගත්තා. 2019 ජූලි 02 වැනිදා මම පත්වීම් භාරගත්තා. ඒ පාසලේ දරුවන් ප්‍රථම වතාවට සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දෙන්න හිටියේ. ඉංග්‍රීසි පාසලක් වුණත් දෙමළ භාෂාව අනිවාර්ය නිසා ඔවුන් මාව බඳවා ගත්තේ 9,10,11 ශ්‍රේණිවලට දෙමළ සාහිත්‍ය උගන්වන්න. ඒ දරුවන්ට වැඩිපුර උගන්වන්න කියලා පාලනාධිකාරියෙන් කිව්වා. එතකොට මම මගේ ලොකු අම්මාගේ ගෙදර නතර වෙලා ඉඳලයි බස් එකෙන් පාසලට ගියේ. ඊට පස්සේ දරුවන්ට වැඩි දුරටත් උගන්වන්න ඕන නිසා පාසලේ නිල නිවාසයේ නතර වෙලා උගන්වන්න පටන් ගත්තා. ඒ සැප්තැම්බර් 02 වැනිදා. සාමාන්‍ය පෙළ විභාගය ඉවර වුණා ම මම නිල නිවාසයෙන් ආවා. නමුත් මගේ ඇඳුම්, පොත් එහෙම එහේ තිබුණා. මම ඒ ටික අරන් ආවේ නැහැ. 2020 මාර්තු 20 වගේ වෙද්දී කොරෝනා නිසා ලංකාවේ පාසල් සේරම වගේ වැහුවා. ඊට පස්සේ පුත්තලමේ ඉඳන් මන්නාරමේ තිබුණ මගේ ගෙදරට ආවා. මම මාස දෙකක් වගේ ගෙදර හිටියේ. මාව අත්අඩංගුවට ගත් හේතුව මම නතර වෙලා හිටිය ගොඩනැගිල්ල. ඒක තමයි මේකට මුල් වෙලා තිබුණේ. ඒ ගොඩනැගිල්ල පාසලට අයිති එකක් නෙවෙයි. ඒ ගොඩනැගිල්ල අයිති කාටද කියන එක මම දැනගෙන හිටියේ නැහැ. ඒක පාසලේ එකක් නෙවෙයි කියලා මම දැනගත්තෙත් මාව අත්අඩංගුවට ගත්තාට පස්සේ. ආයෙත් මහ මැතිවරණයක් ආවා. ඒ වෙනුවෙන් ආයෙත් මුස්ලිම් විරෝධයක් ඇති කරන්න මාවත් භාවිත කළා කියලා කියන්න පුළුවන්. ඒකෙන් තමා අසීමිත බහුතර බලයක දිනාගත්තේ. මුස්ලිම් ජනයාට එරෙහි ආණ්ඩුවේ වර්ගවාදී ප්‍රහාරයේ දිගුවක් විදිහට තමයි අර ගොඩනැගිල්ල පරීක්ෂාවට ලක් කරන්නේ. 2017 වසරේ දී මම එළිදක්වපු කවි පොතක පිටපතක් එහෙ තිබුණා. ඊට පස්සේ තමා මැයි මාසයේ 16 වැනිදා මාව අත්අඩංගුවට ගත්තේ.

**ඔබව දිගු කලක් ගතවන තුරු විනිසුරුවරුන් හමුවට පැමිණුවේ නැහැ. සිර භාරයේ දී ඔබ මුහුණ දුන් අත්දැකීම් කෙබඳුද?**

මේක ආයෙත් කියන්න ඕනේ කියලා හිතද්දී පොඩි බියක් දැනෙනවා. ඔවුන් අත්අඩංගුවට අරන් ගිහින් මානසිකව වධ දෙනවා. ශාරීරිකව වධ දෙන එකට වඩා මානසිකව වධ දෙන එක දරුණුයි. කෙනෙක් මානසිකව වැටුණාම ජීවත් වුණත් එකයි නැතත් එකයි කියන මට්ටමට එනවා. වෙන කෙනෙකුට වධ දෙන හැටි පෙන්වනවා. එක එක විදිහට තියෙනවා. තනි කරලා තියනවා. කන්න, බොන්න දෙන්නේ නැහැ. තවත් ගොඩාක් දේවල් තියෙනවා. සමහර දේවල් තියෙනවා, ඒවා ප්‍රසිද්ධියේ කියන්න අමාරුයි. දණ ගස්සලා ප්‍රශ්න කරනවා. එක අතක් උඩින් අරන්, අනිත් අත යටින් අරන් මාංචු දානවා. එහෙම කළා ම විනාඩි 15කින් ඔළුව කැරකෙන්න ගන්නවා. පැයක් විතර එහෙම තියෙනවා. ප්‍රශ්න කරද්දී ඔළුව මේසයේ, බිත්තියේ හප්පනවා, නිදාගන්න දෙන්නේ මාංචු දාලා ඉද්දීමයි. මෙයාලා දෙන දඬුවම් වෛද්‍ය පරීක්ෂණයේ දී අහුවෙන්නේ නැහැ. එයාලාට මේවා ශාරීරිකව හොයාගන්න බැහැ. මේවා අදියර මට්ටමින් තමයි කරන්නේ. සමහර අය මූලික අදියරයේ දීම එයාලා කියන දේවල්වලට එකඟ වෙනවා. මේ යටතේ අත්අඩංගුවට පත් වුණ අය විතරයි දන්නේ මෙහෙම නීතියක් තියෙනවා, මේ විදිහට වධ දෙනවා කියලා. සාමාන්‍ය මිනිසුන් දන්නේ නැහැ. ඇතුළේ ගොඩාක් කාන්තාවන් අත්අඩංගුවේ ඉන්නවා. එයාලා එකක් දරුවන් පවා ඉන්නවා. නිලධාරීන් කියන දේවල් පිළිගන්න ඕනේ, කියන තැන්වලට අත්සන් කරන්න ඕනේ. නැත්නම් 'අවුරුදු 20 ක් හිරේ දානවා', 'අවුරුදු එකහාමාරක් මෙහෙ හිර කරලා තියාගෙන ඉන්නවා', 'අපි තමා දෙවියෝ අපි කියන දෙය තමා මෙතැන වෙන්නේ' කියලා තර්ජනය කරනවා.



අහ්නාෆ් පුත්තලම අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමට රැගෙන යමින්

සිත් සේ සැමතැන යති සමහරු
ගියේ කොහිදැයි
කවුරු හෝ ඇසුවොත්
'මා කොහි ගියත් ඔබට මොකදැ'යි
දරාගත නොහැකි දුකක් සේ
උතුරන ක්‍රෝධය පුපුරන ගිනි සිළු
එහි කවුරුන් සිටියත්
නොසැලකිල්ලෙන් පිළිතුරු දෙති සමහරු

අම්මා එහි පැමිණ
ඔබ කොහේ ගියේ
ඔවුන් හෝරා ගණනක්
ඔබ නොමැතිව බිය වී පසුබට වී
දුක් වූ බව පවසා ඇසුවත්
බල්ලෙක් බුරන සේ
ඔරවති සමහරු

නින්දෙන් නැඟිට
දත් මැද තේ බිව් පසු
එළියට ගොස් ගමපුරා ඇවිද විත්
මහ රෑ
නිවැසියන් නිදන විට
වහලෙහි උළු ගලවා
නිවසට බසිති - ශබ්ද නොනඟා
කුස්සියේ සිට කෑමත් ගෙන
නිදියති සමහරක්

නමුත් සිරගත අපි
මූත්‍රා කළ යුතු යැයි
කූඩුවෙහි සැම සාකච්ඡා කර
මූත්‍රා එන තුරු
කෝප නොගෙන රැඳී සිටිමු.
තවද ඉවසුවොත්
මූත්‍රාශය පිපිරෙයි නැතහොත්
සිරගෙය ගඳ ගසයි
ඉවසීම ඇති දැන්
නොනැවතී කඩා හැලෙයි මූත්‍රා
ඉතින් වැසිකිළි යමු යැයි
මුරකරු අමතන්නෙමු

මුරකරුද කන පැලෙන තුරු
කතා දහසක් පවසා
පැලුණු කන හරහා ලේ ඇවිත්
එය ගඳ ගසන තුරු
මූත්‍රා කරන්නට පාත්‍රයක් හෝ ඇතැයි
කිසියම් පිළිතුරක් දී
අප කෝපය අවුස්සයි

සමාදානයෙන් සාමයෙන් කතා කර
ටිකක් ඉක්මන් කරමු'යි පවසා
මුරකරුගේ යටි හිත සොරකම් කර
අපේ දුක්බර තත්වය පවසා
දහසකුත් වචන ප්‍රකාශ යවා
ඔහු එයට ඉඩ දී
මාංචු දමා දෙපයින් යන විට
සෝපානය ද විෂබීජ ගැටී
මගකින් නතර වෙයි

හදිසියෙන් යා යුතු නිසා
දහසකුත් පඩිපෙළ බසින්න
සයවන මහළින්
දෙවන මහළට යන විට
මූත්‍රාම දූක සිතී
වතුර වී
ආමාශය තුළ එයම
තැන්පත් වෙයි....

**අහ්නාෆ් අත් අඩංගුවේ සිටියදී ලියන ලද කවියක්**

**පසුගිය දවස්වල තිබුණ ඉන්ධන අර්බුදය අතර පවා ඔබට අත්සන් කරන්න පුත්තලම ත්‍රස්ත මර්දන කොට්ඨාසයට යන්න වුණා...**

ඔව්. මට ඇප දුන්නේ දැඩි කොන්දේසි සහිතව. දැන් තමයි මුන්දලමට ගිහින් අත්සන් කරන්න තිබුණ එක මන්නාරමට මාරු කරලා දුන්නේ. මම නිදහස් වුණේ පසුගිය අවුරුද්දේ දෙසැම්බර් 16 වෙනිදා. එහෙම බැලුවොත් මාස 8 ක් මම අත්සන් කළේ මුන්දලමේ. වාහනවල යන්න ඉන්ධන නැහැ. ආරක්ෂාවක් නැති නිසා මට තනියෙන් කොහෙවත් යන්න එපා කියලා මගේ නීතිඥවරු මට උපදෙස් දුන්නා. ඒ නිසා තාත්තා එක්ක හරි මල්ලි එක්ක හරි තමයි යන්නේ. එහෙම වුණොත් අත්සන් කරන්න යන්න දෙන්නෙකුගේ ගමන් වියදම් දරන්න වෙනවා. පාරේ බස් ධාවනය අඩුයි. මගේ ස්ථිර ලිපිනය වෙනස් කරන්නත් බැහැ. මම ඉන්න ඕනේත් මන්නාරමේමයි. පුත්තලමේ කුලියට ගෙයක් අරන් නතර වෙලා ඉන්නත් බැහැ. හැම මාසයකම පළමු ඉරිදාත් අවසන් ඉරිදාත් උදේ 9යි 12යි අතර අත්සන් කරලා තියෙන්නත් ඕනේ. මන්නාරමේ ඉඳලා කොහොම හරි ආවත් අත්සන් කරලා යන්න බස් තියෙන්නේ නැහැ. බස් නැති නිසා ලොරියක නැඟලා අත්සන් කරන්න යන පින්තූරයක් මම සමාජ මාධ්‍යයේ පළ කළා. ඉඳලා ඉඳලා බලලා බැරිම තැන තමයි ඒ ලොරියේ නැඟලා ගියේ. ඒක යකඩ බඩු එකතු කරන ලොරියක්. ඒකේ එල්ලිලා ගියා. ඇත්තටම මේක ශාරීරික වධයක්. හැම මාසයක ම යන්න ඕනේ. මට හරියට රස්සාවක් නැහැ. උගන්වන්න ගිහින් ආයෙත් මම අන්තවාදී ක්‍රියාවට සම්බන්ධයි කියලා කිව්වොත් මාව නැවතත් අත්අඩංගුවට ගනියි. මට දීලා තියෙන්නේ නීතිපතිවරයාගේ විශේෂ අනුමැතියක් සහිත ඇපයක් විතරයි. එයාලා හිතුවොත් මම අන්තවාදී ක්‍රියාවක් කරනවා කියලා ඇප අවලංගු කරන්නත් පුළුවන්. ඒ නිසා මට රස්සාවක් කරන්න බැහැ. එළියට යන්න විදිහක් නැහැ. කාත් එක්කවත් තනියෙන් යන්න බැහැ. අපි ජීවත් වුණේ ආර්ථික අර්බුද මැද. අත්සන් කරන්න යන්න එන්න විතරක් ලොකු ගාණක් වියදම් වෙනවා. අත්සන් කරලා එන්න දවසක් ම යනවා. පාන්දර තුනේ බස් එකට නැග්ගොත් තමා උදේ වෙද්දී පුත්තලමට එන්න පුළුවන් වෙන්නේ. මේ අපහසුතා අධිකරණයට දැනුම් දුන්නායින් පස්සේ මාස දෙක තුනකට කලින් අලුතින් පටන් ගත්ත මන්නාරම ත්‍රස්ත විමර්ශන ඒකකයට අත්සන් කරන්න කියලා මාරු කළේ.

**ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්මත කළේත් මුලින්ම භාවිතා කළේත් දෙමළ සමාජය මර්දනයට බව ප්‍රසිද්ධ කරුණක්, පසුව එයට මුස්ලිම් සමාජය ගොදුරු වුණා..**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, හදිසි නීතිය ආණ්ඩුව තම බලය තහවුරු කරගන්න මහජනයා මත යොදවනවා. ඒකට ජාතිය, ආගම, ප්‍රදේශය කියලා භේදයක් නැහැ. ආණ්ඩුවට එරෙහිව ඉන්න ඕනෑම කෙනෙකුට මේ පනත භාවිත කරනවා. මිනිස්සුන්ට කතා කරන්න අයිතියක් නැහැ. අදහස් දක්වන්න බැහැ. ඒ දවස්වල දෙමළ අය අයිතීන් වෙනුවෙන් හඬ නගපු නිසා ඔවුන්ට විරුද්ධව භාවිතා කළා. ඊට පස්සේ මුස්ලිම් ජනයා. දැන් සිංහල ජනයාට විරුද්ධව භාවිත කරනවා.

**ඔබේ කවි සම්බන්ධයෙන් විවිධ දේශපාලනඥයන් විවිධ අර්ථකථන ඉදිරිපත් කළේ සිංහල පරිවර්තනයක් එන්නත් කලින්. ඔබට ඒ ගැන දැනුන හැඟීම මොකක්ද?**

ත්‍රස්ත විමර්ශන ඒකකයේ ඉන්න දෙමළ පරිවර්තකයන් පවා හරියට දෙමළ භාෂාව ගැන දන්නේ නැහැ. මාව අත්අඩංගුවට ගනිද්දී නවරසම් පොත් පිටපත් 100 ක් සහ මම කියවමින් හිටිය පොත් 49 ක් විතර තිබුණා. මේකෙන් පොත් 14 ක් දෙමළ සාහිත්‍ය සම්බන්ධ පොත්. කිසිම තේරුමක් නැතිව මේවා අරන් ගිහින් තිබුණා. දෙමළ සාහිත්‍ය යුග, මණිමේඛලෛ, කන්ද පුරාණම් පවා අරන් ගිහින් තිබුණා. බයිබලය හා කුරාණය සංසන්දනය කරලා ලියැවුණ පර්යේෂණ කෘතියක් තිබුණා. ඒකත් අරන් ගිහින්. එහෙ හිටියා භාෂා පරිවර්තකයෙක්. ත්‍රස්ත විමර්ශන ඒකකයේ ඉන්න භාෂා



නවරසම් කාව්‍ය සංග්‍රහය

පරිවර්තකයාගේ පරිවර්තන තමයි දේශපාලනඥයන් කියන්නේ. එයා තමා හැම පරිවර්තනයක් ම කළේ. එයාගේ පරිවර්තන නිසා අහිංසක මිනිසුන් කීදෙනෙක් හිරේ ඉන්නවා ද කියලා දන්නේ නැහැ. එයා මගෙත් එක්ක සම්භාව්‍ය දෙමළ සාහිත්‍ය සම්බන්ධයෙන් තර්ක කළා. මම කියපු සමහර කරුණු එයාට තේරුම් ගන්න බැරි වුණා. මම ඒ වෙලාවේ දැනගත්තා මෙයාට සාහිත්‍ය දැනුමක් නැහැ කියන එක. ඉතිං මෙහෙම කෙනෙක් මගේ කවි පරිවර්තනය කළා ම කොහොමද සිංහල අයට ඒක පැහැදිලිව යන්නේ? මගේ පොතේ තියෙන "උරුවාක්කු" කවිය තමා ආන්දෝලනාත්මක කවියක් කියලා කියන්නේ. ඒක ත්‍රස්තවාදියට විරුද්ධව ලියවිලා තියෙන කවිය. මාව හැම උසස් නිලධාරියෙක් ළඟට ම එක්කගෙන ගියා. එයාලා හැම කෙනෙක් ළඟම මේ කවියේ පිටපත් තියෙනවා. මම ඒ හැම කෙනෙකුට ම කිව්වා මේක ත්‍රස්තවාදයට විරුද්ධ කවියක් කියලා. නමුත් එයාලා ඇහුවේ නැහැ. "ඔසවන තුවක්කුවෙන් ප්‍රහාරයක් එල්ල වෙයි අපට..." කියලා ඒකේ සඳහන්. මේකෙන් මම කියන්නේ ආයුධය අතහැරලා පැන ගන්න කියලයි. මම මේක පැහැදිලි කරලා දීලත් එයාලා අර පරිවර්තකයා කියපු දෙය තමා පාර්ලිමේන්තුවේ දී කිව්වේ.

ඇතුළේ ඉන්න භාෂා පරිවර්තකයා හරි නැත්නම් කොහොමද මේ වැඩ හරි කියලා කියන්නේ? එයාලා මේක ඇත්ත කියලත් දන්නවා. පොලිසියේ ඉහළ නිලධාරීන් වගේ ම ආණ්ඩුවේ මැති ඇමතිවරුන් දන්නවා මම ලියලා තියෙන්නේ ත්‍රස්තවාදයට විරුද්ධ බව. ඔවුන්ගේ දේශපාලන ගමන ගෙනියන්න කෙනෙක් ඕන වුණා. පාර්ලිමේන්තුවේ කියපු දේවලටත් වඩා දේවල් ඔවුන් කියාවි.

**අත්අඩංගුවට පත් වීමත් එක්ක සමාජයෙන් ඇති වූ විරෝධය සහ පවුලේ අයට මුහුණ දෙන්න සිදු වුණ දේවල් මොනවාද?**

මාව අත්අඩංගුවට ගත්තා ම ගමේ අයට විශ්වාස කරන්න බැරි වුණා මමත් මේකට සම්බන්ධයි ද කියලා. අනිත් පැත්තට විශ්වාස නොකර ඉන්නත් බැහැ. අල්ලපු ගෙදර අය හොඳටම බය වෙලා අපේ ගෙදරට එන එකත් නතර කළා. නෑයන්ගෙන් ආවේත් ළඟ හිටපු අය විතරයි. ඒ අයත් බියෙන් වගේ තමා ආවේ. ඒකා ත්‍රස්වාදියෙක් කියලා ගමේ ගොඩාක් අය කියලා තිබුණා. මගේ නවරසම් පොත් ගත්ත ගොඩාක් අය ඒවා ගිනි තිබ්බා. ගිනි තියෙනවා කියලා ප්‍රසිද්ධියේ කිව්වා. මල්ලි යාපනය විශ්වවිද්‍යාලයට තේරිලා හිටියා. එහෙට යනවාද නැද්ද කියලත් බයෙන් කල්පනා කළා. අපි හැමෝම දිනපතා මැරි මැරී ඉපදුණා කිව්වොත් හරි. රජය මාව ත්‍රස්තවාදියෙක් කියලා හංවඩු ගැහුවා. ගමේ අය මාව ගමෙන් ඈත් කරලා තියන්න හදනවා. මං ගැන හරි ප්‍රවෘත්තිය ඇවිත් තියෙන්නේ දෙසැම්බර් අවසානයේ. මාව අත්අඩංගුවට ගත්තේ මැයි මාසයේ. මාස 7 ක් මගේ පවුලේ අයගේ ජීවිත ගෙවිලා තියෙන්නේ මේ විදිහටයි. ත්‍රස්තවාදයට සම්බන්ධ නැහැ කියන පුවත එළියට ආවාම තමා අනිත් අය සුපුරුදු විදිහට ආශ්‍රය කරන්න පටන් අරන් තියෙන්නේ. නමුත් මුල ඉඳන් එක මාමා කෙනෙක් විතරක් මගේ පවුලට උදව් කරමින් මං ගැන හොයන්න මහන්සි ගත්තා.

**ඔබට එරෙහි නඩුව තවමත් අවසන් වෙලා නැහැ. ඔබේ නමත් ත්‍රස්තවාදී යන ලැයිස්තුවට ඇතුළත් කරලා තියෙනවා..**

ඒක ආසියාවේ අශ්චර්ය කියලා කියන්න පුළුවන්. ත්‍රස්තවාදයට විරුද්ධව ලියපු කෙනෙක්ව, ත්‍රස්තවාදයට කිසිම සම්බන්ධයක් නැහැ කියලා දැනගෙනත්, උසාවියේ මගේ නඩුව විභාගයට අරන් නැහැ කියලා දැනගෙනත්, මාව ත්‍රස්තවාදී ලැයිස්තුවට දාලා තියෙනවා. මගේ බැංකු ගිණුමත් අවහිර කරලයි තියෙන්නේ. මේකට විරුද්ධව මම මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් දැම්මා. ඒ පැමිණිල්ල භාරගත්තා. ඒ ගැන විමර්ශනය කරන්න සූදානම් කියලා කොමිසමෙන් ලිපියක් දීලා තියෙනවා. මගේ නමත් තහනම් කළ පුද්ගල ලැයිස්තුවට ඇතුළත් කරපු ගැසට් එක රජය නිකුත් කළේ, අගෝස්තු මාසයේදී. නමුත් මට දැනුම් දෙන්නේ ඔක්තෝබර් මාසයේ දී. මේවා ගැන මොනවා කියන්න ද කියලා හිතාගන්න බැහැ.

**ඔබ වගේ ම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට පත් වූ ලේඛකයෝ බොහෝ ගණනක් ඉන්නවා. මේ තත්වය ගැන ඔබේ අදහස මොකක්ද?**

මම දන්න ගොඩාක් අය ඉන්නවා ඇතුළේ. ගොඩාක් අය ඇප මත නිදහස් වෙලා තියෙනවා. නීතිඥවරු, දොස්තරවරු හිරේ ඉන්නවා. ඒ හැමෝම නිදහස් වෙන්න ඕනේ. ඒ වගේ ම ටියුබ් ටැමිල් මාධ්‍යවේදිනි දිවන්‍යාත් රඳවාගෙන ඉන්නවා. මේ විදිහ ගොඩාක් අය ඉන්නවා. සියලු ම දේශපාලන සිරකරුවන් කොන්දේසි විරහිතව නිදහස් කරන්න ඕනේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන්න ඕනේ. මිනිස්සුන්ට ලියන්න අයිතියක් තියෙනවා. භාෂණය සහ විරුද්ධ වීම කියන්නේ අපේ අයිතියක්. අපි ප්‍රචණ්ඩ ක්‍රියා කරන්නේ නැහැ. අදහස් ප්‍රකාශ කරනවා. මේකට ද ත්‍රස්තවාදය කියලා කියන්නේ? අපේ අයිතිවාසිකම් අපිට ඕනේ. නන්දිකඩාල්වල තිබුණ දිලීපන් සැමරුමක් ගැන වීඩියෝවක් ටික්ටොක්වල දැම්මා කියලා අවුරුදු 23 ක් තරුණයෙක්ව මේ පනතෙන් අත්අඩංගුවට අරන් තියෙනවා. සාමාන්‍ය ටික්ටොක් වීඩියෝවක් වත් ප්‍රසිද්ධ කරන්න බැරි රටක් තමයි මේක. අත්අඩංගුවට අරන් තියෙන්නේ තියෙන්නේ අහිංසක ජනතාව සහ උගත් බුද්ධිමත් පිරිස්. ඔවුන්ගේ මතවාද පාලකයන්ට අනතුරුදායක නිසා ඔවුන්ව සිරගත කරලා තියෙනවා.

**ආන්දෝලනයට තුඩු දුන් ඔබේ නවරසම් පොතෙහි අන්තර්ගතය ගැන කර්තෘගේ හඬින් අපි දැනගන්න කැමැතියි. ඔබේ ලේඛණය පිළිබඳව පැහැදිලි කළ හැකි ද?**

මම කවි ලියන්න පටන් ගත්තේ නවය වසරේ දී. වස්තු විෂය බොහොමයක් පාදක කරගෙන මම කවි ලිව්වා. ගොඩක් ඇතුළත් කළේ සමාජීය ප්‍රශ්න. භාරදී, භාරදිදාසන්ගේ කවිවල අභාෂය මේකට හේතුවක් වුණා. ඔවුන්ගේ කවි නිර්මාණය වුණේ සමාජයේ ඇති අසාධාරණයට එරෙහිව. භාරදී ඔහුගේ



ඉන්ධන අර්බුද හමුවේ, පරණ යකඩ එකතු කරනු ලබන ලොරියක නැගී අත්සන් කිරීම සඳහා පුත්තලම ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයට සිය පියා සමඟ ගමන් කරමින්

'කව්වලින් නිදහස් ඉන්දියාවක් දුටුවා. මේ විදිහට මම ලියපු කවි එකතුවක් තිබුණා. මේ සේරම කවි පොතක් විදිහට එළිදක්වන්න බැරි නිසා නව නළු රස අරන් එක රසයකට කවි පහ බැගින් අරන් කවි 45ක පොතක් කළා. පළවෙනි පොත නිසා තාත්තාගෙන් සල්ලි අරන්, ණයට සල්ලි අරන් තමා මේ පොත කළේ. ඒකේ ඉස්ලාමය සම්බන්ධ සමාජීය කවි, සමාජ සංස්කෘතිය බිඳ වැටීම් ගැන කවි ඇතුළත්. ඊට අමතරව ජාත්‍යන්තර දේශපාලනය සම්බන්ධයෙන් කවිත් මීට ඇතුළත්. මියන්මාර සමූල ඝාතනය, සිරියා යුද්ධය, මේවායෙන් මිය ගියේ මනුෂ්‍යත්වය සහ මිනිසුන් කියන එක ගැනයි ලිව්වේ. මේ පොතේ තියෙන කවි සේරම මනුෂ්‍යත්වයට එරෙහිව සිදු කරන ක්‍රියා සම්බන්ධයෙන් විවේචනාත්මකව ලියවුණු නිර්මාණ. උදාහරණයකට භාරදී කියනවා, එක් අයෙකු කුසගින්නේ සිටින්නේ නම් මේ භූ තලය විනාශ කරනු.. කියලා. මේකේ භාරදී කියන්නේ මේ ලෝකයේ ඉන්න කවුරුත් කුසගින්නේ සිටිය යුතු නැහැ කියලා. කවියක තියෙන උපමා, රූපක, උත්ප්‍රාසය, අනුප්‍රාසය, අතිශෝක්තිය වගේ සාහිත්‍ය කරුණු තේරුම් ගන්න ඕනේ. ලංකාවේ ත්‍රස්ත විමර්ශන ඒකකයේ කවුරු හරි මේ කවිය පරිවර්තනය කළොත්, භාරදී ත්‍රස්තවාදියෙක් කියලා කියයි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දෙමළ භාෂා අංශයේ මහාචාර්ය එම්.ඒ නුහුමාන් මේ කවි පොතේ කිසිම අන්තවාදී අදහසක් නැහැ කියලා ශ්‍රේෂ්ඨාධිකරණයට කිව්වා. මීට කලින් දෙමළ ජනයාට කළා වගේ දැන් මුස්ලිම් ජනයාව මර්දනය කරනවා. රජයට විරුද්ධව එන ජනතා නැඟිටීම් පාලනය කරන්න මේවා භාවිතා කරනවා. හෙට වුණත් ඕනෑම කෙනෙකුට මොනවා හරි දෙයක් වෙන්න පුළුවන්. නවරසම් තමා මගේ පළමු පොත. මම ගොඩාක් පොත් එළිදක්වන්න කැමැත්තෙන් හිටියා. මගේ ගමේ ඉතිහාසය සම්බන්ධයෙන් පර්යේෂණ කෘතියක් එළිදක්වන්නයි හිටියේ. ඒවාට අදාළ ලිපි සේරම මේ වෙද්දී ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය භාරයේ තියෙන්නේ. ඒවා නිරුපද්‍රිතව තියෙනවා ද නැද්ද කියලාවත් මම දන්නේ නැහැ. මගේ ලැප්ටොප් පරිගණකයත්, දුරකථනයත් තියෙන්නේ ඔවුන් භාරයේ. ඒවා තියෙනවා ද කියලා දන්නේ නැහැ.



අහ්නාෆ් සිය පවුලේ සාමාජිකයන් සමඟින්

## රැඳවුම්භාරයේ ඉද්දී, කවි ලියන්න හිතුණේ නැද්ද.?

මම පොත්වලට ගොඩක් කැමැතියි. කැමට තියෙන සල්ලි ඉතුරු කරලා පවා පොත් අරන් තියෙනවා. හිරේ ගියාම පොත් අරගෙන කවි ලියන්න පටන් ගත්තා. ලියද්දී එයාලා ප්‍රශ්න කරනවා. ඒ නිසා බොහෝදුරට ප්‍රේමය සම්බන්ධ කවි ලිව්වේ. සමාජීය ප්‍රශ්න ගැන කවි ලිව්වොත්, එයාලා ප්‍රශ්න කරලා ඉරලා දාන්න ඉඩ තියෙනවා. නමුත් ඒ අතරින් හංගලා සමාජ ගැටලු ගැන කවි ලිව්වා. පොත් 10ක විතර කවි ලියලා තිබ්බා. ඊට පස්සේ උසාවියෙන් මාව බන්ධනාගාර ගත කළා. මගේ පොත් ටික ඇතුළට ගන්න බැහැ කියලා බන්ධනාගාරයෙන් කිව්වා. ගෙදරින් කෙනෙකුට එන්න කියලා පොත් ටික භාර දෙන්න කිව්වා. මගේ නීතිඥවරුන්වත් මාව බන්ධනාගාර ගත කළා කියලා දැනගෙන හිටියේ නැහැ. දන්නවා වුණත් එහෙම එන්න විදිහක් නැහැ. කොරෝනා වැඩියි කියලා ඇඳිරි නීතිය දාලා තිබුණා නිසා මොකුත්ම කරන්න විදිහක් තිබුණේ නැහැ. මට පොත් ටික විතරක් අරගෙන යන්න අවසර දෙන්න කියලා මම වැඳලා ඉල්លුවා. ඔවුන්ගේ පිළිතුර වුණේ සහරාන්ගේ අයට එහෙම කරන්න බැහැ කියන එකයි. මම කිව්වා පොත් නැතිව මම වාහනයට නඟින්නේ නැහැ, මාව මෙතැනම වෙඩි තියලා මරලා දාන්න කියලා. ඊට පස්සේ රෙදි බෑගයයි පොත් ටිකයි දිහා බලලා කිව්වා, දෙකෙන් එකක් විතරයි අරන් යන්න පුළුවන් කියලා. මම ඇඳුම් බෑගය විසි කරලා පොත් ටික ගත්තා.



සිංහල කෙටි කතා 10 ක දෙමළ පරිවර්තනය ලෙසින් 'කර්ෂූ' එළිදැක්වීමට නියමිතව තිබේ.

සිවලිංගම් අනූෂා විසින් දෙමළ බසට පරිවර්තනය කර ඇති මෙම කතා 10 තුළ ගෝත්‍රික සමාජ සිතීමකින් ඔබ්බට ගිය, පොදු මිනිස් සන්තානයේ පවතින සංවේදනා අන්තර්ගත වී ඇත.



යදාර්තන් විසින් රචිත 'නගුලාත්තෙ' නව කතාව මේ වනවිට ප්‍රකාශයට පත් කර ඇත. වට්ලි ප්‍රකාශයක් වන මෙය ඉන්දියාවේ මෙන් ම ලංකාවේ ද පොත්හල්වලින් මිල දී ගත හැක.

හමුදා අක්‍රමණ හමුවේ නිතරම බිඳ වැටී යළි ප්‍රාණවත් වූ වන්නියේ සිදුවීම් පාදක කරගනිමින් මෙම නව කතාව රචනා කර තිබේ.

# චිත්‍ර කතා



ඡායාරූපය :thestar Eranga Jayawardena / The Associated Press File Photo

කිලිනොච්චියේ පදිංචි බාලේන්දිරන් ජෙයකුමාරි පිරිමි දරුවන් තිදෙනෙකුගේ සහ එක් ගැහැණු දරුවෙකුගේ මව යි. ඇගේ පළමු සහ දෙවන දරු දෙදෙනා යුද්ධයට මැදිව මිය ගියහ. තෙවැනි දරුවා වූ බාලේන්දිරන් මහේන්ද්‍රන් 2009 මැයි මස මුල්ලිවයික්කාල්හි දී රජයේ හමුදා වෙත බාර වූ අතර ඉන්පසු ඔහු පිළිබඳව කිසිදු තොරතුරක් ලැබුණේ නැත. වසර කිහිපයකට පසුව රජයේ ප්‍රකාශනයක පළ වූ රජයේ පුනරුත්ථාපන කඳවුරක ඡායාරූපයක මහේන්ද්‍රන් සිටින බව ජෙයකුමාරි විසින් හඳුනා ගන්නා ලදී. නමුත් රජයේ ආරක්ෂක අංශ වෙතින් ලැබුණ පිළිතුර වූයේ ඔහුව තමන් විසින් බාර නොගත් බවයි. ඉන්පසුව ජෙයකුමාරි සිය දියණිය විභූෂිකා ද සමඟ බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ ඥාතීන්ගේ අරගලයට එක්ව තම පුතු පිළිබඳව තොරතුරු ලබා ගැනීම සඳහා අරගලය ආරම්භ කළාය.

2014 මාර්තු 13 වෙනිදා පොලීසියට අවශ්‍ය සැකකරුවෙකුට රැකවරණ ලබාදුන්නේය යන චෝදනාව මත ජෙයකුමාරි හා ඇගේ 13 වියැති දියණිය ත්‍රස්ත විමර්ශණ ඒකකය මඟින් අත් අඩංගුවට ගන්නා ලදී. ජෙයකුමාරි වසරකට ආසන්න කාලයක් චෝදනා රහිතව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිරගත කර සිටි අතර විභූෂිකා මවගෙන් වෙන් කරන ලදුව කිලිනොච්චියේ ළමා නිවාසයක් භාරයට පත් විය. 2015 මාර්තු 10 වැනිදා දැඩි කොන්දේසි යටතේ ජෙයකුමාරි නිදහස් කළ ද ඇයටත් දියණියටත් තවමත් දිවි ගෙවන්නට සිදුව ඇත්තේ ආරක්ෂක අංශවල පරීක්ෂාව යටතේ ය. කෙසේ වෙතත් රජයේ හමුදා භාරයට පත් වීමෙන් පසුව අතුරුදහන් වූ තම මහේන්ද්‍රන් ඇතුළු දහස් ගණනක් දෙමළ ජනයා පිළිබඳ පිළිතුරු දීමට තවමත් ශ්‍රී ලංකාව සමත්ව නැත.

ඉංග්‍රීසි පුවත්පත්‍ර කලා ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියෙක් වන ජෙයප්‍රකාෂ් තිස්සනායගම් 2008 මාර්තු මස ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගන්නා ලදී. වසර එකහමාරකට වැඩි කාලයක් තිස්සේ ඔහුව රඳවා තබා ගත්තේ අමානුෂික කෲර වධ බන්ධනයන්ට ලක් කරමිනි. තිස්සනායගම් විසින් ලියන ලදුව 'නෝර්ත් ඊස්ටර්න් මන්ත්ලි' සඟරාවේ 2006 ජූලි හා දෙසැම්බර් කලාපවල පළ වූ නැගෙනහිර ප්‍රදේශයේ සිදු කළ හමුදා මෙහෙයුම් හේතුවෙන් අවතැන් වූ ජනයා මුහුණ දී ඇති ගැටළු පිළිබඳ ලිපි දෙකක් හරහා ජනවාර්ගික පසමිතුරුකම් අවුළන ලදැයි චෝදනා යටතේ 2009 අගෝස්තු 31 වනදා බරපතල වැඩ සහිත විසි වසරක සිර දඬුවම් නියම කරනු ලැබුණි. 2009 වසරේ දී දේශසීමා රහිත මාධ්‍යවේදීන් විසින් ධෛර්ය සම්පන්න හා ආචාර ධාර්මික මාධ්‍ය භාවිතාව වෙනුවෙන් පිරිනමන පීටර් මැක්ලර් සම්මානය සඳහා තිස්සනායගම් නම් කරන ලදී. ජාත්‍යන්තර වශයෙන් එල්ල වූ උද්ඝෝෂණ ව්‍යාපාර හමුවේ 2010 මැයි 03 වන දින ජනාධිපති සමාව යටතේ ඔහුව නිදහස් කිරීමට රජයට සිදු විය. ඉන්පසු ඔහුට ශ්‍රී ලංකාව අත්හැර පිටුවහල්ව ජීවත් වීමට සිදු විය.






වතුකරයේ පදිංචිකරුවෙක් වූ රාමයියා රවීන්ද්‍රන් 2000 වසරේ දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගන්නා ලදී. ඒ, ඔහු සහ තවත් සේවකයන් පිරිසක් විසින් තේ වත්තක සිදුකළ වැඩ වර්ජනයක් අතර වතුර ටැංකියකට අලාභ කරන ලද බවට වූ චෝදනා යටතේ බව වාර්තා වේ. 2004 දී රවීන්ද්‍රන්ට ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම විය.

2010 වසරේ දී රවීන්ද්‍රන් සහ ඔහුගේ දිගු කාලීන පෙම්වතිය හින්දු චාරිත්‍රානුකූලව වැලිකඩ බන්ධනාගාරයේදී විවාහ දිවියට ඇතුළත් වූහ.

ඡායාරූපය උපුටා ගැනීම - www.bbc.com/sinhala/news



ඡායාරූපය- සම්පත් සමරකෝන් *https://www.flickr.com/photos/vikalpasl/*

2009 නොවැම්බර් 05 වනදා මිතුරෙකු සමඟ යතුරු පැදියක ගමන් කරමින් සිටි ගනේෂන් නිමල්රූබන් වව්නියාව, චේප්පංකුලම් ප්‍රදේශයේදී අත්අඩංගුවට ගන්නා ලදී. ඔහුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වසර 3ක් වව්නියාව බන්ධනාගාරයේ රඳවා තබා ගෙන සිටින ලදී. නිමලරූබන් 2012 ජූනි 29 වනදා වව්නියාව බන්ධනාගාරයේ ඇති වූ ගැටුමක් මර්දනය කිරීම සඳහා ආරක්ෂක අංශ විසින් දියත් කළ බව පැවසෙන 'මුදවා ගැනීමේ මෙහෙයුමක" දී තුවාල ලබා අනතුරුව මිය ගිය බවට බලධාරීහු කීහ. තුවාල ලැබූ නිමලරූබන් අනුරාධපුර බන්ධනාගාරයටත් ඉන්පසු මහර බන්ධනාගාරයට යවා තිබූ බව වාර්තා වේ. ජූලි 07 වනදා එක්වරම තමන්ව රාගම රෝහලට රැගෙන ගොස් සිය පුතාගේ මිය ගිය සිරුර පෙන් වූ බව නිමලරූබන්ගේ දෙමව්පියන් පැවසූහ. එහෙත් නිමලරූබන්ගේ මෘත ශරීරය දරුණු වධ බන්ධනය ලක්කොට අත් පා කඩා දමා සිරුර ලේවලින් නැහැවී තිබුණි.

ඔහුගේ මරණයෙන් පසු, ජාතික ආරක්ෂාව පිළිබඳ හේතු දක්වමින් ඔහුගේ දේහය නිදහස් කිරීම හෝ ඔහුගේ උපන් ගම වන වවුනියාවේ තැන්පත් කිරීමට ඉඩ දීම බලධාරීහු මුලින් ප්‍රතික්ෂේප කළහ. නිමලරූබන් ඝාතනයට ලක් වූ දිනය ජූලි 4 වනදා ලෙස සැළකෙන අතර අධිකරණ ක්‍රියාවලියකින් අනතුරුව ඔහුගේ මෘත ශරීරය ඔහුගේ දෙමව්පියන් වෙත ලැබුණේ ජූලි 24 දින අවසන් කටයුතු කරන ලෙස ද දන්වමිනි. නිමලරූබන්ගේ අවසන් කටයුතු සිදුවන විට ඔහුගේ නිවස වටා හමුදා රැකවල් යොදා තිබුණි. මේ නිමලරූබන්ගේ දේහය අසල වැළපෙන ඔහුගේ අම්මා යි.

මහත්මා ගාන්ධිගේ ජීවන දර්ශනය පදනම් කර ගනිමින් දුප්පත්කම තුරන් කිරීමත්, නොසළකා හැරීම් හා ප්‍රචණ්ඩත්වය පිටු දැකීමත් පදනම් කරගත් ස්වේච්ඡා සමාජ සංවිධානයක් වන 'ගාන්ධියම් ව්‍යාපාරය' ආරම්භ කළේ වෛද්‍ය රාජසුන්දරම් සහ එස්. ඩේවිඩ්ගේ මූලිකත්වයෙනි.

මූලික කාර්ය සමාජ සුබසාධන සේවා පවත්වාගෙන යාම වුව ද 1977 සිට රාජ්‍ය අනුග්‍රහය ලත් භීෂණය හේතුවෙන් සරණාගතයන් ලෙස උතුරු නැගෙනහිර පළාත්වලට පලා ආ දෙමළ ජනයා නැවත පදිංචි කරමින් සුබ සාධන කටයුතු සිදු කළේ ගාන්ධියම් ව්‍යාපාරය විසිනි. රජය මේ කෙරෙහි උරණ වූ අතර ගාන්ධියම් ව්‍යාපාරය ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සිදු කරන බවට සාවද්‍ය පුළුල් ප්‍රචාරයක් සිදු කරන ලදී.

1983 දී වෛද්‍ය රාජසුන්දරම්ව ශ්‍රී ලංකා හමුදාව විසින් අත්තනෝමතිකව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගන්නා ලදී. අත් අඩංගුවේදී ඔහු දරුණු වධ බන්ධනයන්ට ලක් විය. දොස්තර රාජසුන්දරම්ව 1983 දෙමළ-විරෝධී කළු ජූලියේ දී වැලිකඩ බන්ධනාගාරය සිදු කළ ද සංහාරයේදි ඝාතනය කරන ලදී.



එස්. ඒ. ඩේවිඩ් (මැද) සහ වෛද්‍ය එස්. රාජසුන්දරම් (දකුණේ) ගාන්ධියම් ව්‍යාපාරයේ සාකච්ඡාවක් මෙහෙයවමින්
ඡායාරූපය උපුටා ගැනීම - *JDS* වෙබ් අඩවිය



2008 දී ආනන්ද් සුදාකරන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගන්නා විට ඔහුගේ බිරිඳ අටමස් ගැබිණියක් වූවාය. බලහත්කාරයෙන් ලබා ගන්නා ලද පාපොච්චාරණයක් මත පදනම්ව 2017 දී ඔහුට ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම විය. 2018 වසරේ දී දස හැවිරිදි සංගීතා සහ දොළොස් හැවිරිදි කනිදරන් මෙලොව තනි කරමින් සුභාකරන්ගේ බිරිඳ මිය ගියාය. සුදාකරන්ට පැය කිහිපයකට තම බිරිඳගේ අවමංගල්‍යයට සහභාගී වීම සඳහා අවසර හිමි විය. "අම්මා අපිව දාලා ගියා. අප්පාත් අපිව දාලා යන්න එපා" කියමින් සංගීතා හඬා වැටුණු බව වාර්තා වේ. සුදාකරන් ආපසු යාමට බන්ධනාගාර බසයට නගින විට පියා අත් නොහරිනු රිසින් සංගීතා ද පියා පසුපසින් ගොස් බසයට ගොඩවූවාය.

ඡායාරූපය උපුටා ගැනීම - 2018 මාර්තු *25 Sunday Observer* වෙබ් අඩවිය



# ලිංගනාදන්ගේ සිට දර්ශන් දක්වා:

# අපි කැමති දෙමළ ප්‍රතිරූපයක මරණය

සටහන : රියෝ

දර්ශන් ධර්මරාජ් හෘදයාබාධයක් හේතුවෙන් පසුගිය ඔක්තෝබර් 2 මිය ගියේය. ඔහු සිඩ්නි චන්ද්‍රසේකරගේ A9 ටෙලි නාට්‍යයෙන් සහ තුෂාර පීරිස් විසින් අධ්‍යක්ෂණය කළ 'ප්‍රභාකරන්' - (2008) චිත්‍රපටය හරහා සිය රංගන ජීවිතය ඇරඹුවේය. ඉන්පසුව ඔහු මචං (2008), ඉර හඳ යට (2009) ඉනිඅවන් (2012), මාතා (2012), නෝ ඇඩ්‍රස් (2015) ආදී නිර්මාණ රැසකට සිය රංගන දායකත්වය සැපයූවේය. ඒ අතරින් අශෝක හඳගම විසින් අධ්‍යක්ෂණය කළ 'ඉනිඅවන්' (2012) චිත්‍රපටය වෙනුවෙන් හොඳම නළුවා - දෙරණ ලක්ස් සිනමා සම්මානය (2013) සහ හොඳම නළුවා - හිරු රන් සිනමා සම්මානය (2014) දිනා ගැනීමට සමත් විය.

දර්ශන්ගේ හදිසි මරණයත් සමඟ දර්ශන් පිළිබඳව විවිධාකාර අදහස් සමාජ මාධ්‍ය හරහා සංසරණය විය. මෙම අදහස් නිරීක්ෂණය කරන විට, පෙනී යන ගැඹුරු දේශපාලනික ගැටළු කිහිපයකි. එකක් ලිංගනාදන් ධර්මරාජ් සිය නළු සිහිනය සැබෑ කරගැනීම පිණිස දර්ශන් ධර්මරාජ් වී සිංහල සමාජය කැමති දෙමළෙක් බවට පත් නොවී නම් දර්ශන් පිළිබඳව වර්තමානයේ සිංහල සමාජයේ නිර්මාණය වී ඇති කතිකා උඩුයටිකුරු වීමේ යථාර්ථයයි. සිංහල සමාජය ආසක්ත වන එකී 'පරිකල්පිත දෙමළා' නොවන වෙනත් දෙමළෙකුට ලාංකීය (සිංහල) සිනමාව තුළ පය ගසා සිටිය හැකිද යන්න දෙවැන්නයි.

## පරිකල්පිත දෙමළා සහ සැබෑ දෙමළා

සිංහල සමාජ මනෝභාවය තුළ විවිධාකාරයේ උපකල්පන මත ගොඩනගන ලද පරිකල්පිත දෙමළෙක් සිටියි. බහුතර සිංහල ජනයා මෙම පරිකල්පිත දෙමළාට කොතරම් ප්‍රේම කරනවාද කිවහොත්, මේ දෙමළා අපි විසින්ම නිර්මාණය කරගන්නා ලද, අපේ ආශාවන් මත අපේ පරිකල්පනය තුළ සිටින දෙමළෙක් වග අමතකව යයි. සිංහල සමාජය විසින් මෙම පරිකල්පිත දෙමළා නිර්මාණය කිරීමෙන් නොනැවතී එම පරිකල්පිත දෙමළා සමඟ සැබෑ දෙමළා සසඳමින්, පරිකල්පිත දෙමළා සේ හැඩ ගැහෙන ලෙස සැබෑ දෙමළාට පවසයි. සිංහල ජනයා සැබෑ දෙමළාගේ ප්‍රශ්නවලට පිළිතුරු සකසන්නේද එකී පරිකල්පිත දෙමළා දෙස බලමිනි. සිංහලයාගේ පරිකල්පිත දෙමළා යනු සිංහල සමාජයේ මතවාදවලට පහසුවෙන් එකඟ වන, සිය ගැලවුම්කාරයා සිංහල සමාජය බවට සිතන, තමන්ගේ දෙමළ ප්‍රභූ තන්ත්‍රයට නිතර රැවටෙන, වාර්ගික දේශපාලන අභිලාෂයක් නැති දෙමළා ය. යම් හෙයකින් දෙමළ ජාතිකයෙක් සතුව වාර්ගික දේශපාලන අභිලාෂයක් තිබේ නම් එම දෙමළා සිංහල සමාජයට තර්ජනයක් බව සිංහලයා සිතයි. දෙමළ ජනයාගේ දේශපාලන ඉල්ලීම් නොසළකා හැර, දෙමළාගේ අයිතිවාසිකම් උල්ලංඝණය කරමින් දෙමළාට එරෙහිව සිදු කරන රාජ්‍ය මර්දනය පිළිබඳව අඳ ගොළු බිහිරන් සේ සිටිමට සිංහල සමාජය උත්සුක වන්නේ එනිසාය.

සිංහල බෞද්ධ චින්තනයේ සීමා මායිම් ලකුණු කිරීම තීරණය කරනු ලබන්නේ මහාවංශය විසිනි. දෙමළාගේ ප්‍රශ්නයට පිළිතුරු සෙවීමටත්, තේරුම් ගැනීමටත් සිදුව ඇත්තේ මහාවංශ චින්තනය විසින් නිර්මාණය කළ ඉතිහාසයෙනි. සිංහලයා සහ දෙමළා එකතුව වෙසන ශ්‍රී ලංකාවක් නිර්මාණය කරනු වෙනුවට මහාවංශ චින්තනය තුළින් නිර්මාණය කර ඇත්තේ දුටුගැමුණු වාදයයි. ඊට අනුව සිංහලයාගේ පරම සතුරා දෙමළාය. ඒ පරම සතුරා වන දෙමළාට සිංහලයා සමඟ එක් වී ලාංකීය අනන්‍යතාවයක් නඩත්තු කිරීමට අවශ්‍ය නම් එම දෙමළාගේ අනන්‍යතාවය සිංහල සමාජය තුළ දියකර දැමිය යුතුය.

මුත්තයියා මුරලිදරන් බී.බී.සී ය සමඟ කරන ලද සාකච්ඡාවක දී පවසන්නේ "තුන් වේල කන එක මේ රටේ ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදයට වඩා වැදගත්" බවයි. සිංහල සමාජයේ බහුතරයක් එම ප්‍රකාශය සමඟ දැඩි ලෙස එකඟ වෙමින් මුරලිව අගය කළහ. ලාංකීය ජාතියක් වශයෙන් ගොඩනැඟීමට නම් මුරලි සේ විය යුතු යැයි ඔවුහු ප්‍රකාශ කරති. මුරලි චැනල් ෆෝ සමඟ කළ සාකච්ජාවක් තුළ දී "යාපනයේදී මව්වරුන් විස්සක්, තිහක් ඇවිල්ලා හඬමින්, වැළපෙමින් කරන පැමිණිලි සත්‍යය බව පිළිගන්නේ කෙලෙසද?" යි විමසමින් උතුරේ අතුරුදහන් කිරීමට ලක් වූවන්ගේ මව්වරුන් පිළිබඳ අදහස් දක්වයි. සිංහල සමාජය විසින් ආශා කරන සහ සිංහල සමාජය වඩාත් තෘප්තිමත් කරන දෙමළා වන්නේ දෙමළා රාජ්‍ය මර්දනයට ලක්වීම මුසාවක් බව කියාපන මුරලි වැනි දෙමළුන්ය. යම් හෙයකින් මුරලි මේ සම්බන්ධව මීට ප්‍රතිවිරුද්ධ අදහසක් දැරුවේ නම්, මුරලිට සිංහල සමාජය තුළ වර්තමානයේදී හිමි ස්ථානයට කුමක් වනු ඇති ද?

දර්ශන් ධර්මරාජ් පිළිබඳව මතු කළ යුත්තේද මෙම සරල යථාර්ථයයි. දර්ශන් රක්වාන වැනි දුර බැහැර අප්‍රසිද්ධ ග්‍රාමයක උපත ලබා බොහෝ කටුක වූ මාර්ගයක් ඔස්සේ පැමිණ සිංහල සිනමාව තුළ සිය ස්ථාවරත්වය තහවුරු කර ගත්තේය. ඔහුම පැවසූ ඔහුගේ ජීවිත කතාවට අනුව දර්ශන් නළුවෙක් වීමට ජීවත්වීම පිණිස බොහෝ දුක් පීඩා විඳි අයෙකි. විශේෂයෙන් යුද්ධය පැවති සමයේ දෙමළ ජනයා පොදුවේ දකුණේ සමාජයට ත්‍රස්තවාදීන් විය. සෑම දෙමළෙකුම සිය දෙමළ බව නිසාම දැඩි පරීක්ෂාවට ලක් විය. එවක නළුවෙක් නොවූ දර්ශන්ටද හිමි වූයේද එම ත්‍රස්තවාදී නාමකරණයමය. දර්ශන් පසුකාලීනව රංගන ජීවිතයට අවතීර්ණ වන්නේත් සිනමාව තුළ කතාබහට ලක්වන්නේත් කොටි සංවිධානය නියෝජනය කරන ත්‍රස්තවාදී යැයි සම්මත චරිත හරහාය. දර්ශන්ගේ නම නොදන්නා බොහෝ පිරිසක් 'කොටි චරිත රඟපෑ දෙමළා' ලෙස දර්ශන්ව හඳුන්වන බව නොරහසකි.



**ප්‍රතිපත්ති සහ ආර්ථික අර්බුද අතර තේරීම**

ඔස්කාර් සිනමා උළෙලෙහි හොඳම නළුවා ලෙස සම්මානයට පාත්‍ර වූ පළමු කළු ජාතික නළුවා වන සිඩ්නි ජ්වාටි, සිය ප්‍රතිපත්තිවලට එකඟ නොවන බැවින් The Phenix City Story (1955) හි රඟපෑම ප්‍රතික්ෂේප කරන ලද්දේ ඔහුගේ රංගන ජීවිතය ආරම්භයේය. එසේම ඔහු වරක් "ඔතෙලෝ" හි රඟපෑම ද ප්‍රතික්ෂේප කළේ ඔහුගේ රංගනයෙහි අනන්‍යතාව ඔහුගේ කළු ජාතිකත්වය බවට පත් වීමට ඔහුට අවශ්‍ය නොවූ හෙයිනි. දර්ශන් රංගන දිවිය ආරම්භ කළේ 'ත්‍රස්තවාදී චරිත' නිරූපණය කරමිනි. එසේ ඔහු සිය දෙමළ අනන්‍යතාවය සිංහල සමාජය ප්‍රිය කරන දෙමළා නඩත්තු කිරීම සඳහා කැප කිරීම ඇරැඹූ මොහොතේම ලිංගනාදන් ධර්මරාජ් නම් දෙමළාගේ අනන්‍යතාවය නඩත්තු කිරීම ඔහු විසින් අත්හැර දමන ලදී. සිංහල සමාජයේ කල්පිත දෙමළා බවට පරිවර්තනය වීම මඟින් ඔහුට දෙමළ වීම නිසා ඇති වූ ප්‍රශ්නවලින් යම් ප්‍රමාණයකට මිදීමට හැකි විය. ලිංගනාදන්ට ප්‍රතිපත්ති මත තීරණ ගැනීමට පසුබිමක් නොතිබුණ අතර ඒ වෙනුවෙන් ඔහුට තේරීමක් කරන්නට සිදු විය.

තමන්ගේ ප්‍රතිපත්ති මත රැඳෙමින් සිනමාව තුළ රැඳීමට උත්සහ දරනවාද, නැතහොත් සිංහල සමාජයේ පරිකල්පිත දෙමළා නඩත්තු කරනවාද යන්නයි. ඔහුගේ තීන්දුව තුළින් ඔහුට සිංහල සිනමාව අතික්‍රමණය කිරීමටත්, සිංහල සමාජය තෘප්තිමත් කරමින් සිංහල ප්‍රේක්ෂකයන් දිනා ගැනීමටත් හැකි විය. නමුත් ලිංගනාදන් සහ දර්ශන් තුළින් නිරූපණය වන එක් සත්‍යයක් පැහැදිලිව පෙනේ. එනම්, සිංහල බෞද්ධ අනන්‍යතාවය කේන්ද්‍ර කරගත් සිංහල සිනමාව තුළ එකී අනන්‍යතාවය අභියෝගයට ලක් කරන හෝ විවේචනය කරන දෙමළ හෝ මුස්ලිම් නළුවෙක්ට ලාංකීය සිනමා කර්මාන්තයත්, සිංහල ප්‍රේක්ෂකාගාරයත් වශී කර ගැනීමට නොහැකි බවයි.

**සිංහල බෞද්ධ අනන්‍යතාවය කේන්ද්‍ර කරගත් සිනමාව**

ලංකාවේ සිනමා වංශකතාව ආරම්භ වන්නේ දෙමළ ජාතිකයන්ගේ දායකත්වය මතය. කර්මාන්තයක් වශයෙන් ලංකාවේ සිනමාව

නගා සිටුවීමට දෙමළ නිෂ්පාදකවරු, කැමරා ශිල්පීහු, සංගීත අධ්‍යක්ෂවරු බොහෝ සේ කැප වූහ. ලංකාවේ පළමු කතානාද චිත්‍රපටය වන 'කඩවුණු පොරොන්දුව '(1947) නිර්මාණය කළේ දෙමළ ජාතිකයෙක් වන එස්.එම්. නාගයම් විසිනි. දේශීයව නිපදවූ පළමු චිත්‍රපටය වන ලෙස්ටර් ජේම්ස් පීරිස් අධ්‍යක්ෂණය කළ 'රේඛාව' (1956) නිර්මාණය කිරීමෙන් පසුව සිනමාව සඳහා රාජ්‍ය අනුග්‍රහය හිමි වූ අතර සිංහල අනන්‍යතාවය පදනම් කරගත් සිනමා නිර්මාණකරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු විය. දෙමළ සිනමාව කෙරෙහි රාජ්‍ය අනුග්‍රහයක් හෝ අවධානයක් යොමු නොවූ අතර ලාංකීය සිනමාව ලෙස පොදුවේ ව්‍යවහාරයට ලක් වුවද එම සිනමාව තුළ දෙමළ සිනමාව බිඳ වැටෙමින් හුදකලා විය.

තවද, දේශීය සිනමාව වශයෙන් සිංහල බෞද්ධ අනන්‍යතාවය පදනම් කරගත් සිනමාව දියුණු වූ අතර එම කර්මාන්තය පොදුවේ ලාංකීය සිනමා කර්මාන්තය ලෙස ව්‍යවහාරයට ලක් විය. එකී සිංහල සිනමාව තුළ සිංහල බෞද්ධ සමාජය විසින් මුහුණ දුන් ප්‍රශ්න පිළිබඳ චිත්‍රපට නිර්මාණය වූ අතර පසුකාලීනව එම සිංහල බෞද්ධ අනන්‍යතාවයට හානි කරන පිරිස් ද්‍රෝහීන් ලෙස වර්ග කරමින් ප්‍රචාරණවාදී චිත්‍රපට නිර්මාණය වීම දක්වා එය වර්ධනය විය. ලංකාවේ සිවිල් යුද්ධය කේන්ද්‍ර කරගනිමින් නිර්මාණය කළ චිත්‍රපට බොහොමයක් මෙසේ ප්‍රචාරණවාදී (Propaganda) චිත්‍රපට වූ අතර ඒ තුළින් සමාජ ගත කළේ යුද්ධය පිළිබඳව ඒක පාර්ශ්වික කියවීමකි. අනෙක් පසෙන් ඓතිහාසික සිංහල බෞද්ධ ආගමික කතා සිනමාකරණය හරහා සියුම් අයුරින් අන්‍යාගමිකයන් නිර්දය ලෙස විවේචනයට ලක් කරන ලදී. සනත් ඔබේසේකර විසින් අධ්‍යක්ෂණය කළ අනගාරික ධර්මපාලගේ චරිතය පදනම් කරගත් 'අනගාරික ධර්මපාල ශ්‍රීමතාණෝ' එයට හොඳම නිදසුනකි.

දර්ශන් ධර්මරාජ් ලාංකීය සිනමා කර්මාන්තය යැයි සැබෑ ලෙස ගනුදෙනු කළේ මෙකී සිංහල බෞද්ධ අනන්‍යතාවය කේන්ද්‍ර කරගත් සිංහල සිනමාව තුළය. එකී සිනමාව තුළ දර්ශන්ට හිමි වුණේ සිංහල ජනයා දකින්නට කැමති 'ත්‍රස්තවාදියාගේ' චරිතයයි. දර්ශන් එම චරිත රඟපෑම ප්‍රතික්ෂේප කළේ නම් ඔහුට සිංහල සිනමාව තුළ ඔහුගේ නළු සිහිනය යථාර්ථයක් කර ගැනීමට ඉඩක් හිමි වනු ඇතිද? දර්ශන් විසින් රඟපෑ එම චරිත සිංහල ප්‍රේක්ෂකාගාරය වශී කිරීමට සමත් වූයේ සිංහල ප්‍රේක්ෂකයන්ගේ පරිකල්පිත ලෝකය තෘප්තිමත් කළ හැකි වූ හෙයිනි. දර්ශන් පණ පෙව්වේ සිංහල ප්‍රේක්ෂකාගාරය බලාපොරොත්තු වන දෙමළාගේ චරිතයටයි. සිංහල ගැළවුම්කාර මානසිකත්වය ආමන්ත්‍රණය කළ ගාමිණි, ප්‍රභාකරන් වැනි චිත්‍රපටවල දර්ශන්ගේ රඟපෑමට සිංහල ප්‍රේක්ෂකයන් වඩාත් ප්‍රිය කරන්නේ එම නිසාය.



### පරිකල්පිත දෙමළා අභියෝගයට ලක් කිරීම

උතුරේ බිහි වූ ජ්‍යෙෂ්ඨ සිනමාකරුවෙක් වන කේසවරාජන් නවරත්නම් පසුගිය වසරේ මිය ගියේය. ඔහු අවම පහසුකම් යටතේ යුධ වාතාවරණය මැද සිනමාකරණයේ නියැලුණු දක්ෂ අධ්‍යක්ෂවරයෙකි. ඔහුගේ 'අම්මා නල්ලමා?' (අම්මේ, සුවෙන්ද?) සිනමා පටය හරහා සන්නද්ධ අරගලයේ යෙදුණු දෙමළ ජනයාගේ ජීවන යථාර්ථයත්, 'කඩලෝර කාට්රු' (මුහුදු සුළං) සිනමාපටය තුළින් දෙමළ සන්නද්ධ අරගලයේ අත්දැකීමුත් "පනෛමරක්කාඩු" (තල් කැලෑව) සිනමා පටය හරහා යුද්ධයට මුහුණ දුන් මිනිසුන්ගේ මිනිස් සබඳතාත් සිනමාවට නැඟීමට උත්සාහ කළේය. නමුත් ලාංකීය සිනමාව හෝ දකුණේ සමාජය ඔහුගේ හදිසි මරණය පිළිබඳව කිසිදු ලෙසකින්වත් සංවේදී වූයේ නැත. දර්ශන් පිළිබඳවත්, ලංකාවේ දෙමළ සිනමාව ගැනත් වර්තමානයේ සංවේදී වෙමින් සිටින කලාකරුවෝ බහුතරයක් එදා කේසවරාජන්ගේ වියෝවෙන් කම්පිත වූයේ නැත. එයට හේතුව කේසවරාජන් සිංහල සමාජය මවාගෙන සිටි කල්පිත දෙමළාට ප්‍රතිවිරුද්ධ අදහස් දරමින් ජීවත් වූ දෙමළෙකු නිසාද? සිංහල සමාජය ආකර්ෂණය කරමින් නිර්මාණය වූ යුධකාමී, දෙමළ වැසියන් දුෂ්ටයන් කරමින් සහ යුද්ධය පිළිබඳව ඒක පාර්ශ්වික මෙන්ම අර්ධ සත්‍ය කරුණුද සමාජ ගත කරමින් නිර්මාණය වූ සිංහල සිනමාපට විවේචනය කළ කේසවරාජන් උතුරේ දෙමළ වැසියන්ට යුක්තිය ඉටු විය යුතු බවට විශ්වාස කරමින් ඒ වෙනුවෙන් අදහස් දැක්වූ අයෙකි. එබැවින් සිංහල සමාජය පිළිගන්නා, ඔවුන්ගේ පරිකල්පිත දෙමළාට සාපේක්ෂව කේසවරාජන් යනු සැබෑ දෙමළෙකි, එනම් ද්‍රෝහියෙකි. කේසවරාජන් දකුණේ කලාකරුවන් සමඟද ගනුදෙනු කළ දෙමළ සිනමාවේ පශ්චාත් යුධ සිනමාවේ පශ්චාත් යුධ සමයේ පුරෝගාමී චිත්‍රපට අධ්‍යක්ෂකවරයෙකි. ජාතිකත්වය මත බෙදීම් බණ්ධනය නොවුණ ලාංකික සිනමාවක් පැවතියේ නම් කේසවරාජන්ගේ සිනමා නිර්මාණ සඳහා මීට වඩා අවධානයක් සහ ඇගයීමක් ලැබෙන්නට ඉඩ තිබුණි. එසේම එම සිනමා නිර්මාණ දකුණේ සිංහල ප්‍රේක්ෂකාගාරය වෙත පැතිරීමටද ඉඩ තිබුණි. නමුත් අප රටේ ලාංකීය සිනමාවක් නොමැතිකම නිසාවෙන් දෙමළ සිනමාවේ පශ්චාත් යුධ සමයේ පුරෝගාමී චිත්‍රපට අධ්‍යක්ෂවරයෙක් වූ කේසවරාජන් තවත් එක් දෙමළෙක් පමණක් විය. එම නිසා කේසවරාජන්ට දකුණේ සිංහල සිනමාව අතික්‍රමණය කිරීමට නොහැකි විය. සිංහල සිනමාව අතික්‍රමණය කිරීමට නම් සිංහල සමාජය ප්‍රිය කරන දෙමළෙකු විය යුතුය. එසේ වීමට නම් කේසවරාජන් හටසිය දෙමළ අනන්‍යතාවය දිය කිරීමට සිදු වන අතර, ඒ වෙනුවට ඔහු තෝරා ගනු ලැබුවේ සිංහල සමාජයේ පරිකල්පිත දෙමළාට අභියෝග කිරීමයි. එබැවින්, කේසවරාජන්ගේ මරණය හෝ ඔහුගේ නිර්මාණ පිළිබඳව සිංහල ජනතාව සංවේදී නොවීම අරුමයක් නොවේ.

ආගමන විගමන නීති උල්ලංඝණය කිරීමේ චෝදනාව මත වව්නියාව,මාන්කුලම්හිදී අත්අඩංගුවට ගෙන ලංකාවෙන් පිටුවහල් කළ කිවියර වී.අයි.එස්. ජෙයබාලන් ගැනද සංවේදී වීමට දකුණේ සමාජයට හෝ දකුණේ කලාකරුවන්ට අමතක විය. ජෙයබාලන් යනු ලාංකීය දෙමළ කවියෙකි. එමෙන්ම වර්තමානයේදී දකුණු ඉන්දියානු සිනමා නළුවෙකි. ලංකාවේ උපත ලද ඔහු යාපනය

විශ්වවිද්‍යාලයේ පළමු ශිෂ්‍ය සංගම් නායකයාද විය. නමුත් 2013 දී ඔහුව ත්‍රස්තවාදියෙකු ලෙසත්, ජාතීන් අතර වෛරය පතුරුවන්නෙකු ලෙසත් නම් කරමින් සිය මව් රටෙන් පිටුවහල් කරන විට ඊට විරුද්ධත්වයක් ලාංකීය සිනමාවෙන් හෝ කලාකරුවන්ගෙන් යොමු වූයේ නැත. ඔහු පිටුවහල් කිරීමේදී එම කලකාරුවෝ නිහඬ වූහ. දකුණේ සමාජය ජෙයබාලන් ත්‍රස්තවාදියෙකු ලෙස නම් කරමින් දිවා වරුවේ ඔහු රඟපෑ චිත්‍රපට ආශාවෙන් නැරඹීය. සිංහල සමාජයට ප්‍රශ්න තිබෙන්නේ කොලිවුඩ් සිනමාවේ රඟපාන ජෙයබාලන් සමඟ නොව, සිංහල සමාජය මවාගෙන සිටින පරිකල්පිත දෙමළාට අභියෝග කරන ජෙයබාලන් සමඟය. එබැවින් එකී ජෙයබාලන් පිළිබඳව සිංහල සමාජය හෝ දකුණේ සිංහල කලාකරුවන් සංවේදී නොවීමද අරුමයක් නොවේ.

ශ්‍රී ලාංකීක සම්භවයක් සහිත කලාකරුවන් අතරින් ලෝකයේ වඩාත් ඉහළ ජනප්‍රියත්වයක් ලබා සිටින පොප් තරුවක් ලෙස මතංගි "මායා" අරුල්ප්‍රගාසම් හෙවත් MIA හැඳින්විය හැක. යාපනයේ ඉපිද පසුකාලීනව සරණාගතයෙකු ලෙස බ්‍රිතාන්‍යයට ගොස් පසුව පොප් තරුවක් වූ ඇයගේ නිර්මාණ බොහෝමයකට යුද්ධය, සමාජීය ප්‍රශ්න සහ දේශපාලන ප්‍රචණ්ඩත්වය තේමාවන් විය. නමුත් ශ්‍රී ලංකාව තුළ ඇය සළකන්නේ ද්‍රෝහියෙකු ලෙසය. එයට හේතුව ඇය විසින් දේශපාලනික කාරණා මතු කිරීම සහ උතුරේ සිවිල් යුද්ධයේදී රජය විසින් දෙමළ වැසියන්ට එරෙහිව සිදු කරන ලද ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ අදහස් දැක්වීමය. ඇය මතු කරන ලද කාරණා පිළිබඳව දකුණේ බහුතරයක් වූ සිංහල සමාජයට තවමත් තේරුම් ගැනීමට වුවමනාවක් නොමැති අතර තමාට වාසිදායක වන බැවින් එම කරුණු සිතාමතාම අමතක කිරීමට ඔවුහු උත්සාහ කරති. ඒ තරමට සිංහල සමාජය රාජ්‍ය අපරාධකාරීත්වය ස්වභාවීකරණය කර ගනිමින් සිටියි. MIA යුද්ධය නාමයෙන් සිදු වූ වර්ග සංහාරය පිළිබඳව ප්‍රසිද්ධියේ අදහස් දැක්වූ අතර, දෙමළ ජනතාව ආරක්ෂා කිරීමටත් ඔවුන්ට යුක්තිය ඉටු කිරීමටත් ඒ සඳහා ජාත්‍යන්තරය මැදිහත් වීමේ අවශ්‍යතාවයත් අවධාරණය කළාය. එබැවින්



මතංගි "මායා" අරුල්ප්‍රගාසම් හෙවත් MIA සිංහල සමාජ දෘෂ්ටි කෝණයට අනුව විරෝදාර සිංහල හමුදාවට අපහාස නගන රජය අපහසුතාවයට පත් කරමින් රට පවා දෙන ද්‍රෝහී කාන්තාවකි.

සිංහල සිනමාව තුළ සිංහල සමාජයේ පරිකල්පිත දෙමළාගේ චරිතයට පණ පෙවූ පළමු සහ අවසාන දෙමළා දර්ශන් නොවේ. ඔහුට පෙර සිංහල සමාජයේ කල්පිත දෙමළාට අනුගත වෙමින් රංගනයේ නිරතවූවන් ලෙස මර්වින් මහේෂන්, නඩරාජා ශිවම් යනාදි පුද්ගලයන් නම් කළ හැකිය. ප්‍රශ්නය වන්නේ ඔවුන්ට සිංහල සමාජයේ පරිකල්පිත දෙමළාට අභියෝග කරමින් නැගී සිටීමට නොහැකි වූයේ ඇයිද යන කාරණයයි. ලාංකීය සිනමාවක් වෙනුවට සිංහල බෞද්ධ අනන්‍යතාවය පදනම් කර ගනිමින් වර්ධනය වූ ශ්‍රී ලංකාවේ සිනමාව තුළ දෙමළ සිනමාවේ බිඳ වැටීමත් සමඟ සිනමා නළුවෙක් ලෙස මතු වීමට නම්, සිංහල සිනමාව තුළ ඉහළට යාමට නම් සිංහල ප්‍රේක්ෂකයා තෘප්තිමත් කරන පරිකල්පිත දෙමළා බවට පරිවර්තනය වීම හැර වෙනත් කිසිදු අවස්ථාවක් නොමැත. මේ ප භේදවාචකය ප්‍රශ්න කිරීමට බොහෝ දෙනා මැළි වෙති.

ශ්‍රී ලංකාවේ කලාකරුවෝ වනාහී අසාධාරණය හමුවේ නිහඬ වන, රාජ්‍ය මර්දනය සමඟ අත්වැල් බැඳ ගන්නා පිරිසකි. 1973 ඔස්කාර් හොලිවුඩ් සිනමා කර්මාන්තය තුළ සිදු වූ අසාධාරණකම්වලට මාලන් බ්‍රැන්ඩෝ සිය විරෝධය ප්‍රකාශ කළේය. එහෙත් දකුණු කේන්ද්‍රීය ලාංකීය සිනමාව තුළ මාලන් බ්‍රැන්ඩෝ කෙනෙක් තවමත් බිහි වී නැත.

**දෙ**මළ කෙටි කතා දහයක සිංහල පරිවර්තනයක් වන 'වීණාවක් රැගෙන ගිය දරුවා' කෙටි කතා සංග්‍රහය කඩුල්ල ප්‍රකාශනයක් ලෙස ලබන 25 වනදා එළිදැක්වීමට නියමිතව ඇත.

ජී.ජී සරත් ආනන්ද විසින් පරිවර්තනය කරන ලද මෙම කතාවල වස්තු විෂයන් බවට පත් ව ඇත්තේ, රාජ්‍ය විසින් දෙමළ ප්‍රජාවට එරෙහිව සිදු කළ මර්දනයන් ය.



කෙටිකතාව

## ආන්මෛඉල්ලාදවන් (1993)

# පීඩිතයෙක් නොවන්නා

### සෙ. ගනේසලිංගන්



**මෙය මුල්වරට 1998 වසරේ දී ලංකා කලා සංගමය විසින් ප්‍රකාශයට පත් කළ 'නිදහස් ලංකාවේ දෙමළ කෙටි කතා' කෘතියෙහි ඇතුළත් විය.**

"අයියේ, ඔයාගෙන් උදව්වක් ඉල්ලන්නයි ආවේ. ඔයා කොහොම හරි මට මේ උදව්ව කරන්න ඕනේ."

මම එදින උදෑසන කොළඹ සිට යාපනයේ පිහිටි මගේ ගමට ඥාතීයෙකුගේ විවාහයක් සඳහා පැමිණ සිටියෙමි. ළිඳ අසලට වී අත් පා සෝදමින් සිටි මම හඬ ඇසී හැරී බැලුවෙමි. අප නිවස ඉදිරිපස නිවසේ සිටින පුෂ්පම් ශෝකය පිරුණු මුහුණෙහි මඳ සිනහාවක් සමඟින් සිටගෙන සිටියා ය.

මෙය හවුල් ළිඳකි. එහි අයිතිය පවුල් හතරක් සතු ව පැවැතුණි. එහි බොලොක්ක දෙකක් විය. මම ළිඳෙහි ජලය ගෙන පානය කළෙමි. එය ඉතා මිහිරි ය. කොළඹ ක්ලෝරීන් මිශ්‍ර ජලය දෛනිකව නළයෙහි ගමන් කළ ද, ගමේ ඇති අපගේ ළිඳෙහි ජලයට එය සමාන කළ නොහැක. අත් පා සේදීමට, නෑමට ළිඳට යාම මම පුරුද්දක් කරගෙන සිටියෙමි.

පුෂ්පම් අපගේ නිවසට පැමිණෙන්නේ නැත. ඇය මගේ මල්ලිගේ බිරිඳ සමඟ දබරයක් ඇති කරගත්තා විය හැක. මම ඒ ගැන නොවිමසුවෙමි.

මම ගමට ආ විට අලුයම කොහොඹ අරටුවක් සමඟින් ඔවුන්ගේ නිවසට ගොස් සැප දුක විමසමි. වැන්දඹුවක් වූ මව සහ තවත් සහෝදරියක් නිවසෙහි සිටියහ. ඔවුන් පානය කිරිමට ලබා දෙන එළු කිරි මිශ්‍ර කෝපි කෝප්පය ඉතා ප්‍රණීතය.

"මොකක්ද ඕන උදව්ව කියලා කියන්න. පුළුවන් දෙයක් නම් කරන්නම්."

"ඒ ගැන අහන්නයි ආවේ.. මට උදව් කරන්න කවුරුත් නැහැ. මහේන්ද්‍රන්ව පොලිසියෙන් ඇල්ලුවා.."

ඉන් අනතුරුව ඇයට කතා කිරීමට නොහැකි විය. පපුව සිර වී ඉකි බින්දා ය.

මම කළ යුත්තේ කුමක්දැයි නොදැන අසරණ වුණෙමි. මුහුණ පිස දමමින් ඇයගේ පිටට තට්ටු කිරීමට උත්සහා කළෙමි. ළිඳ අසල සිටි ඇය ඉකිබිඳින හඬ ඇසී අප දෙස කවුරුන් හෝ බලනු ඇතැයි නොසිතා ඇය අඬමින් සිටියා ය. නැනා නිවසින් පිටතට පැමිණ අප දෙස බලා යළි ගියා ය.

ගමට පැමිණි විට ළිඳ අසල දී සැප දුක් විමසීම බොහෝ අය පුරුද්දක් කරගෙන සිටියහ. මා ළිඳ අසල සිටිනු දුටු විට අනෙක් නිවසේ සිටින කුලවතී පැමිණෙයි.

නිවසේ සිටින කුලවතී පැමිණෙයි.

'මොනවද ගමේ අලුත් තොරතුරු' යනුවෙන් ඇසුවොත් ඇය ගමෙහි සියලු පුවත් විනාඩි කිහිපයකින් සංස්කරණ කරන පවසයි. විවාහ, මරණ, දබරයේ සිට දේශපාලන පුවත් පවා ඇය කියයි. විමුක්ති සංවිධානයේ පිරිස් පැමිණෙන වේලාවන්, පොලිස් සෝදිසි මෙහෙයුම් සම්බන්ධයෙන් වන සියලු තොරතුරු ඇයගෙන් දැනගත හැක. කොළඹ සිට පැමිණෙන විට දුම්රියේ දී කියවීමට රැගෙන එනු ලබන පොත් ඇය තම නිවසට රැගෙන යනු ලබන්නේ ඇයට අයිති දේපළක් ලෙස සලකමිනි.

මීට පෙර පැමිණි අවස්ථාවේ දී, පුෂ්පම් මහේන්ද්‍රන්ට ආදරය කරන බවට කුලවතී පැවසුවා ය. පසුදින පුෂ්පම්ගේ නිවසට ගොසින් මවගේ සුව දුක් විමසා, කෝපි බොමින් සිටින විට පුෂ්පම් සිනාසෙමින් කතා කළා ය. ඇයගේ ප්‍රේමය සම්බන්ධයෙන් කිසිවක් පැවසුවේ නැත. මම ද ඒ ගැන නො විමසුවෙමි.

"හොඳින් ඉගෙනගන්නවා ද..?" යනුවෙන් පමණක් ඇසුවෙමි.

"මෙහෙ දේශපාලනය විතරයි, කාටවත් ඉගෙනගන්න උවමනාවක් නැහැ.." මව චෝදනා කළා ය.

පුෂ්පම් බිම බලමින් සිනාසුණා ය. ඇයගේ ප්‍රේම සබඳතාව සම්බන්ධයෙන් මට තොරතුරු ලැබී ඇති බවට ඇය දැන සිටියා විය යුතුය. එය කුලවතී මාර්ගයෙන් සිදුවන්නට ඇත යන්න නොරහසකි.

"දැන් මහේන්ද්‍රන් කොහෙද..?"

ඉකිබිඳීම පහව ගිය පසුව මම ඇසුවෙමි.

"කොළඹ හතර වෙනි තට්ටුවේ ප්‍රශ්න කිරීම් අවසන් කරලා, බූස්ස කෑම්ප් එකට අරන් ගියා කියලා කිව්වා.."

ඇය පීරා නොමැති කොණ්ඩය ගොතා සිටියා ය. සායක් සහ කොලර් සහිත කමිසයක් ඇඳ සිටි ඇය මුහුණ දිගේ ගලා යමින් තිබූ කඳුළු පිට අල්ලෙන් පිස දැම්මා ය.

"ගෙදරට යන්න. අනිද්දා මම කොළඹට යනවා. හෙට උදේට අම්මාව බලන්න එන්නම්. ඔයා දන්න දේවල් ලියලා තියන්න. කොළඹ ගිහින් පුළුවන් උදව්වක් කරන්නම්."

ඇයව සනසවා පිටත් කළ පසුව, දුරින් අප දෙස අවධානයෙන් බලා සිටි කුලවතී පැමිණියා ය. ඇය මා සමඟ නිවස තුළට ඇතුළු වී මහේන්ද්‍රන් අත්අඩංගුවට ගත් අයුරු සහ හේතුව විස්තරාත්මකව පැවසුවා ය. මගේ නැනා සමඟ ගමේ ඕපාදූප කතා කිරීම ද ඇය පුරුද්දක් කරගෙන සිටියා ය.

"අම්මා මේකට විරුද්ධ වුණේ නැද්ද..?"

"ඉස්සර පොලිටොයිල් ගැන කියලා බය කළා.. දැන් සංවිධානය ගැන කියලා බය කරනවා.."

කුලවතී සිනාසෙමින් එහි ඇති යථාර්තය පැවසුවා ය. මම මහේන්ද්‍රන්ව හොඳින් හඳුනමි.
ඔහු අධ්‍යාපනය ලබමින් සිටියේ ය. මගතොට දී දුටුවහොත් සැප දුක් විමසා කතා කරයි. තර්ක කිරීමට වඩා ඔහුගේ වදන් තුළ හැඟුම්බර බවක් ගැබ් ව තිබුණි. ඔහුගේ හැඟුම්බර බව දිනෙක හමා ඒමට නියමිත සුළිකුණාටුවක නිමිති වූ බව අද දැකගත හැක.

"කොළඹ දී ඔයා ආශ්‍රය කරන සිංහල අය හොඳ වෙන්න පුළුවන්. නමුත් මෙහෙ නොදන්න සිංහල භාෂාවෙන් කතා කරමින් පහර දෙන පොලිස්කාරයන්වත්, දෙමළුන්ට වෙඩි තියලා පුහුණු වෙන හමුදාකාරයන් ව තමා අපි දන්නේ. එයාලාවයි නිතර ම දකින්නේ."

අවසන් වතාවට ඔහුව හන්දියේ දී දුටු අවස්ථාවේ දී කිව්වේ ය. උසස් අධ්‍යාපනය ප්‍රතික්ෂේප කිරීම, විරැකියාව, බලහත්කාරයෙන් සිංහල භාෂාව ඉගැන්වීම, ඔහු වගේ අනෙකුත් තරුණයන් ද කතා කළහ. නිවසේ දී මල්ලිගේ බිරිඳ සමඟත් මා හට තර්ක කළ නොහැකි විය.

පොලිස්, හමුදා පීඩාවන්ට එම කාලයේ දී ඉතා දැඩිව පැවැතුණි.

කොළඹට පැමිණි පසු ව දුම්රියේ ගමන් කරන විට මහේන්ද්‍රන්ගේ ප්‍රශ්නය සිතා දුක් වුණෙමි. පුෂ්පම්ගේ දුක, ඇඩීම සහ ඉල්ලීම මගේ නින්දට බාධාවක් විය.

කලාකරුවන් ප්‍රේමයට අසීමිත වැදගත්කමක් ලබා දී තරුණයන්ගේ හැඟීම් අවුස්සා ඔවුන් දෙස බලා සිටින බවට මගේ විශ්වාසයයි. එහෙත් පෙම්වතුන්ව වෙන් කළ යුතු යැයි මම යෝජනා නො කරමි. පෙම්වතුන් වෙන් වීමේ දී ඇති වන තාවකාලික දුකට වඩා ඔවුන් එක් වී පවුල නමැති සංස්ථාවට ඇතුළු වීමෙන් අනතුරුව ලබන අත්දැකීම් තුළින් ප්‍රේමය මුසාවක් බව තේරුම් ගත යුතු බව මගේ තර්කයයි. තමන් කැමැත්තෙන් විවාහ වන විට තම පරාජයන් අනෙකාගේ හිස මතට පැටවීම අනවශ්‍ය නො වන බව සිතමින් මම එම මතයේ සිටියෙමි.

මම කොළඹට පැමිණ රැකියාවේ නිරත වෙමින් සිටියෙමි. එදින පුෂ්පම්ගේ හිත සනසා පිටත් කළ ද, ක්‍රියාවෙන් ජය ගැනීමෙහි ඇති අපහසුතාවය දැන සිටියෙමි. ප්‍රශ්න කරමින් සිටින්නේ ද, නඩු ගොනු කර තිබේ ද ආදී කිසිවක් නොදනිමි.

කාර්යබහුල වේලාවෙහි ද නිතර පුෂ්පම්ගේ කඳුළැලි මගේ පපුවට වැදී මට බාධා කරන්නට විය.

මම නීතිඥ මිත්‍රයෙකුගේ සහාය පැතුවෙමි. "මාස 18 ක් රඳවාගෙන තියාගන්න පුළුවන්. පී.ටී.ඒ නීතිය එයාලාගේ අතේ තියෙනවා. හොයලා බලන්නම්." යනුවෙන් පැවසුවේ ය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්බන්ධයෙන් මම හොඳින් දනිමි.

නීතිඥ මිත්‍රයාගෙන් ද විශ්වාසයක් ඇති වන ආකාරයෙන් පිළිතුරක් ලැබුණේ නැත. එහෙත් මෙම විමර්ශන භාර පොලිස් නිලධාරීයා සහ පොලිස් කොට්ඨාසය සම්බන්ධයෙන් ඔහු තොරතුරු ලබා දුන්නේ ය.

සති ගණන් ගෙවී ගිය ද පුෂ්පම්ට කිසිදු පිළිතුරක් යැවීමට නොහැකි විය. කාලයා මට පිහිට වනු ඇතැයි සිතමින් මම සිත සනසා ගත්තෙමි.

එදින ලන්ඩන් සිට පැමිණෙන මිත්‍රයෙකු හමුවීමට කටුනායක ගුවන් තොටුපළට ගොස් සිටියෙමි. මිත්‍රයාගේ පැමිණීම වෙනුවෙන් බලා සිටි අවස්ථාවේ දී, මීට පෙර සමීපව ආශ්‍රය කළ ඒ.එස්.පී ඒකනායක ව මට හමුවිය. විමර්ශනයක් හරහා අපි දෙදෙනා අතර සමීප ආශ්‍රයක් ගොඩ නැඟී තිබිණ. ඒකනායක පොලිස් අධිකාරිවරුන්ගේ සංගමයේ ලේකම් ලෙස කොළඹ සිටියේ ය. ඔහුට අවශ්‍ය මුද්‍රණ කටයුතු සඳහා මා වෙත පැමිණෙයි. මම ඔහුට නොයෙකුත් ආකාරයෙන් සහාය වී ඇත්තෙමි. පොලිස් පරීක්ෂක ලෙස සිටි ඔහු ඒ.එස්.පී ලෙස උසස් වීම් ලබා වෙනත් දිස්ත්‍රිකයකට ස්ථාන මාරුවක් ද ලබා සිටියේ ය.

ඔහුගේ සැප දුක් විමසා, උසස් වීමට සුබ පැතුවෙමි.

"පාරේ දී අහනවා කියලා හිතන්න එපා.. මට උදව්වක් කරන්න පුළුවන් ද..?"

"ඒකට මොකද..? මට කරන්න පුළුවන් නම් ඔයා වෙනුවෙන් කරනවා නේ.. අනිවාර්යයෙන් කරන්නම්.."

මම සියලු විස්තර කෙටියෙන් පැවසුවෙමි. මගේ ගමේ, අසල්වැසි කාන්තාවට පොරොන්දුවක් ද ලබා දී පැමිණි බව කිව්වෙමි.

"කොල්ලාගේ විමර්ශන කටයුතු කරන පොලිස් ඉන්ස්පෙක්ටර්ගේ නම දන්නවා ද..?"

"සනත් සිල්වා.."

"ආහ්.. ඒකා ද..? හෙන දරුණු එකෙක්. අද වෙනකම් මොනවා කරලා ද කියලා දන්නේ නැහැ. උත්තරයක් ගන්න ඕනෑම දෙයක් කරනවා. අපි කියන එකවත් ඌ අහන්නේ නැහැ. එහෙත් මම උත්සහ කරලා බලන්නම්. මේකට උඹලාගේ වාසනාවත් තියෙන්න ඕනේ.."

පොලිස් නිලධාරියෙකු ගැන තවත් පොලිස් අධිකාරියෙකු ලබා දුන් සහතිකය සිතා මම පුදුම වුණෙමි.

මහේන්ද්‍රන්ගේ නම ඇතුළු විස්තර ඔහු ලියා ගත්තේ ය. මහේන්ද්‍රන්ගේ තොරතුරු දැනගැනීමට මම හොඳ උත්සහයක් කළා යැයි සිත තෘප්තිමත් කර ගත්තෙමි. මෙය අවසන් උත්සහාය යැයි සිතා ගත්තෙමි.

මගේ මල්ලි වෙත යැවූ ලිපියක අල්ලපු ගෙදර සිටින පුෂ්පම් හට පවසන ලෙසට කෙටි සටහනක් තැබූවෙමි.
"වැඩේ හරියට කරන්න පුළුවන් යාළුවෙකුට කිව්වා, ඉතිරිය ඔයාගේ වාසනාව..."

පොලිස් නිලධාරීන් විසින් යාපනයේ තරුණයන් ව නිතරම අත්අඩංගුවට ගන්නා බවට වන ප්‍රවෘත්ති දෛනිකව පුවත්පත්වල පළ වෙමින් තිබුණි. පාලනය කළ නොහැකි අයුරින් ඇතැම් සිද්ධීන් ද සිදු වී තිබුණි.

ආයුධ සහිතව ජීප් රථයේ සිටින පොලිස් නිලධාරීන්ව හැර වෙනත් සිවිල් වැසියෙකු එම ප්‍රදේශවල දැකීමට නොහැකි විය.

මාස දෙකක් පමණ ගත වී තිබුණි. මගේ බාප්පා හදිසියේ මිය බවට වන පුවත රාත්‍රියේ දී ලැබුණි. උදෑසන යාල්දේවි දුම්රියේ නැග දහවල් දුම්රිය ස්ථානයේ සිට අවමඟුලට සහභාගී වීමට ගියෙමි. අවසන් කටයුතු සිදු කරන විට සවස් කාලය උදා වී තිබුණි. නා නිවසට පැමිණ නිදාගත්තෙමි. ගමන් තෙහෙට්ටුව තදින් දැනුණි.

උදෑසන ළිඳ අසලට පුෂ්පම් සිනාසෙමින් දිව ආවා ය.

"අයියේ, ඔයාගේ උදව්වට කොහොම ස්තුති කරන්න ද මන්දා, ඔයාගෙන් පණිවුඩය ඇවිත් සතියකින් එයාව නිදහස් කළා.." ඇයගේ මුහුණේ කෘතවේදී සිනහාවකි. ඇයගේ දත් දිලිසුණි.

ඒ.එස්.පී. ඒකනායක කළ උදව්ව ගැන දැන ගැනීමෙන් මම සතුටු වුණෙමි. ඔහු කෙරෙහි තිබූ ගරුත්වය තවත් වැඩි විය.

"මට මහේන්ද්‍රන්ව හමුවෙන්න ඕනේ. එන්න කියන්න.."

"අපි ගොඩාක් දුක්විඳලා, ඔයාගේ උදව්වෙන් එළියට ඇවිත් එයා තාම මේ පැත්තට ආවේ නැහැනේ, බලන්න කෝ අයියේ.."

ඊට වඩා ඇයට කිසිවක් කීමට නොහැකි විය. ඉකිබින්දා ය. මම නැවතත් අසරණ වීමි.

"මොනවාද වුණේ..? එයා කොහෙද ලියුමක්වත් දැම්මේ නැද්ද..?"

ඇයගේ ඇඬීම නතර වීමට බොහෝ වේලාවක් ගත විය. පසුව දරුවෙකු මෙන් ඉකි ගසමින් පැවසුවා ය.

"ලියුමක් දැම්මේ නැහැ. එයාගේ ගෙදරට කිව්වෙත් නැහැ.."

"එහෙම නම් කොහෙටද ගිහින් තියෙන්නේ..?"

"තලවාකැලයේ ඉන්නවා කියල එහෙ කඩයක් කරන කන්දයියර් ලියුමක ලියලා එවලා තිබුණා."

"එහෙ මොනවාද කරන්නේ..?"

"වතු වෘත්තිය සමිතියකට සම්බන්ධ වෙලා වැඩ කරනවාලු, එයා මීට කලින් කොහොමද මාත් එක්ක ආශ්‍රය කළේ කියලා ගමේ හැමෝම දන්නවා. කොයි තරම් පොරොන්දු දුන්නා ද..? මාස ගණන් අඬාගෙන හිටිය මාව එක සැරයක් ඇවිත් බලන්න තිබුණා නේ..? මගේ හිත සනසවන්න පුළුවන් නේ.."

නැවතත් ඇය ඇඬීමට පටන් ගත්තා ය. මහේන්ද්‍රන් කෙරෙහි මා තුළ කෝපයක් ඇති විය.

විමුක්තිය පතා සටන් කළේ මෙවැන්නන් ද..? පුරුෂයන් නොවන අධමයන්. මම සිතින් බැන වැදුණෙමි.

"අයියේ, ලියුමක් ලියලා දාන්නත් ලිපිනයක් නැහැ. මං වෙනුවෙන් එයාව හමුවෙලා මගේ තත්ත්වය ගැන පොඩ්ඩක් කියලා, එක සැරයක් මාව බලන්න එන්න කියන්න. ඒකෙන් මගේ හිතට සැනසීමක් ලැබෙයි. ඒක ගම්මු කියන කතාවලට උත්තර දුන්නා වගේත් තියෙයි. දැන්ම ම ගමේ අය කටකතා පතුරුවන්න පටන් අරන්..."

රුධිර ගංගාවක්. මෙය කෙදින නතර වේවි ද..? කොපමණ තරුණයන් සිරගත ව සිටිනවා ද? තරුණියන් කීදෙනෙකුගේ සිහින මාළිගා බිඳ වැටී තිබේ ද? මට නොයෙක් දේ කල්පනා විය.

මෙම ශෝකය ද දරා මම කොළඹ බලා පිටත් වුණෙමි. නැවතත් නිදි නොමැති විය.

කොළඹ සිට තලවාකැලය කිලෝමීටර් 200 ක දුරින් පිහිටා තිබේ. එහි ගොස් ඔහුව සොයාගෙන කතා කර පැමිණීමට දිනයක් ප්‍රමාණවත් නොවේ. අවම වශයෙන් දින දෙකක් හෝ ගත වනු ඇත. එය ද සහතිකයක් නොමැති ගමනකි.

අවස්ථාවක් ලැබෙන සති අන්තය වෙනුවෙන් බලා සිටියෙමි. සෙනසුරාදා අලුයම පිටත් වූවහොත් ඉරිදා දින යළි කොළඹ බලා පැමිණිය හැකිය යන බලාපොරොත්තුවෙන් සිටියෙමි. එහි සිටින මගේ සාහිත්‍ය මිත්‍රයන්, වතු වෘත්තිය සමිති සහෝදරයන් හමුවිය හැක. හරිත පැහැය හේතුවෙන් නගරය දින දෙකකට හෝ අමතක කළ හැකි ය.

තලවාකැලය කඳුකරයේ ඇති කුඩා නගරයකි. දහවල් කාලයේ දී වුවත් ශීත සුළං හමයි. බසයෙන් බැස වෘත්තිය සමිති මිතුරෙකු වන චන්ද්‍රසේකරන්ගේ කාර්යාලයට ගියෙමි. ඔහු ප්‍රථමයෙන් ප්‍රණීත තේ කෝප්පයක් හෝටලයකින් ගෙනැවිත් දුන්නේ ය. එය උසස් තේ වගා කරන ප්‍රදේශයකි. අනතුරුව කෑමට නිවසට කැටුව ගියේ ය.

ඔහු මහේන්ද්‍රන් ව දැන සිටියේ ය.

"මට එකසැරයක් මහේන්ද්‍රන්ව හමුවෙලා කතා කරන්න ඕනේ.. එයා අපේ ගමේ කෙනෙක්.."

ඊට වඩා කිසිවක් මම මිත්‍රයා සමඟ නොකියා සිටීමට වග බලාගත්තෙමි. පෙම් පළහිලව්ව සඳහා පැමිණි බව පැවසුවොතින් ඔහු විහිළු කරනු ඇත.

මහේන්ද්‍රන් සිටින ස්ථානයට මා රැගෙන යන බවට චන්ද්‍රන් පොරොන්දු වූයේ ය.

සන්ධ්‍යා කාලයේ උස් පහත් වංගු සහිත මාර්ගයේ දේශපාලනය, සාහිත්‍ය සම්බන්ධයෙන් කතා කරමින් අපි නිදහසේ ඇවිද ගියෙමු. අනතුරුව තෘණ බිමක වාඩි වී ඈඳිරිය වැටෙන තුරු කතා කරමින් සිටියෙමු.

පරිසරය අඳුරු විය. මාර්ගයේ සිට පහළට යන ගුරු පාරකින් ඔහු මා කැටුව ගියේ ය. පාදය ඉතා ප්‍රවේශමින් තබා ඇවිද ගියෙමි. මිත්‍රයාගේ වේගයට අනුව මට ඇවිදීමට නොහැකි විය.

එක් නිවසක් අසලට පැමිණ චන්ද්‍රන් දොරට තට්ටු කළේ ය. එය කුඩා නිවසකි. ගේ තුළ ආලෝකයක් පෙනුණි.

"එන්න සහෝදරයා, මොකද මේ පැත්තේ.? පුදුමයි.."

විශ්මයෙන් යුතුව වතු කම්කරු තරුණයෙක් අපව පිළිගත්තේ ය. චන්ද්‍රන් මාව ඔහුට හඳුන්වා දී කාරණය පැහැදිලි කළේ ය.

"ඔයා කියන්න විතරයි ඕනේ, මම වැඩේ කරන්නම්.. එයා මෙහෙ හිටපු දෙන්.."

"යළුවාව හමුවෙලා කතා කළා ම, අපේ ගෙදරට එක්කගෙන එන්න.."

"හරි සහෝදරයා.."

චන්ද්‍රන් පිටත් ව ගියේ ය. එම තරුණයා පිටතට ගොස් මහේන්ද්‍රන් ව කැටුව එන ලෙස පවසා විස්තර විමසා නිවසින් පිටත් ව ගියේ ය.

මම නිවසේ තිබූ පොත් කිහිපයක් ගෙන පෙරළා බැලුවෙමි. පැමිණි කාර්යය ඉතා ඉක්මනින් අවසන් වීම ගැන සතුටු වුණෙමි.

පැය භාගයකට පසුව...

"අයියා.. දැකීමත් සතුටක්.."

කොටු කොටු සරමක් සහ කමිසයක් ඇඳගෙන සිටින මහේන්ද්‍රන් නිවස තුළ පැමිණියේ ය. ඔහු මදක් කෙට්ටු වී ඇති සෙයකි. මුහුණෙහි කිසිදු චකිතයක් නොවීය.

"මම ඔයාට ගොඩාක් ස්තුතිවන්ත වෙන්න ඕනේ. ඔයා මාව නිදහස් කරගන්න කටයුතු කරනවා කියලා මුලින් දැනගත්තා. වැදගත් කෙනෙක් කියපු නිසයි අර තිරිසනා මාව නිදහස් කළේ. ඒ.එස්.පී ඒකනායක ගැනත් එහෙ හිටිය කෙනෙක් මට කිව්වා.."

සිනහා වී කතා කළ ඔහුගේ මුහුණ දැඩි විය.

"කොළඹ දී මාව හමුවෙන්න එන්න තිබුණා නේ.."

"එහෙම කරන්නත් හිතුවා. ඊට පස්සේ මගෙත් එක්ක නිදහස් වුණ මෙහෙ සහෝදරයෙක් එක්ක ආවා. මට සමාවෙන්න.."

දුටු තැන සමාව ගැනීම සම්බන්ධයෙන් මටසිතෙහි වේදනාවක් ඇති විය.

මහේන්ද්‍රන් සමඟ ස්වල්ප වේලාවක් තනිව කතා කළ යුතු යැයි අනෙක් සහෝදරයාට පැවසුවෙමි. ඔහු විදුලි බුබුළු දල්වා නිදන කාමරය පෙන්වා දොර වසාගත්තේ ය.

මහේන්ද්‍රන් ව හමුවී මෙතරම් ඉක්මනින් කතා කිරීමට හැකි වනු ඇතැයි මම බලාපොරොත්තු නො වුණෙමි. කෙසේ හෝ පුෂ්පම්ගේ කඳුළු පිස දැමිය හැකිය යන බලාපොරොත්තුව මා තුළ ඇති විය.

දොර වැසුණු පසුව නොදැනුවත්ව ම මගේ කට හඬ උස් විය.

"උඹ නිදහස් වුණා ම මාව බලන්න ආපු නැති එක හරි කමක් නැහැ. ඇයි යාපනයට ගියේ නැත්තේ.?"

"මට යන්න කැමත්තක් තිබුණේ නැහැ.."

"උඹ මොනවාද කියන්නේ, අර කෙල්ල පුෂ්පම් උඹව අත්අඩංගුවට ගත්ත දවසේ ඉඳන් කොච්චර දුක් වින්දා ද..? අඬ අඬා හිටියා. උදව් කරන්න කියලා මගේ ළඟට ඇවිත් ඇඬුවා.. ඒ ලේ කඳුළු වෙනුවෙන් තමා මම උඹව එළියට ගන්න උත්සහ කළේ..."

නොදැනුවත් ම මගේ මුවෙන් වදන් පිට විය.

"ඒකට මම මොනවාද කරන්නේ ඕනේ..?" බැගපත් හඬකි.

"උඹට එක සැරයක් ගමට ගිහින් හිත සනසලා එන්න තිබුණා නේ.. ඒකී ආයෙත් අඩාගත් ගමන් ඉන්නවා. ගමේ අයට මුහුණ දෙන්න බැරි ව ඉන්නවා.."

"පුෂ්පම්ගේ මුහුණ දකින්නවත් මම කැමැති නැහැ. ඒ නිසයි මම එහෙට ගියේ නැත්තේ.." උදාසීන වූ හඬකින් ඔහු පැවසුවේ ය.

මහේන්ද්‍රන් දමා ගැසූ බෝම්බයෙන් මා පුදුමයට පත් වුණා පමණක් නොව මගේ කේන්තිය ද තවත් වැඩි විය.

"මොනවද මේ කියන්නේ? ඒකී කරපු වරද මොකක්ද..? උඹව අතහැරලා වෙනත් මනමාලයෙක් බලනවා කියලා කවුරු හරි බොරුවක් කිව්වා ද..? ඒක විශ්වාස කරනවා ද..?"

"මම එහෙම සැක කරන්නේ නැහැ. ඒකී මාව අමතක කරලා වෙනත් කෙනෙක් විවාහ කරගන්නකම් මම එන්නේ නැහැ.."

"මොන හිතකින් ද උඹ මෙහෙම කතා කරන්නේ..? ආදර කතා කියලා කෙල්ලන්ව රවට්ටන එකද විමුක්තිය වෙනුවෙන් සටන් කරනවා කියන්නේ..?"

ඔහුගේ පිළිතුරුවලින් මගේ කේන්තිය තවත් වැඩි වූවා මිස නිවී ගියේ නැත.

"ඇයි මේකට විමුක්ති සටන් ඇදලා ගන්නේ, මේක මගේ පෞද්ගලික දෙයක්..."

"එහෙම නම් උඹ බියගුල්ලෙක්, රැවටිලිකාරයෙක්, ද්‍රෝහියෙක්..."

"කොහොම බැන්නත් මම දුක්වෙන්නේ නැහැ.."

"උඹ නපුංසකයෙක්.. පිරිමියෙක් නෙවෙයි.."

"හරියට කිව්වා අයියේ, මම පිරිමියෙක් නෙවෙයි.. ඒක පිළිගන්නවා.. මේ බලන්න අර තිරිසනා කරපු දේ..."

ඉන් පසුව ඔහු කතා කළේ නැත. ඇඳ සිටි සරම ලිහා බිමට දැම්මේ ය.

**සෙ. ගනේසලිංගන්**



1928 වසරේ උපත ලැබූ සෙ. ගනේෂලිංගන්, 1950 දී, තිනකරන් පුවත්පතට මන්නිප්පු නමින් කෙටි කතාවක් සම්පාදනය කරමින් සාහිත්‍ය ලොවට පිවිසියේ ය. ඔහු විසින් රචිත සායම් කෙටි කතාව රුසියානු භාෂාවට ද පරිවර්තනය වී ඇති අතර මොහුගේ බොහෝ කෙටි කතා සිංහල, මලයාලම්, ඉංග්‍රීසි යන භාෂාවලට පරිවර්තනය වී තිබීමත් විශේෂත්වයකි.

ඔහුගේ පෝර්කෝලම්, මණ්ණුම් මක්කලුම් නමැති නවකතා ඉන්දියාවේ දී වාරණයට පවා ලක් විය.

ඔහු විසින් 1971 වසරේ දී කුමරන් නමින් මාසික සඟරාවක් ආරම්භ කළ අතර එය ලාංකීක දෙමළ සඟරා අතර දැඩි කතාබහට ලක් විය. ඔහු කුමරන් ප්‍රකාශන ආයතනය හරහා දෙමළ සාහිත්‍යයට විශාල පොත් ප්‍රමාණයක් දායාද කළේ ය.

1966 වසරේ දී ගනේසලිංගන් විසින් රචිත නීන්ඩ පයනම් නව කතාවට රාජ්‍ය සාහිත්‍ය සම්මානය ද හිමි විය.

මරණතිල් නිළලිල් නමැති කෙටි කතා සංග්‍රහයට තමිල්නාඩු රාජ්‍ය සම්මානය හිමි විය.

දෙමළ සාහිත්‍ය වෙනුවෙන් අතිමහත් සේවයක් ඉටු කළ සෙ. ගනේෂලිංගන් 2021 වසරේ දෙසැම්බර් 04 වන දින 93 හැවිරිදි වියේ දී අභාවප්‍රාප්ත වූයේය.

# තිලීපන්: මරණය තෝරාගත් මිනිසෙක් පිළිබඳ සටහනක්



ඡායාරූපය උපුටා ගැනීම : 47 Roots Facebook Page

**සටහන : රියෝ**

වසර 40 කට වැඩි කාලයක් තිස්සේ සුළුතර ප්‍රජාවන් සහ සිවිල් කණ්ඩායම් ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක වූ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පිළිබඳව දකුණේ සමාජය අවසානයේ මර නින්දෙන් අවදි වන්නට තීරණය කර ඇත. ශිෂ්‍ය ක්‍රියාකාරීන් තිදෙනෙක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිරගත කිරීම සමඟ දකුණේ සිංහල සමාජය තුළ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) පිළිබඳව කතිකාවක් නිර්මාණය වී ඇත. එහෙත් මෙකී පනතෙන් වැඩියෙන්ම පීඩනයට පත් වූ දෙමළ ජනයා මේ පනත පළමුව බලාත්මක කළ සමයේ සිට ඊට සිය විරෝධය දක්වමින් සිටිති. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීමේ විරෝධතා 2022 දී දකුණේ පැතිර යද්දී, මීට වසර ගණනාවකට පෙර ත්‍රස්තවාදය වැළක්වීමේ පනතට විරෝධය දක්වමින් මියගිය ලංකාවේ එකම පුද්ගලයා ගැන අත්‍යවශ්‍යයෙන් සඳහන් කළ යුතු ය. ඔහු රාසයියා පාර්තීපන් හෙවත් තිලීපන් වේ.

1987 සැප්තැම්බර් මස නල්ලූර් පූජා භූමියේ දී "ත්‍රස්තවාදය වැළක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටින සියලුම දේශපාලන සිරකරුවන් නිදහස් කළ යුතු යැ"යි යාපනයේ දෙමළ තරුණයෙක් හඬ නගා දශක කිහිපයකට පසුව, එකී පනත ශක්තිමත් කරමින් ආරක්ෂා කළ දකුණේ සිංහල ජනතාවට ද "ත්‍රස්තවාදය වැළක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටින ශිෂ්‍ය ක්‍රියාකාරීන් නිදහස් කළ යුතු යැ' යි හඬ නගන්නට සිදුව ඇත. සිංහල සමාජය තිලීපන් ගැන සමාජ මාධ්‍ය ප්‍රබන්ධ කතාවලින් මත් වී ඇත. එහෙත් දෙමළ ජනයාට තිලීපන් යනු තමන්ගේ දෙමළකම විසින් කැඳවන ලද නියත රාජ්‍ය පීඩනයට විරුද්ධව සාමකාමී ලෙස අරගල කරමින් ජීවිතය කැප කළ මිනිසෙකි. මේ සටහන ලියවෙන්නේ, 'ප්‍රචණ්ඩත්වය', 'නිර්ප්‍රචණ්ඩත්වය', 'අරගල' නිර්වචනය කරමින් සිටින සිංහල සමාජයට තිලීපන්ගේ අරගලය ගැන ලියා තැබිය යුතු හෙයිනි.

## තිලීපන් පරපුර බිහිවීම

තිලීපන් වැනි තරුණ සටන්කාමීන් ශ්‍රී ලංකාව තුළ ඉබේ පහළ වූ පිරිසක් නොවේ. ඔවුන් බිහිවීම පිටුපස විශාල රාජ්‍ය මර්දනයක් පවතින නමුත් තීලිපන්ලා බිහිවීම හුදු 'ත්‍රස්තවාදයක්' ලෙස අර්ථ නිරූපණය කිරීමේ පහසු මග අපි තෝරාගෙන ඇත්තෙමු. තීලිපන්ලාගේ පරම්පරාව පිටුපස ඇත්තේ ඓතිහාසිකව ශ්‍රී ලංකා රාජ්‍ය දෙමළ ජනතාවගේ

අයිතීන් පාගා දමමින් ප්‍රචණ්ඩත්වය මුදා හැරීමයි. එහෙත් අපේ කැමැත්ත වී ඇත්තේ එකී රාජ්‍ය පිළිවෙත අපට සම්මුඛ වනවිට දෙමළ ජනයා එකී රාජ්‍ය පීඩනයට ප්‍රතිචාර දැක්වූ ආකාරයේ සදාචාරාත්මක බව ගැන වඩවීම ය.

**සැබැවින්ම තීලිපන්ලාගේ පරම්පරාව බිහිවුණේ කෙසේද ?**

තීලිපන්ලාගේ පරම්පරාව බිහිවුයේ යටත් විජිත ධනේශ්වරයේ නායකත්වයෙන් ස්ථාපිත කොටගත් සිංහල-බෞද්ධ වර්ග කේන්ද්‍රීය රාජ්‍ය විසින් දීර්ඝ කාලීනව අනුගමනය කළ දෙමළ විරෝධී ප්‍රතිපත්තිය හේතුවෙනි. අයිතිවාසිකම් උල්ලංඝනය වීමට එරෙහිව සමාන අයිතීන් උදෙසා හඬ නැගූ දෙමළ වැසියන්ට රාජ්‍ය ප්‍රතිචාර දැක්වූයේ ප්‍රචණ්ඩත්වයෙනි. එහෙත් සාම්ප්‍රදායික දෙමළ නායකයන් දිගින් දිගටම අනුමනය කරන ලද්දේ ප්‍රජාතන්ත්‍රවාදී සහ අවිහිංසාවාදි ප්‍රතිපත්ති මත පදනම් වූ ක්‍රියාමාර්ගයන් ය. එහෙත් ඒවාට නෑසූ කන්ව සිටි රාජ්‍ය ප්‍රතිචාර වශයෙන් ලබා දුන්නේ එකම එක පිළිතුරකි; ඒ දිනෙන් දින තීව්‍ර කළ ප්‍රචණ්ඩත්වය යි. තීලිපන්ලාගේ පරම්පරාව බිහිව හැදී වැඩුණේ සිය සාධාරණ දේශපාලන ඉල්ලීම් රාජ්‍ය මර්දනයෙන් පාගා දැමීම දෛනික ජීවිතය ලෙස අත්දකිමිනි. සමාන අයිතීන් සඳහා වූ සාම්ප්‍රදායික දෙමළ නායකයන්ගේ ක්‍රියාමාර්ග තව දුරටත් වලංගු නොවන බවටත්, ශ්‍රී ලංකා රජය කිසි දිනෙක එම ඉල්ලීම්වලට කන් දීමට සූදානම් නැති බවටත් රාජ්‍යය ප්‍රචණ්ඩත්වය හරහා තව තවත් ඔවුන්ට ප්‍රත්‍යක්ෂ කෙරුණි.

යුක්තිය පිළිබඳව දෙමළ වැසියන් තුළ තිබූ බලාපොරොත්තු සියල්ල අහිමි වීමේ කටුක යථාර්ථයට මුහුණ දෙමින් හැදී වැඩුණු තීලිපන්ලාගේ පරම්පරාව තම අයිතිවාසිකම් වෙනුවෙන් සටන් වැදීම හැර වෙනත් විකල්පයක් රාජ්‍ය විසින් තමන්ට ඉතිරි කර නොමැති බව තේරුම් ගැනීමේ තර්කය තේරුම් ගැනීමට අපහසු සංකීර්ණ කරුණක් නොවේ. ඒ අනුව, දශක ගණනාවක් තම අයිතිවාසිකම් උල්ලංඝනය කරමින්, තම ජනයාගේ සාමකාමී ඉල්ලීම්වලට ප්‍රචණ්ඩත්වයෙන් පිළිතුරු සපයන රාජ්‍යයට විරුද්ධව ආයුධ අතට ගෙන වෙනම රාජ්‍යයක් බිහිකර ගැනීමට තිලීපන්ලාගේ පරපුර යොමුවීම තේරුම් ගැනීමට ද විශේෂ ප්‍රඥාවක් උවමනා නොවේ.

1979 ජූලි 14 ජේ.ආර්.ජයවර්ධන විසින් යුධ හමුදා මාණ්ඩලික ප්‍රධානී බ්‍රිගේඩියර් තිස්ස වීරතුංගගේ මෙහෙයුම් නායකත්වයෙන් යුතු හමුදා බලඇණිවලට විශේෂ නියෝගයක් නිකුත් කරමින් කියා සිටියේ රජයේ සියලුම සම්පත් උපයෝගි කරගනිමින් දිවයිනේ, විශේෂයෙන් යාපනය දිස්ත්‍රික්කයේ, ත්‍රස්තවාදය රටේ නීතියට අනුව තුරන් කරන ලෙස ය. 1978 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත තුළින් ඊට අවශ්‍ය නීතිමය සහන සකසා දෙනු ලැබීය. එතැන් පටන් උතුරේ දෙමළ තරුණයන් චෝදනා රහිතව රිසි සේ අත් අඩංගුවට ගැනීමත්, වධහිංසාවට ලක් කරමින් ප්‍රශ්න කිරීමත් ආරම්භ විය. දහස් ගණන් දෙමළ තරුණ තරුණියෝ සිය දෙමළ බව නිසාම පීඩාවට පත්වූහ. තරුණයන් සිය ගණනක් අත් අඩංගුවට ගෙන දරුණු ලෙස වධහිංසනයට ලක් කරමින් මරා දැමුණි. තීලිපන් නියෝජනය කළ පරම්පරාවේ කෝපයත්, සටන්කාමීත්වයත් ගොඩ නැගුණේ මෙවැනි වාතාවරණයක් තුළ ය.

**උපවාසය**

යාපනයේ නල්ලූර් කන්දසාමි කෝවිල ඉදිරිපිට තීලීපන් සිය මාරන්තික උපවාසය ආරම්භ කළේ මීට වසර 35 ට පෙර 1987 සැප්තැම්බර් 15 දින ය. 1987 ජූලි 29 දා ඉන්දු - ලංකා ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව 1987 සැප්තැම්බර් 13 තීලිපන් විසින් ඉන්දීය රජය වෙත ඉල්ලිම් පහක් ඉදිරිපත් කරමින් ඉන්දීය මහා කොමසාරිස් ජේ.එන්. ඩික්සිට් වෙත විවෘත සංදේශයක් යොමු කළේය. ඉන්දීය රජය මැදිහත් වී තම ඉල්ලීම් පැය 24ක් ඇතුළත ඉටු නොකරන්නේ නම් තමන් මාරාන්තික




තිලීපන් උපවාසය අතරතුර රැස්ව සිටි ජනතාව අමතමින්




තිලීපන් උපවාසය අතර

උපවාසයක් ආරම්භ කරන බව තිලීපන් ඒ මගින් කියා තිබුණි. නමුත් ඉල්ලා සිටි පරිදි ඉන්දියාව විසින් අදාළ ඉල්ලීම් වෙත නිසි අවධානයක් යොමු නොකළ බැවින් 1987 සැප්තැම්බර් 15 දින තිලීපන් සිය මාරාන්තික උපවාසය ඇරඹීය. තිලීපන්ගේ ඉල්ලීම් අතර එක් ඉල්ලීමක් වූයේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන ඇති සියලුම දෙමළ සිරකරුවන් නිදහස් කළ යුතු ය යන්න යි.

සැබෑ ඉතිහාසය සම්මුඛ කළ නොහැකි හෙයින් රිසි ලෙස සකසා ගත් සංශෝධිත ඉතිහාස කතාවලට සියල්ලෝ ප්‍රිය කරති. සමාජ මාධ්‍ය, ඉතිහාසය විකෘති කරන්නන්ට වේදිකාවකි. තිලීපන්ගේ අරගලය පිළිබඳව ද සමාජ මාධ්‍ය හරහා විවිධ ඉතිහාස කතා නිර්මාණය කර ඇත. තිලීපන්ගේ උපවාසය ඔහුගේ ස්වාධීන තීරණයක් නිසා නොව වෙනත් බලපෑම් මත කළ බවත්, තිලීපන් උපවාස කිරීම සඳහා කුසපත් ඇදීමකින් තෝරාගත් බවත්, තිලීපන් ඒ වනවිටත් දරුණු රෝගයකින් පෙළෙමින් මිය යමින් සිටි පුද්ගලයෙක් බවත් ආදිය එකී සංශෝධිත ඉතිහාස කතා අතර කිහිපයකි. මේවා සමාජ මාධ්‍ය තුළින් නිෂ්පාදනය කළ කතාන්දර මිසක සැබවින්ම කිසිදු මූලාශ්‍රයක් නොමැත. මෙකී සංශෝධිත ඉතිහාස කතා, එකී අරගලය කුමන්ත්‍රණයක් වැනි යමක් මිස අධිෂ්ඨානශීලී විප්ලවකාරී අරගලයක් ලෙස දැකීමට අපට ඇති අකැමැත්ත පෝෂණය කරයි.

තිලීපන් සිය උපවාස ආරම්භ කරන්නේ 1987 සැප්තැම්බර් 15 දිනයි. තිලීපන් උපවාස කාල සීමාව තුළ ආහාරපාන මෙන්ම වෛද්‍ය පරීක්ෂණ පවා ප්‍රතික්ෂේප කළ අතර, විටින් විට එම ප්‍රතික්ෂේප කිරීම් අනෙක් අයට තදින් මතක් කර දුන්නේය. උපවාසයේ දෙවෙනි සහ තුන්වෙනි දිනවල දී අවට රැස් වූ ජනයා අමතමින් තිලීපන් පැවසුවේ දිවි අහිමි වුවත් තමන් උපවාසය නොනවත්වන බව ත්, තමන්ගේ ජීවිත පරිත්‍යාගය ගැන කණගාටුවක් නොමැති බවත් ය. තුන්වෙනි දවසේ උපවාසය නවත්වන ලෙස කළ ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වමින් උපවාසයේ මූලික කොන්දේසි කඩ කරමින් වතුර පානය කරන ලෙස ඉල්ලීම විහිළුවක් නොවේදැයි ප්‍රශ්න කළ බව සඳහන් වේ. එසේම උපවාස කිරීමේ සාක්ෂාත් කරගැනීමට නම් සැබෑ ලෙස කැපවිය යුතු බවත්, ආහාරපාන ගන්නේ නම් එය උපවාසයක් නොවන බවත් ඔහු පැවසූ බව දැක්වේ.

උපාවාසයේ තුන්වන දිනයේ කන්කසන්තුරේ කරුණා සතාසිවම් තිලීපන් අවම වශයෙන් වතුර ස්වල්පයක් හෝ පානය කළ යුතුය යන්න එහි සිටින ලක්ෂ සංඛ්‍යාවක් වූ ජනතාවගේ ඉල්ලීමක් බව ප්‍රකාශ කර ඇත. ඊට පිළිතුරු ලෙස තිලීපන්, එම වේදිකාව මත කතා කළ පුද්ගලයෙකු ඔහුට ආහාරපාන ගන්නා ලෙස පැවසීම ලැජ්ජාවට කාරණයක් බවත් අරමුණ දිනා ගන්නා තෙක් තමන් ආපසු නොහැරෙන බවත් පවසා ඇත. තවද ඔහු ජනතාවගෙන් ඉල්ලා ඇත්තේ තමාට ගෞරව කරන්නේ නම්, ආදරය කරන්නේ නම් ආහාරපාන ගැනීමට තමන්ට බල නොකරන ලෙස යි. තිලීපන්ගෙ උපාවාසයේ හතරවෙනි දිනයේ දී ෆාදර් සිංගරායර් (Singaraayar) (1983 වැලිකඩ සිරගෙදර සිරකරුවන් 52 ඝාතනය කරන අවස්ථාවේ ෆාදර් සිංගරායර් ද සිරගතව සිට ඇත) තිලීපන් මුණගැසී උපවාසය දිගටම කරගෙන යන නමුත් වතුර බිඳක් බොන ලෙස අයැද සිටිය ද තිලීපන් එම ඉල්ලීම් ප්‍රතික්ෂේප කළේය.

1987 සැප්තැම්බර් 26 දින තිලීපන් දින 12ක් පුරා වතුර බිඳක් හෝ පානය නොකරමින් කළ මාරාන්තික උපවාසය ඔහුගේ මරණය සමඟ නිමාවට පත්විය. සැප්තැම්බර් 26 උදෑසන ඔහුගේ සමුගැනීම තහවුරු කළ වෛද්‍ය ශිවකුමාර් හඬා වැළපෙමින් තිලීපන්ගේ දෙපා මුල වැඳ වැටුණු බව වාර්තා වේ. ඒ වන විට යාපනයේ නල්ලූර් කොවිල් පරිශ්‍රය පුරා රැස්ව සිටි දහස් ගණනක් වූ දෙමළ ජනයා හඬා වැළපුණහ. මිය යන තෙක්ම ඔහුගේ ඉල්ලීම වූයේ තමාට වතුර බිඳක් හෝ කිසිම වෛද්‍ය ප්‍රතිකාරයක් ලබා නොදෙන ලෙස යි. තිලීපන්ගේ දේහයට අවසන් ගෞරව දැක්වීමට දහස් සංඛ්‍යාත දෙමළ ජනයා රැස් වූහ. තිලීපන්ගේ දේහය සැප්තැම්බර් 28 දින ඔහුගේ අවසන් කැමැත්ත අනුව යාපනය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය අංශයට භාර දෙන ලදී.

තිලීපන්ගේ මරණය දෙමළ සමාජයට දැඩි බලපෑම් ඇති කළ බව නොරහසකි. තිලීපන්ගේ අවිහිංසාවාදී අරගලය සහ මරණය විසින් රාජ්‍යය දෙමළ ජනයාගේ සාධාරණ දේශපාලන ඉල්ලීම්වලට දෙන ප්‍රතිචාරය නැවත වරක් තහවුරු කරන ලදී. එපමණක් නොව තිලීපන්ගේ මරණය අනුස්මරණය කිරීම ශ්‍රී ලංකා රාජ්‍යයට අනුව ද්‍රෝහී ක්‍රියාවක් වන අතර, ත්‍රස්තවාදයට අනුබල දීමක් ලෙස සැළකේ. 2010 වසරේදී නල්ලූර් කන්දස්වාමි කෝවිල අසළ නිර්මාණය කර තිබූ තිලීපන් ගේ ස්මාරකය ශ්‍රී ලංකා හමුදාව විසින් කඩා දමන ලදී. රජය විසින් වරින් වර විවිධ නීති මඟින් තිලීපන් ස්මරණය කිරීම වාරණය කර ඇත. 2020 වසරේ පාර්ලිමේන්තුවේ වාරණ නියෝගයක් පනවමින් තිලීපන් සැමරුම රජය විසින් තහනම් කළේය. එම වාරණය හෙළා දකිමින් සැප්තැම්බර් 28-29 උතුරු නැගෙනහිර ප්‍රදේශ පුරා දැවැන්ත හර්තාලයක් ක්‍රියාත්මක විය. පොලිසිය මැදිහත්ව වසා දැමුණු කඩවල් බලහත්කාරයෙන් විවෘත කිරීමට පවා උත්සහ කළේය. 2021 වසරේදී කොවිඩ්

වසංගතය පාලනයට යොදා ගන්නා සෞඛ්‍ය රෙගුලාසි හා අපරාධ නීතිය යොදා ගනිමින් තිලීපන් සැමරීම වාරණය කිරීමට රජය උත්සාහ කළේය. ඒ අනුව 2021 සැප්තැම්බර් 23 වැනිදා යාපනය පොලීසිය විසින් තිලීපන් ස්මරණ කළ දෙමළ ජාතික ජනතා පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී සෙල්වරාසා ගජේන්ද්‍රන්, යාපනය මහ නගර සභාවේ මන්ත්‍රී එස්. රජිව්කාන්ත් සහ මන්ත්‍රීවරයාගේ සහායකයකු වන තංගරාජා රාජ ශ්‍රී ස්කන්ධන් අධිකරණ වරෙන්තුවක් හෝ ඉදිරිපත් නොකර අත්අඩංගුවට ගන්නා ලදී.

2022 වසරේ උතුරේ තීලිපන් සැමරීම සිදු කෙරුණේ එදා තීලිපන් විසින් ජීවිත පරිත්‍යාගයෙන් විරුද්ධව වූ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දකුණේ සමාජය මර්දනය අත්දකිමින් තිබෙන මොහොතක ය. රාජ්‍ය විසින් තීලිපන්ලාගේ පරම්පරාවට මර්දනය කළ අන්දම වඩාත් සවිඥානිකව කියවාගැනීමට ඇති හොඳම අවස්ථාව තීලිපන් මියගොස් 35 වසරකට පසුව එළැඹ ඇති මේ අවස්ථාව විය හැක.

**ඉතිහාසයේ විගඩම**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ප්‍රතිසංශෝධනය කිරීමේ පාර්ලිමේන්තු විවාදයේ දී, ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් මෙසේ පැවසුවේය,

"එදා මට මතකයි උතුරේ තීලිපන් තරුණයා..විශ්වවිද්‍යාල ශිෂ්‍යයා උපවාස කරලා…මාරාන්තික උපවාස කරලා කිව්වා, මේ පනත උතුරේ අපට විතරක් නෙවෙයි…දකුණේ උඹලාටත් මේ පනතේ මර්දනය ළඟා වෙනවා. එදාට තමයි ඔයාලාට තේරෙන්නේ කියලා ඒ ජීවිත පරිත්‍යාගයෙන් ඒ තීලිපන් එදා කිව්වේ මේ මර්දන පනත දෙමළ ජනතාවටත්, සිංහල ජනතාවටත්, මුස්ලිම් ජනතාවටත් එරෙහිව පාවිච්චි කරනවා කියන එක කල්තියා දැකපු නිසායි…."

මෙම ප්‍රකාශය තීලිපන් සහ කුට්ටුමනී විසින් කළ ප්‍රකාශ එකතු කරමින් විජිත හේරත් විසින් නිර්මාණය කළ ප්‍රකාශයක් බව කිව යුතුය. කලක රාජ්‍ය මර්දනයේ ගොදුරක් වූ ජනතා විමුක්ති පෙරමුණ පීඩක රාජ්‍යයේ කොටස්කරුවන් වීමට තීන්දු කර දශක දෙකක් ඉක්ම යන තැන රාජ්‍ය මර්දනයේ තරම ඔවුන්ට සිහිපත් වී තිබේ. ඉතිහාසය නැවත වතාවක් සිදුවන්නේ පළමුව ඛේදවාචකයක්ද දෙවැනුව විගඩමක් ද ලෙසින් යැයි කාල් මාක්ස් ලූයි බොනපාට්ගේ බෘමයර් 18 වැනිදා ලිපියේ තැනක ලියයි. අපේ ඉතිහාසයේ ඇති ඛේදවාචකය නම් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හරහා මුලින්ම දෙමළ වැසියන්ද, පසුව 88-89 කාල සීමාවේ ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු දකුණේ සිංහල ප්‍රජාවද, මෑතකාලීනව මුස්ලිම් ප්‍රජාවද රාජ්‍ය විසින් අමානුෂික ලෙස මර්දනය



2010 වසරේදී ශ්‍රී ලංකා හමුදාව විසින් කඩා දමන ලද නල්ලූර් කන්දස්වාමි කෝවිල අසළ නිර්මාණය කර තිබූ තීලිපන් ස්මාරකය

කිරීම පිළිබඳව වූ කතාවයි. ඉතිහාසයේ විගඩම වන්නේ, තිලීපන්ලා මර්දනයට ලක් වූ එම පනත යටතේම පසුව මර්දනයට සහ සංහාරයට ලක්වුණ ජනතා විමුක්ති පෙරමුණ පසුකාලීනව රාජ්‍ය මර්දනයේ කොටස්කරුවන් බවට පත් වී තමන්ගේ පක්ෂය සහ පක්ෂ සාමාජිකයන් මර්දනය කිරීමට යොදාගත් සියලුම මර්දන නීති ශක්තිමත් කිරීමට පසුකාලීනව දර දිය ඇද, වර්තමානයේ දැන් නැවත වතාවක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට විරුද්ධව හදිසියේ අවදි වී ඒ පිළිබඳව ප්‍රකාශ නිකුත් කිරීමයි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ අමානුෂික බවෙන් දැඩි ලෙස පීඩා විඳි තිලීපන්ලාගේ පරපුර එකී පනතටත්, එම පනත ගෙන ආ රාජ්‍ය ව්‍යුහයටත් අභියෝග කළේය. නමුත් එකී පනත යටතේම මර්දනයට සහ සංහාරයට ලක්වුණ ජනතා විමුක්ති පෙරමුණ පසුකාලීනව රාජ්‍ය මර්දනයේ කොටස්කරුවෝ වූහ.

තිස් පස් වසරක් ඇවෑමෙන් වර්තමානයේ දකුණේ සමාජය විසින් හඬ නගන්නේ එකී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මඟින් අත් අඩංගුවට ගන්නා ලද සිංහල ශිෂ්‍ය නායකයන් නිදහස් කරන ලෙස ය. ගාලු මුවදොර කේන්ද්‍ර කරගෙන දියත් වූ විරෝධතාවයේ ක්‍රියාකරී වූ ශිෂ්‍ය නායකයන් තිදෙනෙකු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගැනීමට පෙර සිටම දෙමළ සහ මුස්ලිම් ජනයා මර්දනය කිරීමට මෙම පනත යොදා ගනනිමින් තිබුණි. එදා රාජ්‍ය විසින් තිලීපන්ලාගේ පරම්පරාව මෙන්ම, ඉන් පසු පරම්පරාවන්ද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මර්දනය කරන විට දකුණේ බහුතරයක් පළමුව නිහඬවෙමින් ද, දෙවනුව එම පනතෙන් ත්‍රස්තවාදීන් 'පමණක්' මර්දනය කරන බව දක්වමින් එය අහෝසි කිරීමට රජයට බලකරන්නන් ත්‍රස්තවාදීන් ලෙස චෝදනා කරමින්ද එම මර්දන නීති ආරක්ෂා කළහ. එදා තීලිපන්ලාගේ පරම්පරාව පැවසුවේ, අද ත්‍රස්තවාදය නාමයෙන් දියත්වන රාජ්‍ය මර්දනය ඊළඟට ඔබට ද දියත්වන තෙක් ඔබ එය තේරුම් නොගන්නා බව ය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීමට වර්තමානයේ විප්ලවීය සටන් පාඨ මොරදෙන බහුතරයක් තීලිපන්ලාගේ පරම්පරාව එකී පනත තුළින්ම මර්දනයට ලක් කරන විට එකී පනත රැකගැනීම වෙනුවෙන් දිවි හිමියෙන් කටයුතු කිරීමට සපථ කළ අය වේ. එකී රාජ්‍ය මර්දනය සාධාරණීකරණය කිරීම අදද ඔවුහු සිදු කරති.

දශක ගණනාවක් සිට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි අමානුෂික මුහුණුවර පෙන්වමින් එයද අහෝසි කිරීම සඳහා හඬනැගූ සිවිල් සහ දේශපාලන ක්‍රියාකාරීන් කොටි හිතවාදීන්, දේශද්‍රෝහීන් ලෙස නම් කළ දකුණේ සමාජය අද තමන්ට අභිමුඛ වී ඇති ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට කොතරම් කලක් විරුද්ධ වනු ඇති ද ?

*තිලිපන්ගේ උපවාසයේ දින පිළිබඳ විස්තර උපුටා ගැනීම - එම්.වී.වයි.වන්ජිනාදන්, 'திலீபனுடன்12 நாட்கள்', 1988













தோழமைத் துடிப்பு

# සහෘදස්පන්දන

සාමූහික හෘද සාක්ෂියක් කරා

## ද්වි මාසික විද්‍යුත් සඟරාව ලබා ගැනීමට ඔබේ

## ඊමේල් ලිපිනය අප වෙත එවන්න

## බන්ධනාගාර ප්‍රධානියාට ලියමනක්

මහත්තයා,
මා සිර කර තැබුමට
මට එරෙහි වෙන්නට බෑ
වධ හිංසා
මට වළකන්නට බෑ
මන්ද
මම සිරකරුවෙක්.
අපි ඉල්ලන්නේ නිදහස, නමුත්
ඔබේ වදන්වල අපි 'ත්‍රස්තවාදීන්'

මොර දෙමින් කෙඳිරි ගාමින්
මගේ වේදනා
අඩු කරනු බැරි විය
මගේ තුවාලවලට
නමක් නොදන්නා දැවී යන දියරයක්
වක්කරනකොට
කිසිවකට එරෙහිව
තවදුරටත් මට
සුළැඟිල්ලවත් සෙලෙවිය නොහැකි බව
හොඳින්ම දනියි ඔබ.

එනිසයි මහත්තයා,
මේ බැගෑපත් ඉල්ලීම
මේ සිරකුටියෙහි
අත පෙවිය නොහී උසක
කවුළුවක් ඕනෑ බවට.
නොහැකි නම්, පියස්සේ
දෙ අත පෙවිය හැකි සිදුරු දෙකක්
ඇත්තමයි කියන්නේ මම.
පැන යන්න මගක් නොව

දැවෙමින් වේදනා දෙන මගේ තුවාල
සුළඟ විත් මදක් අත ගාපුදෙන්
වලාකුළු කැබැල්ලක්
හෙමි හෙමින් පාව ගියදෙන්
අතු අගක මල් පොට්ටු පූදිනා සේ
යම් විටෙක කුරුල්ලෙක්
මගේ නෙතු මානය
පසුකර ඉගිල්ලෙන විට,
මම මෙතෙක් කල් දිවි ගෙවූ ලොව
මගේ මිනිසුන්ව දකිමි මම

'පිස්සෙක්' ඔබ සිතාවි
ඒ නමුත් මහත්තයා,
හැමදේම අහිමිව
අවසඟ වුණත්
හැඟීමෙන්
අදිටන අහිමි කර නොගෙන
ඔවුනට මම යවන පුවත
ඇත්තේ මේ දේවලයි

ඌර්වසී (1984)
පරිවර්තනය - සංජුලා පීටර්ස්

